සැ. යු. :- මෙම අති විශෙෂ ගැසට් පත්‍රයෙහි දෙමළ හා ඉංග්‍රීසි භාෂා වෙන වෙනම පළවේ.


# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 1992/17 - 2016 නොවැම්බර් මස 08 වැනි අඟහරුවාදා - 2016.11.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත**

4 (2) උප වගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය (මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතේ අරමුණ සඳහා කුඩා සහ මධ්‍යම පරිමාණ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයට 2015 සංශෝධනයන් මේ සමඟ පළකර ආයතනය විසින් සම්මත කර ඇත. මෙම සංශෝධන වර්ෂ දෙදහස් දහහතේ ජනවාරි 01 දින හෝ ඊටපසු ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක කළයුතුයි. කලින් ව්‍යවහාර කිරීමට අවසර ඇත.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2016 නොවැම්බර් මස 08 වැනි දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 A,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ දීය.

# කුඩා සහ මධ්‍යම පරිමාණ අස්තිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතය (කු. ම. අ. සඳහා ශ්‍රී. ල. මු. වා. ප්‍ර.) ට 2015 සංශෝධනයන්

## පටුන


1 කුඩා සහ මධ්‍යම පරිමාණ අස්තිත්වයන්

2 සංකල්ප සහ පෘථුල මූලධර්ම

4 මූල්‍ය තත්ව ප්‍රකාශනය

5 විස්තීරණ ආදායම් ප්‍රකාශනය සහ ආදායම් ප්‍රකාශනය

6 හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ ආදායම් හා රඳවාගත් ඉපයීම් ප්‍රකාශනය

9 ඒකාබද්ධ සහ වෙන්වශයෙන්වූ මූල්‍ය ප්‍රකාශන

10 ගිණුම්කරණ ප්‍රතිපත්තීන්, ඇස්තමේන්තු සහ වැරදි

11 මූලික මූල්‍ය සාධන පත්‍රයන්

12 අනෙකුත් මූල්‍ය සාධන පත්‍රයන් නිකුත් කිරීම

14 අශ්‍රිතයන්හි ආයෝජනයන්

15 බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජනයන්

16 ආයෝජන දේපළ

17 දේපළ පිරියත හා උපකරණ

18 කීර්තිනාමය හැර අනෙකුත් අස්පෘශ්‍ය වත්කම්

19 ව්‍යාපාර සංයෝජනයන් හා කීර්තිනාමය

20 කල්බදු

21 ප්‍රතිපාදනයන් හා අසම්භාව්‍යයන්

22 වගකීම් හා හිමිකම්

26 කොටස් පදනම් ගෙවීම්

27 වත්කම් හානිකරණය

28 සේවක ප්‍රතිලාභ

29 ආදායම් බදු

30 විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

31 අති උද්ධමනය

33 සම්බන්ධිත පාර්ශවයන් හෙළිදරව් කිරීම

34 විශේෂිත කාර්යභාරයන්

35 කු. ම. ආ. සඳහා ශ්‍රී. ල. මු. වා. ප්‍ර. ට සංක්‍රාන්තිය


## උපලේඛනයන්


අ. බලාත්මක දිනය හා සංක්‍රාන්තිය

ආ. පාරිභාෂික පද මාලාව

## 1 කොටස කුඩා හා මධ්‍ය පරිමාණ අස්තිත්වයන්ට සංශෝධනයන්

1.3 ඡේදය සංශෝධනය කර ඇත. 1.7 ඡේදය එක්කර ඇත. ඉවත් කළ පාඨයන් කපාහැර ඇති අතර නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**කුඩා සහ මධ්‍යම පරිමාණ අස්තිත්වයන් විස්තර කිරීම**

1.3 අස්තිත්වයකට මහජනතාවට ගිණුම් කිරීමට වගකීමක් ඇතිවනුයේ,

(අ) ........

(ආ) එහි ප්‍රධාන ව්‍යාපාර කටයුතු වලින් එකක් ලෙස බාහිර පාර්ශ්ව සමූහයකගේ වත්කම් එය භාරයක තත්වයෙන් දරා සිටීම. බොහෝ බැංකු, ණය සමිති, රක්ෂණ සමාගම්, සුරැකුම්පත් තැරැව්කාර, වෙළෙන්දන්, අන්‍යෝන්‍ය අරමුදල් සහ අයෝජන බැංකු, ~~මේවා සඳහා සංකේතමය තත්වය වන්නේ මෙසසි.~~ මෙම දෙවැනි නිර්ණායකයට ඇතුලත් වෙයි.

1.7 මව් අස්තිත්වයන් (අවසාන මව් සමාගමක් හෝ අන්තර්මාධ්‍ය මව් සමාගමක් තිබේනම් එයද ඇතුලත්ව) තමන්ගේ වෙන් වූ මූල්‍ය ප්‍රකාශනයන් සඳහා මෙම SLFRS භාවිතා කිරීමේ හැකියාව තක්සේරු කළ යුත්තේ, සමූහයේ අනිකුත් අස්තිත්වයන් හෝ සමූහයම එකක් වශයෙන් සළකා බලන විට මහජනතාවට ගිණුම් කිරීමට තිබේද යන්න නොතකමිනි. මව් අස්තිත්තවයකට මහජනතාවට ගිණුම් කිරීමට වගකීමක් නොතිබේ නම්, එය මෙම SLFRS අනුකූලව වෙන්වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කළ හැකිය. (9 වන පරිච්ඡේදය ඒකාබද්ධ සහ වෙන්වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශනයන් බලන්න.) තමන්ගේ ජාතික ගිණුම් ප්‍රමිතිය වැනි වෙනත් පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් (GAAP) හෝ SLFRS සම්පූර්ණ අනුකූලව වෙනම වූ මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කරන්නේ වුවද, එසේ කළ හැකිය. මෙම SLFRS අනුකූලව සකස්කරන ලද ඕනෑම මූල්‍ය ප්‍රකාශනයන් අනිකුත් අවශ්‍යතාවයන්ට අනුකූලව සකස් කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්ගෙන් පැහැදිලිවම, වෙනස් ආකාරයට දැක්විය යුතුය.

## 2 කොටස සංකල්ප සහ පෘථුල මූලධර්මයන්ට සංශෝධනයන්

ශීර්ෂ පාඨයන් හා 2.14 2 අ - 2.14 ඈ ඡේදයක් එක්කර ඇත. 2.22, 2.47 හා 2.49 - 2.50 ඡේදයන් සංශෝධනය කර ඇත. ඉවත්කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**අනිසි පිරිවැය හෝ පරිශ්‍රමය**

2.14අ. මෙම SLFRS හි අවශ්‍යතාවයන් සඳහා අනිසි පිරිවැය හෝ පරිශ්‍රමය නම් ව්‍යතිරේඛයන් එක් කර ඇත. මෙම SLFRS හි අනිකුත් අවශ්‍යතාවයන් සඳහා මෙම ව්‍යතිරේඛය භාවිතා නොකළ යුතුය.

2.14ආ. අවශ්‍යතාවයක් සපුරාලීම සඳහා අවශ්‍ය තොරතුරු ලබාගැනීමට හෝ තීරණය කිරීමට අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් දැරීමට සිදුවේදැයි නිගමනය කළ යුත්තේ අස්තිත්වයේ සුවිශේෂ තත්වයන් හා එම අවශ්‍යතාවය භාවිතා කිරීමෙන් ඇතිවන පිරිවැය සහ ප්‍රතිලාභයන් පිළිබඳව, කළමනාකාරිත්වයේ විනිශ්චය අනුවය. මෙසේ විනිශ්චය කිරීමකදී එම තොරතුරු නොලැබීම හේතු කොට ගෙන මූල්‍ය ප්‍රකාශනයන් භාවිතා කිරීමට අපේක්ෂාකරන්නන්ගේ ආර්ථික තීරණයන් කෙරෙහි ඇතිවිය හැකි බලපෑම් සලකා බැලිය යුතුය. වර්ධනය වන පිරිවැය (නිදසුනක් ලෙස තක්සේරුකරුවන්ගේ ගාස්තුව) හෝ අතිරේක පරිශ්‍රමය (නිදසුනක් ලෙස සේවා නියුක්තිකයන්ගේ උත්සාහය) තොරතුරු ලැබීම හේතු කොට ගෙන කු. ම. අ. මූල්‍ය ප්‍රකාශනයන් භාවිතා කරන්නන් විසින් ලබාගත හැකි ප්‍රතිඵලයන්ට වඩා බොහෝ සෙයින් වැඩිවේනම්, මෙම අවශ්‍යතාවය සපුරාලීම සඳහා අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් දැරීමට කු. ම. අ. ට සිදුවිය හැකිය. මෙම SLFRS අනුව කු. ම. අ. විසින් අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් දැරීමට සිදුවේ දැයි තක්සේරු කිරීමේ දී, පොදු මහජන වගවීම ඇති අස්තිත්වයක් විසින් අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් දැරීමට සිදුවේදැයි තක්සේරු කිරීමට වඩා අඩු බාධකයක් වනු ඇත්තේ කු. ම. අ. පොදුවේ අයිතිවාසිකම් දරන්නන්ට වගකීමක් නොමැති හෙයිනි.

2.14ඇ. මූල්‍ය ප්‍රකාශනයන්ගේ මූලික හඳුනා ගැනීමේදී නිදසුනක් ලෙස ගණුදෙනු සිදුවන අවස්ථාවේදී අවශ්‍යතාවයක් සඳහා අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් දැරීමට සිදුවේදැයි තක්සේරු කළ යුත්තේ මූලික හඳුනාගැනීම වන අවස්ථාවේදී අවශ්‍යතාවය සඳහා දැරීමට සිදුවන පිරිවැය හා ප්‍රතිලාභයන් ගැන ඇති තොරතුරු පදනම් කර ගැනීමෙනි. මූලික හඳුනාගැනීමෙන් පසුව අනිසි පිරිවැය හෝ පරිශ්‍රමය ව්‍යතිරේඛය භාවිතා කරන්නේ නම්, නිදසුනක් ලෙස අයිතමයක පශ්චාත් කාලීන මිණුම්කරණයකදී, එම දිනයේ දී ලබාගත හැකි තොරතුරු මත පදනම් වූ අනිසි පිරිවැය හෝ පරිශ්‍රමය පිළිබඳ තක්සේරුවක් කළ යුතුය.

2.14ඈ 19.25 ඡේදයෙන් දැක්වෙන හෙළිදරව් කිරීම් අවශ්‍යතාවයන්ගෙන් ආවරණය වන 19.15 ඡේදයේ අනිසි පිරිවැය හෝ පරිශ්‍රම ව්‍යතිරේඛයට අමතරව අස්තිත්වයක් විසින් අනිසි පිරිවැය හෝ පරිශ්‍රම ව්‍යතිරේඛය භාවිතා කරන අවස්ථා වලදී අස්තිත්වය විසින් ඒ බව සහ අවශ්‍යතාවය භාවිතා කිරීමේදී අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් දැරීමට සිදුවිය හැකි හේතුන් හෙළිදරව් කළ යුතුය.

...........

**ස්කන්ධය**

2.22 ස්කන්ධය යනු හඳුනාගත් වත්කම් වලින් හඳුනාගත් වගකීම් අඩුකළ පසු ලැබෙන අවශේෂයයි. එය මූල්‍ය තත්ව ප්‍රකාශනයෙන් උප වර්ගීකරණය කළ හැකිය. උදාහරණයක් වශයෙන් සංස්ථාපිත අස්තිත්වයක මෙම උප වර්ගීකරණයක කොටස් හිමියන්ගෙන් දායක වූ අරමුදල්, රඳවාගත් ඉපයීම් සහ ~~ස්කන්ධයේ සඝුවම හඳුනාගත් ප්‍රතිලාභයන් හෝ අලාභයන් යනාදී අයිතමයන්ගේන් සමන්විත~~ ස්කන්ධයේ වෙනම සංරචකයන් වශයෙන් හඳුනාගෙන ඇති අනිකුත් විස්තීරණ ආදායම් අයිතමයන් ඇතුලත් විය හැකිය. ස්කන්ධයේ සංරචකයන් අතර මුදල් මාරුකිරීම කළ හැකිද හෝ ඒසේනම් කවර අවස්ථාවකදී ද යන්න මෙම SLFRS මඟින් නිර්දේශ නොකෙරේ.

**මූල්‍ය වත්කම් හා මූල්‍ය වගකීම්**

2.47 11 වන පරිච්ඡේදය සාධන පත්‍රයන් නිර්වචනය කර ඇති ආකාරයට **ප්‍රසිද්ධියේ අලෙවි වන** පරිවත්‍ය කළ නොහැකි ~~හා ආපසු භාරදීම කළ නොහැකි~~ සාමාන්‍ය කොටස්වල ආයෝජනයන් හැර සහ ආපසු භාරදීම කළ නොහැකි සාමාන්‍ය හෝ වරණීය කොටස්වල ආයෝජනය හැර ලාභ හෝ අලාභවල හඳුනාගනු ලබන සාධාරණ අගයේ වෙනස්කම් සහිත සාධාරණ අගයට මනිනු ලබන්නාවූ අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් නොමැතිව වෙනත් ආකාරයකින් ඒවායේ සාධාරණ අගය විශ්වසනීය ලෙස මැනිය හැකි ක්‍රමක්‍ෂය පිරිවැයට හානිකරණය අඩු කොට **මූල්‍ය වත්කම්** හා **මූල්‍ය වගකීම්** මැනීම අස්තිත්වයක් විසින් සිදුකරයි.

**මූල්‍ය නොවන වත්කම්**

2.49 මුල් අවස්ථාවේ ඓතිහාසික පිරිවැයට හඳුනාගත් බොහෝ මූල්‍ය නොවන වත්කම් පසුව වෙනත් මිනුම් කිරීමේ පදනම් අනුව මිනුම් කෙරේ. උදාහරණ වශයෙන්

(අ) අස්තිත්වයක් දේපළ පිරියත හා උපකරණ ~~ක්‍ෂය කරන ලද~~ සමුච්චිත ක්‍ෂය කිරීම් හා හානිකරණය අඩුකළ පසු අයකර ගත හැකි මුදලේ අවමය මත (පිරිවැය ආකෘතිය) හෝ ප්‍රතිලාභ අගය සහ නැවත ලබාගත හැකි අගය (ප්‍රත්‍යාගණන ආකෘතිය) යන දෙකෙන් අවමය අනුව මනිනු ඇත.

(ආ) ............

2.50 පහත සඳහන් වර්ගවල මූල්‍ය නොවන වත්කම් සාධාරණ අගයට මිණුම්කරණය කිරීමට මෙම SLFRS මඟින් ඉඩදීම හෝ අවශ්‍ය වීම කෙරේ.

(අ) ..........

(ඈ) අස්තිත්වයන් විසින් ප්‍රත්‍යාගණන ආකෘතිය අනුකූලව මිණුම්කරණය කෙරෙන දේපළ, පිරියත හා උපකරණ සඳහා (17.15 ආ ඡේදය බලන්න.)

## 4 කොටස මූල්‍ය තත්ව ප්‍රකාශනයට සංශෝධනයන්

4.2 හා 4.12 ඡේදයන් සංශෝධනය කර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කළයුතු තොරතුරු**

4.2 අවමයක් වශයෙන් පහත සඳහන් පේලි අයිතමයන් මූල්‍ය තත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කරනු ලැබේ.

(අ) .........

(ඉඅ) සමුච්චිත ක්‍ෂය කිරීම් හා හානිපූර්ණය අඩුකිරීමෙන් පසු පිරිවැය මත පෙන්නුම් කරනු ලබන **ආයෝජන වත්කම්**

(ඊ) .........

**මූල්‍ය තත්ව ප්‍රකාශනයේ හෝ සටහන් යටතේ ඉදිරිපත් කළයුතු තොරතුරු**

4.12 කොටස් ප්‍රාග්ධනයක් සහිත අස්තිත්වයක් විසින් එක්කෝ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ හෝ සටහන්හි පහත සඳහන් කරුණු හෙළිදරව් කළ යුතුය.

(අ) කොටස් ප්‍රාග්ධනයේ සෑම පන්තියකම කොටස් සඳහා

(i) .........

(iv) කාලසීමාව ආරම්භයේ කොටස් සංඛ්‍යාව සහ කාලසීමාව අවසානයේ කොටස් සංඛ්‍යාව සැසඳීමක්, මෙම සැසඳීම පූර්ව කාල සීමාවන් සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

(v) .........

## 5 කොටස විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ ආදායම් ප්‍රකාශනයට සංශෝධනයන්

| |
|---|
| 5.4 - 5.5 ඡේදයන් සංශෝධනය කර ඇත. ඉවත් කරන ලද පාඨයන් කපාහැර ඇති අතර නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත. |

**තනි ප්‍රකාශන ප්‍රවේශය**

5.4 තනි ප්‍රකාශන ප්‍රවේශය යටතේ, මෙම SLFRS හි අන් අයුරින් අවශ්‍ය කරන්නේ නම් හැර විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ කාලසීමාවේ හඳුනාගත් සියළුම ආදායම් සහ වියදම් ඇතුලත් කළ යුතුය. මෙම SLFRS පහත සඳහන් තත්වයන් සඳහා වෙනත් ගිණුම් කිරීමේ ක්‍රමයක් සපයයි.

(අ) ........

(ආ) ලාභ අලාභ ගණයට බාහිරව පහත සඳහන් ~~තුන්~~ සතර වර්ගයේ **වෙනත් විස්තීරණ ආදායම්** කොටස් මුළු විස්තීරණ ආදායමේ, ඒවා පැන නගින විට හඳුනාගැනේ.

(i) .........

(iv) ප්‍රත්‍යාගණන ආකෘතිය අනුකූලව මිණුම්කරණය කරන ලද දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණනය කිරීමේදී ඇති වූ ප්‍රත්‍යාගණන අතිරික්තයේ වෙනස්වීම් (17 කොටස දේපළ, පිරියත හා උපකරණ බලන්න.)

5.5 අස්තිත්වයක් විසින් අවම වශයෙන් කාලපරිච්ඡේදය සඳහා විස්තීරණ ආදායම් ප්‍රකාශනයක පහත වටිනාකම් දැක්වෙන තීරු අයිතම ඇතුලත් කළ යුතුය.

(අ) .........

(ඇ) පහත අයිතම් (ඉ) (එ) සහ (ඒ) සඳහා බදු වෙන්කිරීම් හැර **බදු වියදම** (29.35.~~27~~ ඡේදය බලන්න.)

(ඉ) පහත සඳහන් අයිතම් දෙක සංයුක්ත තනි වටිනාකමක්.

(i) .........

(ii) ~~මිණුම්කරණයේ හඳුනාගත් විකිණීමේ පිරිවැය අඩු කිරීමෙන් පසු ඇතිවන සාධාරණ අගයේ~~ බද්දට පසු ප්‍රතිලාභයක් හෝ අලාභයක් හෝ අසංතතික මෙහෙයුමකට අදාල වත්කම් වල හානිකරණයක් ප්‍රතිවර්තනය කිරිමේදී (27 කොටස වත්කම් හානිකරණය වීම බලන්න.) මෙය අසංතතික මෙහෙයුමක් වශයෙන් වර්ගීකරණය කිරිමට පෙර හා පසුව යන අවස්ථා ද්විත්වයේම සහ අසංතතික මෙහෙයුම් ශුද්ධ වත්කම් ඉවත් කරනු ලබන අවස්ථාවේ විය යුතුය.

(ඊ) ............

(එ) ස්වභාවය අනුව වර්ගීකරණය කළ එක් එක් විස්තීරණ ආදායම් අයිතමයන් එහි ස්වභාවය දක්වමින් (මෙහි වටිනාකම් හැර (ඒ) හැර) (අංක 5.4 ඡේදයේ (ආ) බලන්න) මෙම SLFRS ට අනුකූලව එම අයිතමයන් කාණ්ඩ ගත කළ යුතුය.

(i) ලාභයට හෝ අලාභයට අනුව පසුව ප්‍රතිවර්ගීකරණය නොකරනු ඇත. එනම් 5.4 ඡේදයේ (ආ) (i) - (ii) සහ (iv) , සහ

(ii) විශේෂිත කොන්දේසීන් සපුරාලන විට, ලාභයට හෝ අලාභයට පසුව ප්‍රතිවර්ගීකරණය කරනු ලබන, එනම් 5.4 ඡේදයේ (ආ) (iii)

(ඒ) ........

## 6 වැනි කොටස, කොටස් හිමියන්ගේ ස්කන්ධය වෙනස් වීම් දක්වන ප්‍රකාශය සහ රඳවාගත් ඉපයීම් ප්‍රකාශයට සංශෝධනයන්

6.2 - 6.3 ඡේදයන් සංශෝධනය කර ඇත. ඉවත්කරන ලද පාඨයන් කපාහැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**අරමුණ**

6.2 අස්තිත්වයක **වාර්තාකරන කාලපරිච්ඡේදය සඳහා ලාභය හෝ අලාභය** කාලසීමාව සඳහා **වෙනත් විස්තීරණ ආදායම්** ~~හඳුනාගත් ආදායම් හා වියදම් අයිතමයන්,~~ කාලසීමාව තුළ හඳුනාගත් **ගිණුම් ප්‍රතිපත්තිවල** වෙනස්කම් වැරදි නිවැරදි කිරීම් නිසා වන බලපෑම් කාලසීමාවල ~~ස්කන්ධ ආයෝජකයන්~~ අයිතිකරුවන් ලෙස ඔවුන්ගේ ධාරිතාවයෙන් අයිතිකරුවන් විසින් කරන ලද ආයෝජනවල වටිනාකම ඔවුනට බෙදාහරින ලාභාංශ සහ වෙනත් බෙදාහැරීම්, ස්කන්ධය වෙනස්වීම් ප්‍රකාශනයක ඉදිරිපත් කෙරේ.

**ස්කන්ධ වෙනස්වීම් දක්වන ප්‍රකාශයේ ඉදිරිපත් කළයුතු තොරතුරු**

6.3 ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශයේ පහත සඳහන් ~~දෑ පෙන්වමින් අස්තිත්වයේ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනයක් ඉදිරිපත් කළ යුතුය.~~ තොරතුරු ඇතුලත් විය යුතුය.

(අ) ........

(ඇ) ස්කන්ධයේ සෑම සංචරකයන් සඳහාම පහත සඳහන් දෑ වෙනස්වීමෙන් පැනනගින ප්‍රතිඵල වෙන වෙනම හෙළිදරව් කරමින් කාලපරිච්ඡේදය ආරම්භයේ සහ අවසානය අතර ධාරණ අගයේ සංසන්දනයන්

(i)

(ii) වෙනත් විස්තීර්ණ ආදායම්

(iii) කොටස් නිකුත් කිරීම භාණ්ඩාගාර කොටස් ගණුදෙනු අයිතිකරුවන්ට ඔවුන්ගේ අයිතිය මත ගෙවූ ලාභාංශ සහ වෙනත් බෙදාහැරීම් සහ පාලනය අහිමිවීම ප්‍රතිඵලයක් නොවන පරිපාලිත සමාගම්වල අයිතියේ වෙනස්වීම් වෙන් වශයෙන් පෙන්වමින් අයිතිකරුවන් විසින් කරන ලද ආයෝජන සහ ඔවුනට ගෙවන ලද ලාභාංශ සහ වෙනත් බෙදාහැරීම්

## 9 වන කොටස ඒකාබද්ධ සහ වෙන් වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශනයන්ට සංශෝධනයන්

9.1 - 9.3, 9.16, 9.18, 9.24 - 9.26, සහ 9.28 ඡේදයන් සංශෝධනය කර ඇත. 9.3 අ - 9.3 ඇ සහ 9.23 අ ඡේදයන් එකතු කර ඇත. ඉවත්කරන ලද පාඨයන් කපාහැර ඇති අතර, නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**මෙම කොටසේ විෂය පථය**

9.1 අස්තිත්වයක් **ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන** ඉදිරිපත් කිරීමේ අවස්ථාවන් සහ මෙම SLFRS අනුකූලව එම ප්‍රකාශනයන් පිළිවෙල කිරීමේ පටිපාටිය මෙම කොටසින් පැහැදිලි කෙරේ. **වෙන් වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන සහ සංයෝජිත මූල්‍ය ප්‍රකාශන**, සකස් කරන්නේ මෙම SLFRS අනුකූලව නම්, ඒ සඳහා මඟ පෙන්වීමද ඇතුලත් වේ. මව් අස්තිත්වයකට එම තත්වය අනුව, මහජනතාවට ගිණුම් කිරීමට වගකීමක් නොමැති නම්, එය විසින් සම්පූර්ණ SLFRS අනුකූලව හෝ වෙනත් පොදුවේ පිළිගත්

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් (GAAP) අනුකූලව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කරන්නේ වී නමුත් එයට මෙම අනුකූලව වෙන් වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කළ හැකිය.

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම සඳහා අවශ්‍යතාවය**

9.2 9.3 සහ 9.3 ඇ ඡේදයෙන් අවසර දී හෝ අවශ්‍ය පරිදි හැර ~~මෙම SLFRS ප්‍රකාරව~~ එහි **පරිපාලික** සමාගමක ආයෝජන ඒකබද්ධ කිරීමේ **පරිපාලිතයේ** ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ ඉදිරිපත් කරයි. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන වල පරිපාලිකයේ සියළුම පරිපාලිත ඇතුලත් විය යුතුය.

9.3 පරිපාලකයන් විසින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම අවශ්‍ය නොවන්නේ,

(අ) පහත සඳහන් කොන්දේසි දෙකම සපුරාලුවහොත් පමණි.

(~~i~~ අ) පරිපාලකය එහිම පරිපාලිතයන් වීම.

(~~ii~~ ආ) එහි අවසාන පරිපාලක සමාගම (හෝ අන්තර් මධ්‍ය මව් සමාගම) **සම්පූර්ණ SLFRS** සමඟ හෝ මෙම SLFRS අනුකූලව ඒකාබද්ධ **පොදු අරමුණු මූල්‍ය ප්‍රකාශන** ඉදිරිපත් කරන්නේ නම්, ~~හෝ~~

~~(ආ) එයට එක් වර්ෂයක් තුළ විකිණීම හෝ බැහැර කිරිමේ අභිප්‍රාය ඇතුව අත්පත් කරගත පරිපාලිතය හැර වෙනත් නොතිබීම එවැනි පරිපාලිතය සඳහා පහත පරිදි ගිණුම්ගත කළ යුතුය.~~

~~(i) කොටස් වල සාධාරණ වටිනාකම විශ්වාශනීය ලෙස මැනිය හැකි නම් ලාභය හෝ අලාභයේ හඳුනාගත් සාධාරණ වටිනාකමේ වෙනස්කම් සහිතව සාධාරණ වටිනාකමට~~

~~(ii) එසේ නැත්නම් හානිකරණය අඩුකොට පිරිවැයට (11.14 (ඇ) ඡේදය බලන්න.)~~

9.3 අ. 9.3 ආ ඡේදයට යටත්ව පරිපාලිතයන් අත්පත් කරගත් දිනයේ (එනම් අත්පත් කර ගන්නා විසින් අත්පත් කරගනු ලබන්නාගේ පාලනය ලබාගන්නා දිනය) සිට, වර්ෂයක් ඇතුළත විකිණීමට හෝ බැහැර කිරීමට ඇති පරිපාලිත සමාගමක් ඒකාබද්ධ නොකරනු ඇත. එවැනි පාලිතයන් මෙම කොටසේ අවශ්‍යතාවයන් අනුව නොව 11 වන කොටසේ 11.8 (ඇ) ඡේදයේ දැක්වෙන පරිදි ආයෝජනයන් සඳහා වන අවශ්‍යතාවයන්ට අනුකූලව ගිණුම්කරණය කළ යුතුය. මව් සමාගම විසින් ද 9.23 අ ඡේදය පරිදි හෙළිදරව් කිරීම් කළ යුතුය.

9.3 ආ. 9.3 අ ඡේදයට අනුකූලව, පරිපාලිතයන් පූර්වයෙහිදී ඒකාබද්ධ කිරිමෙන් බැහැර කර තිබේනම් අත්පත් කර ගැනීමේ දිනයේ සිට වර්ෂයක් ඇතුලත බැහැර නොකෙරේ. (එනම් මව් සමාගමට තවමත් පරිපාලිතයේ පාලනය තිබේනම්)

(අ) 9.3 ආ(ආ) කොන්දේසීන් සපුරාලන්නේ නැත්නම් මව් සමාගම විසින් පරිපාලිතය ඒකාබද්ධ කළ යුතුය. අනුෂංගිකව, අත්පත් කර ගැනීමේ දිනය පූර්ව කාලපරිච්ඡේදයක් තුළ වන්නේ නම්, අදාල පූර්ව කාලපරිච්ඡේදය, නැවත ප්‍රකාශ කළ යුතුය.

(ආ) ප්‍රමාදය සිදු වී ඇත්තේ මව් සමාගමට පාලනය කළ නොහැකි හේතූන් හෝ සිද්ධීන් නිසා නම් සහ වාර්තා කරනු ලබන දිනය වනවිට මව් සමාගම විසින් පරිපාලිතය විකිණීමට හෝ ඉවත් කිරීමට බැඳී සිටින බවට ප්‍රමාණවත් සාක්ෂි තිබේ නම් පරිපාලිතය, 9.3 අ ඡේදයට අනුකූලව ගිණුම්ගත කිරීම කරගෙන යා හැකිය.

9.3 ඇ. 9.3අ - 9.3ආ අනුකූලව ඒකාබද්ධ කිරීම අවශ්‍ය නොවන පරිපාලිතයන් හැර වෙනත් පරිපාලිතයන් මව් සමාගමට නොමැති නම් එය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් නොකළ යුතුය. කෙසේ වෙතත්, මව් සමාගම 9.23 අ ඡේදයෙන් දැක්වෙන හෙළිදරව් කිරීම් සැපයිය යුතුය.

**ඒකාකාර වාර්තාකරන දිනය**

9.16 ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාවිතා කරන පරිපාලකයේ සහ එහි පරිපාලිතවල මූල්‍ය ප්‍රකාශන එසේ කිරීම **ප්‍රයෝගික නොවන්නේ නම්** හැර එකම **වාර්තා කිරීමේ දිනයටම** පිළියෙල කළ යුතුය. මව් සමාගමේ වර්තා කිරීමේ දිනය අනුව පරිපාලිතයේ ගිණුම් සකස් කළ නොහැකි නම්, මව් සමාගම විසින් පරිපාලිතයේ අවසාන මූල්‍ය ප්‍රකාශනයේ දිනයේ සිට ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් සකස් කරන දිනය දක්වා වැදගත් ගණුදෙනු හා අවස්ථාවන් අනුව ගලපන ලද මූල්‍ය ප්‍රකාශනයන් භාවිතා කරමින් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් සකස් කළ යුතුය.

**පරිපාලිත අත්පත් කර ගැනීම සහ බැහැර කිරීම**

9.18 පරිපාලිතයේ ආදායම් හා වියදම් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල පවරාගත් දිනයේ සිට ඇතුලත් කරනු ලැබේ. පරිපාලකයට තිබූ පරිපාලිතයේ පාලනය අවසන් වන දිනය තෙක් ~~ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල පරිපාලිතයේ ආදායම් හා වියදම් ඇතුලත් කරනු ලැබේ.~~ පරිපාලිතයක පාලනය මව් සමාගමෙන් බැහැර වූ විට, ~~විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය කිරීම 30 කොටස ප්‍රකාරව ඒකකයේ හඳුනාගත් විදේශ පරිපාලිතයට අදාල කිසියම් සමුච්චිත විනිමය වෙනසක වටිනාකම හැර,~~ පරිපාලිතයන් බැහැර කිරීමෙන් ලද දීමනාව සහ බැහැර කළ දින එහි ධාරණ අගය අතර වෙනස ඒකාබද්ධ වන විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ (ඉදිරිපත් කරන්නේ නම් ආදායම් ප්‍රකාශනයේ පරිපාලිතය බැහැර කිරීමෙන් වූ ප්‍රතිලාභ හෝ අලාභ ලෙස ලාභයෙන් හෝ අලාභයෙන් හඳුනාගනු ලැබේ.) 30 කොටස වන විදේශ විනිමය පරිවර්තනයට අනුකූලව අනෙකුත් විස්තීර්ණ ආදායම් හි හඳුනාගනු ලැබූ, විදේශීය පරිපාලිතයන්ට අදාලවන විනිමය අනුපාතික වෙනස්කම්වල සමුච්චිත ශේෂය පරිපාලිතයන් බැහැර කිරීමේදී ලාභයට හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය නොකෙරේ.

**ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණයන්**

9.23 අ.11 කොටසේ අනාවරණ අවශ්‍යතාවයන්ට අමතරව, මව් අස්තිත්වයක් විසින් වාර්තාකරන දිනයේ දී එක්කෝ සමස්ථයක් වශයෙන් හෝ මූල්‍ය තත්ව ප්‍රකාශනයේ හෝ සටහන් වල ඒකාබද්ධ නොකරන ලද පරිපාලිතයන්හි ආයෝජනයන්ගේ ධාරණ අගයන් අනාවරණය කළ යුතුය. (9.3 අ - 9.3 ඇ ඡේදයන් බලන්න.)

## වෙන්ව වූ මූල්‍ය ප්‍රකාශනයන්

## වෙන්ව වූ මූල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම

9.24 ~~9.2 ඡේදයෙන් පරිපාලිතයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ.~~ මෙම SLFRS ය පරිපාලිත අස්තිත්වයට හෝ තනි පරිපාලිතවලට **වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන** ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

9.25 ~~පරිපාලිතයන් නොමැති අස්තිත්වයක මූල්‍ය ප්‍රකාශන වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන නොවේ. එබැවින්, පරිපාලනයක් නොවන අස්තිත්වයක් නමුත් ආශ්‍රිතයක ආයෝජකයකු හෝ බද්ධ ව්‍යාපාරයක ව්‍යාපාරිකයකුගේ හිමිකම් ඇත්නම් උචිත පරිදි 14 කොටස හෝ 15 කොටසට අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරයි.~~ වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශනයන්, පහත සඳහන් දෑ වලට අමතරව අස්තිත්වයක් ඉදිරිපත් කරනු ලබන ද්විතීය වර්ගයේ මූල්‍ය ප්‍රකාශනයන්ය.

(අ) මව් සමාගමක් විසින් ඉදිරිපත් කරනු ලබන ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්

(ආ) 9.2 ඇ ඡේදය අනුව ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කිරීමෙන් නිදහස් කරන ලද මව් සමාගමක් විසින් සකස්කරන ලද මූල්‍ය ප්‍රකාශනයන්

(ඇ) මව් සමාගමක් නොවන එහෙත් ආශ්‍රිතයක ආයෝජකයකු හෝ බද්ධ ව්‍යාපාරයක බද්ධ ව්‍යාපාරිකයකුගේ ඇල්ම ඇත්තකු වන අස්තිත්වයක් විසින් සකස්කරන මූල්‍ය ප්‍රකාශනයන්.

**ගිණුම්කරණ ප්‍රතිපත්තිය තෝරා ගැනීම**

9.26 පරිපාලනයක් ආශ්‍රිතයක ආයෝජකයකු හෝ බද්ධ පාලිත අස්තිත්වයක හිමිකම් ඇති ව්‍යාපාරකයකු වන මව් සමාගමට වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඒවා කුඩා සහ මධ්‍යම ප්‍රමාණයේ අස්තිත්වයන්ට සඳහා වූ SLFRS ට අනුකූලයැයි විස්තර කළහොත්, එවැනි ප්‍රකාශන පහත දැක්වෙන ආකාරයට හැර මෙම SLFRS හි සියළු අවශ්‍යතාවයන් සමඟ අනුකූල විය යුතුය. අස්තිත්වයක් පරිපාලිත, ආශ්‍රිතයන් සහ **බද්ධ පාලිත අස්තිත්වයන්වල** ඇති ආයෝජන සඳහා ගිණුම්කරණ ප්‍රතිපත්තියක් එක්කෝ වෙන්ව වූ මූල්‍ය ප්‍රකාශනයන් වල එක්කෝ;

(අ) හානිකරණය අඩුකළ පිරිවැයට ~~හෝ~~

(ආ) ලාභය හෝ අලාභයේ හඳුනාගත් **සාධාරණ වටිනාකමට** වෙනස්වීම් සමඟ සාධාරණ අගයට හෝ

(ඇ) 14.8 ඡේදයේ ක්‍රියාපටිපාටින් අනුව ස්කන්ධ ක්‍රමය භාවිතා කරමින්

### සංයෝජිත මූල්‍ය ප්‍රකාශන

9.28 සංයෝජිත මූල්‍ය ප්‍රකාශන යනු තනි ආයෝජකයකු විසින් පාලනය කරනු ලබන (19.2 (අ) ඡේදයේ විස්තර කෙරෙන පරිදි) පොදු පාලනයන් යටතේ පවත්නා අස්තිත්ව දෙකක හෝ ඊට වැඩි සංඛ්‍යාවක මූල්‍ය ප්‍රකාශනවල තනි කට්ටලයක් වේ. මෙම SLFRS අනුව සංයෝජිත මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිමට අවශ්‍ය නොවේ.

## 10 කොටසට සංශෝධනයන් ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු හා වැරදි

10.10 අ ඡේදය එකතු කර ඇත. නව පාඨය යටින් ඉරි ඇඳ ඇත.

### ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්වීම්

10.10අ 17 වන කොටසේ, දේපල, පිරියත හා උපකරණ අනුකූලව වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිපත්තියක් මුල්වරට භාවිතා කිරීම 17 වන කොටස අනුකූලව කළයුතු ප්‍රත්‍යාගණනයක් වන ගිණුම් ප්‍රතිපත්තිවල වෙනස්වීමකි. අනුෂංගිකව, පිරිවැය ආකෘතියේ සිට දේපළ, පිරියත හා උපකරණ පංතියක් ප්‍රත්‍යාගණන ආකෘතියට වෙනස්වීම 10.11- 10.12 ඡේදයන්ට අනුකූලව කරනු වෙනුවට ඉදිරි කාලයට බලපාන පරිදි ගිණුම්කරණය කළ යුතුය.

## 11 වන කොටසට සංශෝධනයන් *මූලික මූල්‍ය සාධන පත්‍ර*

11.4, 11.7, 11.9, 11.11, 11.13 - 11.15 11.27, 11.32 සහ 11.44 සංශෝධනය කර ඇත. 11.9 අ - 11.9 ආ ඡේදයන් එකතුකර ඇත. ඉවත්කරන ලද පාඨයන් කපාහැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

### 11 වන කොටස හඳුන්වා දීම

11.4 **ප්‍රසිද්ධියේ වෙළඳාම් වෙන** ඒවායේ සාධාරණ අගය අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් නොදරා විශ්වාසනීය ලෙස වෙනත් ලෙසකින් මැනිය හැකි, පරිවර්තනය කළ නොහැකි සහ ආපසු භාරදිය නොහැකි වරණීය කොටස් සහ ආපසු භාරදිය නොහැකි සාමාන්‍ය හෝ වරණීය කොටස්වල ආයෝජකයන් හැර සියළුම මූලික මූල්‍ය සාධන පත්‍ර සඳහා 11 වන කොටස ප්‍රාකාර ක්‍රමක්ෂය පිරිවැය ආකෘතිය අවශ්‍ය වේ.

### 11 කොටසේ විෂය පථය

11.7 පහත දෑ වලට හැර 11.8 කොන්දේසි සපුරාලන සියළුම මූල්‍ය සාධන පත්‍ර වලට 11 කොටස අදාල වේ.

(අ) .........

(ආ) අස්තිත්වයක අස්තිත්වය විසින් නිකුත්කරන ලද සංයුක්ත මූල්‍ය සාධන පත්‍රයන්හි ස්කන්ධ සංරචකයද ඇතුළත්ව, තමන්ගේම ස්කන්ධයේ නිර්වචනයට ගැලපෙන මූල්‍ය සාධන පත්‍ර (22 කොටස වගකීම් සහ ස්කන්ධය සහ 26 වැනි කොටස කොටස් පදනම් ගෙවීම් බලන්න.)

(ඇ) 20 වැනි කොටසේ, කල්බදු අදාල වන කල්බදු හෝ 12.3(ඊ) ඡේදය අදාළවේ. කෙසේ නමුදු 11.33 - 11.38 ඡේදයන්හි හඳුනාගැනීම ඉවත්කිරීම අවශ්‍යතාවයන් ලැබිය යුතු කල්බදු පිළිනොගැනීමට බදු දීමනාකරු හා බදු ගැණුම්කරු විසින් හඳුනාගත් කල්බදු ගෙවීම් වලට සහ කල්බදු දීමනාකරු විසින් හඳුනාගත් 11.21 - 11.26 ඡේදයන් හානිකරණ අවශ්‍යතාවයන්ට අදාල වේ. තවද, 12 කොටස 12.3 (ඊ) ඡේදයේ පැහැදිලිව දක්වා ඇති ගති ලක්ෂණයන් සහිත කල්බදු වලට අදාල කරගත හැක.

(ඈ) .........

(ඉ) 26 වැනි ඡේදය අදාල වන මූල්‍ය සාධන පත්‍ර, උපකරණ කොන්ත්‍රාත්තු සහ කොටස් පදනම් ගෙවීම් ගණුදෙනු යටතේ බැඳීම්

(ඊ) 21 වන කොටස වෙන් කිරීම් සහ අසම්භාව්‍යතාවයන් අනුකූලව ගිණුම්කරණය කරනු ලබන වත්කම් ප්‍රතිපූරණය කිරීම් (21.9 ඡේදය බලන්න)

## මූලික මූල්‍ය සාධන පත්‍ර

11.9 පහත (අ) - (ඇ) හි දක්වා ඇති සියළුම කොන්දේසි සපුරාලන ණය සාධන පත්‍රයන් 11 කොටස ප්‍රකාර ගිණුම් ගත කළ යුතුය.

(අ) දරන්නාගේ ප්‍රතිලාභ (ණයදෙන්නා/ණයහිමියා) ණය සාධන පත්‍ර නිකුත් කර ඇති ව්‍යවහාර මුදලින් තක්සේරු කළ යුතුය.

(i) ................

(iv) ස්ථාවර හා විචල්‍ය අනුපාතික යන දෙකම ධනාත්මක නම් (උදා :- ධනාත්මක ස්ථාවර අනුපාතිකයක් සහ ඍණාත්මක විචල්‍ය අනුපාතිකයන් ඇති පොලී අනුපාතික හුවමාරුවන් මෙම නිර්ණායකය සපුරාලනු නොලැබේ.) එවැනි ස්ථාවර ~~අනුපාතික~~ සහ විචල්‍ය අනුපාතිකයන් වල යම් සංයෝජනයන් (~~SLIBOR + 200 පදනම් ඒකක වැනි~~) ස්ථාවර හා විචල්‍ය පොලී අනුපාත ලැබීම සඳහා පොලී ගණනය කරන්නේ අදාල කාලපරිච්ඡේදය සඳහා වන අනුපාතිකය කාලපරිච්ඡේදය තුළදී අයවිය යුතු මුල් වටිනාකමෙන් වැඩි කිරිමෙනි.

(ආ) දරන්නා (ණයදෙන්නා/ණයහිමියා) ට ~~මුල් මුදල හෝ~~ පෙර කාලපරිච්ඡේදයට හෝ ප්‍රවර්ථන කාලපරිච්ඡේදයට අදාල මුල් මුදල හෝ යම් පොලියක් ගිවිසුමේ කොන්දේසි ප්‍රකාර ඉඩකඩක් නොමැත. ණය සාධන පත්‍රය අනිකුත් ණය සාධන පත්‍ර වලට වඩා උපකාර ලෙස සැලකිම එවැනි ගිවිසුම්මය ප්‍රතිපාදනයකට උදාහරණයක් ලෙස නොසැලකේ.

(ඇ) කල්පිරීමට පෙර ණය සාධන පත්‍රයන් නිකුත්කරන්නා (~~ණයගැතියා~~/ණයගන්නා) ට කලින් ගෙවීම හෝ දරන්නා (ණයදෙන්නා/ණයහිමියා) ට එය ආපසු භාරදීමට අවසර දීම හෝ අවශ්‍යවීම (එනම් ආපසුගෙවන ලෙස ඉල්ලා සිටිමට) වැනි ගිවිසුම්මය ප්‍රතිපාදන මතු සිදුවීම් කෙරෙහි බලනොපායි.

(i) නිකුත්කරන්නාගේ හෝ සාධන පත්‍රයේ ණය අවදානම වෙනස් වීම (උදාහරණ ලෙස පැහැරහැරීම්, ණය විශ්වශ්‍යතත්වය පහත හෙළීම්, ණය ප්‍රතිඥා උල්ලංඝනය කිරීම්) හෝ නිකුත්කරන්නාගේ පාලනයේ වෙනස් වීම එදිරිව දරන්නා හෝ

(ii) අදාල බදු හෝ නීතිය වෙනස්වීමට එරෙහිව දරන්නා හෝ නිකුත්කරන්නා

ආරක්ෂා කිරීමක් හැර, අසම්භව්‍ය නොවේ.

(ඈ) ........

11.9 අ. සාමාන්‍යයෙන් 11.9 (අ) (iv) කොන්දේසින් සපුරාලන ණය සාධන පත්‍රයන්ට උදාහරණයන් ලෙසඃ

(අ) පසුව උද්‍ධෘත හෝ නිරීක්ෂණය කළ හැකි විචල්‍ය පොලී අනුපාතියකට හැරෙන ආරම්භක කාලසීමාවක් සඳහා ස්ථාවර පොලී අනුපාතිකයක් ඇති බැංකු ණයක් සහ

(ආ) උද්‍ධෘත හෝ නිරීක්ෂණය කළ හැකි විචල්‍ය පොලී අනුපාතිකයක් සහ ණය කාල සීමාවේ මුළු කාලයේම ස්ථාවර පොලී අනුපාතිකයක් උදා LIBOR + 200 පදනම් ඒකක, ඇති බැංකු ණයක්

ඇතුලත් වේ.

11.9 ආ සාමාන්‍යයෙන් 11.9 (ඇ) ඡේදයෙහි කොන්දේසින් සපුරාලන ණය සාධන පත්‍රයන්ට උදාහරණයක් නම් වැඩපිළිවෙල තුලින් අවසන් කිරීම නිසා ණය ලබා ගන්නා විසින් බැංකුවේ පිරිවැයට අලාභ ගෙවීමක් ලෙස දඩ මුදලක් ගෙවීම අවශ්‍ය කෙරෙන ආකාරයේ වන නමුත් ණය ලබාගන්නාට වැඩ පිළිවෙල කලින් අවසාන කිරිමට ඉඩ සලසන බැංකු ණය වේ.

11.11 11.9 ඡේදයන්හි තත්වයන් සපුරාලනු නොලබන මූල්‍ය සාධන පත්‍රවලට උදාහරණ වලට පහත දෑ ඇතුලත් වේ. (එබැවින් ඒවා 12 වැනි කොටසේ විෂය පථයට ඇතුලත් වේ.)

(අ) ........

~~(ඉ) ඡේද 11.9 (ඇ) හි තත්වය සපුරා නොලබනු ලබන ණයක් වන බැවින් අදාල බදුකරණ හෝ ගිණුම්කරණ අවශ්‍යතාවයන් වෙනස් වුවහොත් තුන්වන පාර්ශවයට ආපසු ගෙවිමේ අයිතිය හෝ බැඳීමක් පැවරෙන තුන්වන පාර්ශවයෙන් ලැබිය යුතු ණය~~

## මුලික මැනීම

11.13 මුලිකව මුල්‍ය වත්කමක් හෝ මුල්‍ය වගකීමක් හඳුනාගැනීමේදී ඇත්ත වශයෙන්ම වැඩ පිළිවෙලට එක්කෝ අස්තිත්වයට (මුල්‍ය වගකීමක් සඳහා) හෝ ප්‍රතිපාර්ශ්වයට (මුල්‍ය වත්කමක් සඳහා) මුල්‍යනය ගණුදෙනුවක් අඩංගුවේ නම් හැර අස්තිත්වය විසින් එය ගණුදෙනු මිලට මනිනු ඇත. (ගණුදෙනු පිරිවැය ඇතුළුව ලාභය හෝ අලාභය මගින් සාධාරණ වටිනාකමට පසුව මනිනු ලබන මුල්‍ය වත්කම් හෝ මුල්‍ය වගකීම් මුලිකව මැනීමේ දී හැර) මුල්‍යනය ගණුදෙනුවක් ~~භාණ්ඩ හෝ සේවා විකිණීම සම්බන්ධයෙන්~~ ඇතිවිය හැක. ~~උදාහරණයක් වශයෙන්~~ ගෙවීම සාමාන්‍ය ව්‍යාපාර කොන්දේසිවලට වඩා පහසු වන්නේ නම් උදාහරණ ලෙස භාණ්ඩ හෝ සේවා මිලදී ගන්නෙකුට පොලී රහිත ණය සැපයීම හෝ වෙළඳපොළ අනුපාතිකයට නොවන පොලී අනුපාතිකයකට මුල්‍යනය කිරීම උදාහරණ ලෙස සේවා නියුක්තිකයකුට පොලී රහිත හෝ වෙළඳපොල පොලී අනුපාතිතයකට වඩා අඩු පොලියකට දුන් ණය මුදලක්, වැඩ පිළිවෙලට මුල්‍ය ගණුදෙනුවක් අඩංගු නම් අස්තිත්වය විසින් මුල්‍ය වත්කම් හෝ මුල්‍ය වගකීමට සමානව මුලික හඳුනාගැනීමේදි තීරණය කරන ලද ණය සාධන පත්‍රයකට වෙළඳපොළ පොලී අනුපාතිකයකට වට්ටම් කළ අනාගත ගෙවීම් වල වර්තමාන අගයට මනිනු ඇත.

.........

## පසුකාලීන මැනිම

11.14 අස්තිත්වයක් විසින් විකිණීමේදී හෝ වෙනත් බැහැර කිරීමකදී දරණ ගණුදෙනු පිරිවැය සඳහා අඩුකිරීමක් නොකර අස්තිත්වයක් විසින් එක් එක් **වාර්තාකරන කාලපරිච්ඡේදයේ** අවසානයේ මුල්‍ය සාධන පත්‍ර පහත පරිදි මනිනු ලැබේ.

(අ) 11.8 (ආ) ඡේදයෙහි කොන්දේසි සපුරාලන ණය සාධන පත්‍ර **සඵල පොලී අනුපාතිකය** යොදා ගනිමින් **ක්‍රමක්ෂය පිරිවැයට** මනිනු ලැබේ. 11.15 - 11.20 ඡේද සඵල පොලී ක්‍රමය යොදා ගනිමින් ක්‍රමක්ෂය පිරිවැය නිර්ණය කිරිමේ උපදෙස් සපයයි. ජංගම වත්කම් හෝ ජංගම වගකිම් වශයෙන් වර්ගීකරණය කරන ලද ණය සාධන පත්‍ර ඇත්ත වශයෙන්ම වැඩි පිළිවෙලකට මුල්‍යනය ගණුදෙනුවක් (11.13 ඡේද බලන්න) අඩංගු වී ඇත්නම් මිස, ගෙවිය යුතු හෝ ලැබිය යුතු (එනම් හානිකරණයේ ශුද්ධය 11.21 - 11.26 ඡේද බලන්න.) වට්ටම් නොකළ මුදල් වටිනාකමකට හෝ අනිකුත් ප්‍රතිශ්‍යාවට මනිනු ඇත. ~~වැඩ පිළිවෙලෙහි මුල්‍යනය ගණුදෙනුවක් අඩංගු වී ඇත්නම්, අස්තිත්වය විසින් ණය සාධන පත්‍රය සමාන ණය සාධන පත්‍රයකට වන වෙළඳපොළ අනුපාතිකයකට වට්ටම් කළ ඉදිරිගෙවීම් වල වර්තමාන අගයට මනිනු ඇත.~~

(ආ) ........

(ඇ) ~~11.8 ඡේදහි කොන්දේසි සපුරාලන~~ පරිවර්ත්‍ය නොවන වරණීය කොටස් සහ ආපසු භාරදිය නොහැකි සාමාන්‍ය කොටස් හෝ වරණීය කොටස් පහත ආකාරයට මැනිය යුතුය. (11.127 -13.32 ඡේදයන්හි සාධාරණ වටිනාකම් මඟ පෙන්වීම දක්වා ඇත.)

(i) කොටස් ප්‍රසිද්ධියේ වෙළඳාම් කරන්නේ නම් හෝ ඒවායේ සාධාරණ වටිනාකම අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයන් නොමැතිව, විශ්වාසනීය ලෙස මැනිය හැකි නම් සාධාරණ වටිනාකමේ වෙනස්වීම් ලාභයේ හෝ අලාභයේ හඳුනාගනිමින් සාධාරණ අගයට මැනිය යුතුය.

(ii) ........

## ක්‍රමක්ෂය පිරිවැය සහ සඵල පොලීක්‍රමය

11.15 එක් එක් වාර්තාකරන දිනයට මුල්‍ය වත්කමක හෝ මුල්‍ය වගකීමක ක්‍රමක්ෂය පිරිවැය පහත වටිනාකම්වල ශුද්ධ වටිනාකම වේ.

(අ) ........

ප්‍රකාශිත පොලී අනුපාතයක් නොමැති, මුල්‍යනය ගණුදෙනුවක් බවට පත්විය හැකි ආකාරයේ වැඩපිළිවෙලකට සම්බන්ධ නොවන යන ජංගම වත්කම් හෝ ජංගම වගකීම් වශයෙන් වර්ගීකරණය කර ඇති මුල්‍ය වත්කම් හා මුල්‍ය වගකීම් මුලිකව 11.13 ~~4(අ)~~ ඡේද ප්‍රකාර වට්ටම් නොකළ වටිනාකමකට මනිනු ලැබේ. එබැවින් ඉහත (ඇ) ඒවාට අදාළ නොවේ.

**සාධාරණ අගය**

11.27 ~~11.14 (ඇ) (ස) ඡේදයෙන් සාමාන්‍ය කොටස් හෝ වරණීය කොටස් වල ආයෝජනයන් කොටස්වල සාධාරණ වටිනාකම විශ්වාශනීය ලෙස මැනිය හැකි නම් සාධාරණ වටිනාකම මැනීමට අවශ්‍ය කෙරේ.~~ අස්තිත්වයක් පහත දී ඇති අනුපිළිවෙල ~~කොටස්වල~~ වත්කමක සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කිරීමට යොදාගනී.

(අ) සක්‍රිය වෙළඳපොළක සර්ව සම වත්කම (හෝ සමාන වත්කම) ක් සඳහා සාධාරණ වටිනාකමේ හොඳම සාක්ෂිය **ප්‍රකාශිත මිල** වේ. මෙය සාමාන්‍යයෙන් ප්‍රවර්තන ලංසු මිල වේ.

(ආ) ප්‍රකාශිත මිල ගණන් නොමැතිනම් සර්වසම වත්කම (හෝ සමාන වත්කම) ක් සඳහා බැඳුණු විකුණුම් ගිවිසුමක හෝ කැමැත්ත ඇති දැනුවත් පාර්ශ්වයන් අතර වන අතේ දුර ගණුදෙනුවකදී මෑත ගණුදෙනුවක මිල ~~බොහෝ දුරට ආර්ථික තත්වයන් වල සැලකිය යුතු වෙනසක් හෝ ගණුදෙනුවට එළඹීමෙන් පසු සැලකිය යුතු කාලයක් ගතවී නොමැති නම්~~ සාධාරණ වටිනාකමට සාක්ෂි සපයයි. කෙසේ වෙතත්, ආර්ථික තත්වයන්වල සැලකිය යුතු වෙනසක් හෝ බැඳුනු විකිණීම් ගිවිසුම් දිනය හෝ ගණුදෙනුව සහ මිනුම්කරණ දිනය අතර සැලකිය යුතු කාලයක් ගතවී තිබේනම් මෙම මිල සාධාරණ අගයේ හොඳ ඇස්තමේන්තුවක් නොවිය හැකිය. අවසාන ගණුදෙනු මිල සාධාරණ අගයේ හොඳ ඇස්තමේන්තුවක් නොවන බවට පෙන්නුම් කළ හැකි නම් (උදා:- එය බලෙන් කරන ගණුදෙනුවක සිය කැමැත්තෙන් නොවන ඇවර කිරීමකදී හෝ ආපදා විකිණීමකදී අස්තිත්වයට ලැබුණු හෝ ගෙවූ වටිනාකමට පිළිබිඹුවනු දක්වන බැවිනි.) එවිට එම මිල ගලපනු ලැබේ.

(ඇ) වත්කම සඳහා වෙළඳපොල සක්‍රිය නැත්නම් සහ ඕනෑම බැඳෙන විකුණුම් ගිවිසුමක් හෝ සර්වසම වත්කම (හෝ සමාන වත්කම) ක් සඳහා මෑත ගණුදෙනුවක් එය තනියම සාධාරණ වටිනාකමේ හොඳ ඇස්තමේන්තුවක් නොවන අතර අස්තිත්වයක් තක්සේරු කිරීමේ වෙනත් ශිල්පීය ක්‍රමයක් යොදාගනිමින් සාධාරණ වටිනාකමට ඇස්තමේන්තු කරයි. තක්සේරු කිරීමේ ශිල්පීය ක්‍රමයෙන් යොදා ගැනීමේ අරමුණ වන්නේ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී පොළඹවනු ලැබූ අතේ දුරින් වූ හුවමාරුවකදී මිනුම් දිනයේදී තිබිය හැකි ගණුදෙනු මිල ඇස්තමේන්තු කිරීමය.

මෙම SLFRS හි අනිකුත් කොටස්, 12 වන කොටස, 14 වන කොටස, 15 වන කොටස, ~~සහ~~ 16 වන කොටස ආයෝජන දේපළ ඇතුළත්ව, 17 වන කොටස, දේපළ, පිරියත සහ උපකරණ 28 කොටස ඇතුළුව 11.27 - 11.32 ඡේදයන්හි සාධාරණ වටිනාකමේ මඟ පෙන්වීම්වලට යොමු කෙරේ. ~~මෙම මඟ පෙන්වීම එවැනි කොටස්වලින් ආවරණය වන වත්කම් වලට අදාල කර ගැනීමේදී මෙම ඡේදයේ සඳහන් සාමාන්‍ය කොටස් හෝ වරණීය කොටස්වලට යොමු කිරීමේදී එම කොටස්වලින් ආවරණය වූ වත්කම් වර්ග 2 ඇතුලත් වී ඇති ලෙසට කියවිය යුතුයි.~~

**සක්‍රිය වෙළඳපොලක් නොමැතිවීම ~~ස්කන්ධ සාධන පත්‍ර~~**

11.32 සාධාරණ අගයට මනින ලද වත්කමකට, තවදුරටත් විශ්වාසදායක ලෙස සාධාරණ අගය මැනීමක් නොමැතිනම්, (හෝ එවැනි ව්‍යතිරේඛයන් සපයන විටදී, අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් නොදරා නොලැබේ නම් (11.14 (ඇ) සහ 12.8 (ආ) බලන්න) ~~උදා: ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයට මනින ලද ස්කන්ධ සාධන පත්‍රයක්~~) වත්කම අවසාන දිනයට විශ්වාසදායක ලෙස මැනිය හැකි ධාරණ අගය එහි අලුත් පිරිවැය වේ. විශ්වාසදායක සාධාරණ වටිනාකම් මැනීමක් ඇතිවන (හෝ එවැනි ව්‍යතිරේඛයක් සැපයීමේදී අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් නොදරා ලබාගත හැකිවන) තෙක් අස්තිත්වය මෙම වත්කම පිරිවැය හානිකරණය අඩුකොට මැනිය යුතුය.

**මූල්‍ය තත්වය ප්‍රකාශනය මූල්‍ය වත්කම් සහ මූල්‍ය වගකීම් වල ප්‍රභේදයන්**

11.44 ලාභය හෝ අලාභය මගින් සාධාරණ අගයට මනින ලද ස්කන්ධ සාධන පත්‍රයක් සඳහා විශ්වාසනීය සාධාරණ වටිනාකම් මිනුමක් තවදුරටත් නොමැතිනම් හෝ එවැනි ව්‍යතිරේඛයක් සැපයීමේදී අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් නොදරා ලබාගත නොහැකි නම් මෙම SLFRS ප්‍රකාරව, අස්තිත්වය විසින් එම කරුණ, එම මූල්‍ය සාධන පත්‍රයන්ගේ ධාරණ අගය අනිසි පිරිවැය හෝ පරිශ්‍රමය ව්‍යතිරේඛය භාවිතාකර තිබේ නම් විශ්වාසනීය සාධාරණ අගය මිනුම්කරණයකට අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් දැරීමට විය හැකි හේතූන් ද හෙළිදරව් කළ යුතුය.

## 12 වන කොටසට සංශෝධනයන් වෙනත් මූල්‍ය සාධන පත්‍ර ගැටළු

12.3, 12.8 - 12.9, 12.23, 12.25 සහ 12.29 ඡේදයන් සංශෝධනය කර ඇත. ඉවත් කරන ලද පාඨයන් කපාහැර ඇති අතර, නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

## 12 වන කොටසේ විෂය පථය

12.3 පහත දෑ වලට හැර 12 වන කොටස සියළු මූල්‍ය සාධන පත්‍ර වලට අදාල වේ.

(අ) ........

(ආ) පරිපාලිතයන්හි ඇයිතිය (9 වන කොටස ඒකාබද්ධ සහ වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන බලන්න.) ආශ්‍රිත (14 වන කොටස ආශ්‍රිතයන්හි ආයෝජන බලන්න.) සහ බද්ධ ව්‍යාපාර (15 වන කොටස බද්ධ ව්‍යාපාරවල ආයෝජන බලන්න.) 9 වන කොටස ඒකාබද්ධ සහ වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශන, 14 වන කොටස ආශ්‍රිතයන්හි ආයෝජන හෝ 15 වන කොටස බද්ධ ව්‍යාපාරවල ආයෝජන ප්‍රකාරව ගිණුම්කරණය කරන **පරිපාලිතයන්, ආශ්‍රිතයන්** හා **බද්ධ ව්‍යාපාර** වල ආයෝජනයන්.

(ඇ) ........

(ඉ) අස්තිත්වයක් විසින් නිකුත්කරන ලද සංයුක්ත මූල්‍ය සාධන පත්‍රයන්හි ස්කන්ධ සංචරකයද ඇතුළුව අස්තිත්වයක තමාගේම ස්කන්ධය නිර්වචනය සපුරාලන මූල්‍ය සාධනපත්‍ර (22 වන කොටස වගකීම් සහ ස්කන්ධය සහ 26 වන කොටස කොටස් පදනම් ගෙවීම් බලන්න.)

(ඊ) පහත සඳහන් දෑ වලට සම්බන්ධ නොවන ගිවිසුම් කොන්දේසි වල ප්‍රතිඵලයක් වශයෙන් කල්බද්ද බදු දීමනාකරු හෝ බදු ගැණුම්කරුට අලාභයක් නොදුනහොත් මිස, (20 වන කොටස කල්බදු බලන්න) විෂය පථයට ඇතුලත් වන කල්බදු සඳහා අනුෂංගිකව 12 වන කොටස අදාල වේ.

(i) ........

(ii) විදේශීය විනිමය අනුපාතිකවල වෙනස්කම්, හෝ

(iii) ප්‍රතිපාර්ශවයන්ගෙන් එක්කෙනෙකු විසින් පැහැර හැරීම විචල්‍ය වෙළඳපොළ පොලී අනුපාතිකයන් මත පදනම් වූ කල්බදු ගෙවීම් වල වෙනස්කම් හෝ

(iv) ප්‍රතිපාර්ශ්වයන්ගෙන් එක් කෙනෙකු විසින් පැහැර හැරීම

(උ) ........

(ඌ) මූල්‍ය සාධන පත්‍ර, කොන්ත්‍රාත්තු සහ බැඳීම්, 26 වන කොටස කොටස් පදනම් ගෙවීම් අදාල වන කොටස් පදනම් ගෙවීම් ගණුදෙනු

(ඔ) 21 වන කොටස ප්‍රතිපාදන සහ අසම්භාව්‍යතා ප්‍රකාරව ගිණුම්කරණය කෙරෙන වත්කම් ප්‍රතිපූර්ණය කිරීම් (21.9 ඡේදය බලන්න.)

## පසුකාලීන මැනීම

12.8 පහත දී ඇති දෑ හැර අස්තිත්වයේ සෑම **වාර්තාකරන කාලපරිච්ඡේදයක** අවසානයේ 12 වන කොටසේ විෂය පථයට ඇතුළත් වන සියළුම මූල්‍ය සාධන පත්‍ර මැනිය යුතු අතර සාධාරණ වටිනාකමේ වෙනස්කම් ලාභයේ හෝ අලාභයේ හඳුනාගත යුතුය.

(අ) නම් කරන ලද ඉදිරි රැකුම සම්බන්ධතාවයක් තුළ ඇති ඉදිරි රැකුම් උපකරණයන්හි සාධාරණ අගයේ සමහර වෙනස්කම් 12.23 ඡේදය මඟින් අනෙකුත් විස්තීර්ණ ආදායම් තුළ හැඳින්වීම අවශ්‍ය වේ.

(ආ) ප්‍රසිද්ධියේ වෙළඳාම් නොකරන සහ ඒවායේ සාධාරණ වටිනාකම, අනිසි පිරිවැයක් හෝ පරිශ්‍රමයක් නොමැතිව අන් අයුරකින් විශ්වාසනීය ලෙස මැනිය නොහැකි ස්කන්ධ සාධන පත්‍ර සහ එවැනි සාධන පත්‍ර සම්බන්ධ ගිවිසුම් ක්‍රියාත්මක කළහොත් එවැනි සාධන පත්‍ර භාරදීම පිරිවැයෙන් හානිකරණය අඩුකර මැනිය යුතුය.

12.9 ප්‍රසිද්ධියේ වෙළඳාම් නොකරන ස්කන්ධ සාධන පත්‍රයන්ට හෝ ක්‍රියාත්මක කළහොත් එවැනි සාධන පත්‍ර භාරදීම සිදුවෙන ගිවිසුම් බැඳීම් ඇති සාධන පත්‍රයන්ට අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් නොදරා විශ්වාසනීය සාධාරණ වටිනාකම් මිනුමක් තවදුරටත් නොමැතිනම්, සහ එය ලාභය හෝ අලාභය ඔස්සේ වටිනාකමට මැනිය හැකිනම්, අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් නොදරා ලාභය හෝ අලාභය ඔස්සේ විශ්වාසනීය ලෙස මැනිය හැකි අවසාන දිනයේ සාධාරණ අගය උපකරණයේ පිරිවැය ලෙස සලකනු ලැබේ. අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් නොදරා සාධාරණ අගයේ විශ්වාසනීය මිනුම්කරණයක් නිශ්චය

කරගත හැකිවන තුරු ~~ලැබෙන තුරු~~ අස්තිත්වය සාධන පත්‍රය මෙම පිරිවැයෙන් හානිකරණය අඩුකර මැනිය යුතුය.

**හඳුනාගත් මූල්‍ය සාධන පත්‍රයක විචල්‍ය පොලී අනුපාතික අවදානම, විදේශ විනිමය අවදානම ස්ථිර බැඳීමක හෝ අතිශයෙන්ම විය හැකි පුරෝකථන ගණුදෙනුවක වෙළඳ භාණ්ඩ මිල අවදානම හෝ විදේශීය මෙහෙයුමක ශුද්ධ ආයෝජනයක ඉදිරි රකුම**

12.23 12.16 ඡේදයෙන් කොන්දේසි සපුරා ලන්නේ නම් සහ ඉදිරි රකුම් ගත අවදානම

(අ) .........

අස්තිත්වය වෙනත් විස්තීරණ ආදායම් වල, ඉදිරි රකුම්ගත අයිතමයේ අපේක්ෂිත මුදල් ප්‍රවාහ හෝ සාධාරණ වටිනාකමේ වෙනස හිලව් කිරීමට යෝග්‍ය ඉදිරිරකුම් සාධන පත්‍රයේ සාධාරණ වටිනාකමේ වෙනසේ කොටස හඳුනාගත යුතු ඉදිරි රකුම් සාධන පත්‍රයේ ඉදිරි රකුම ආරම්භයේ සිටම අපේක්ෂිත මුදල් ප්‍රවාහවල සාධාරණ අගයට (සමහර අවස්ථාවන්හිදී ඉදිරි රකුම් අකාර්යක්ෂමතාව වශයෙන් හඳුනවන) වඩා ඉදිරි රකුම් සාධන පත්‍රයේ සාධාරණ වටිනාකමේ සමුච්චිත වෙනසේ යම් අතිරික්තයක් (නියත මුදල) අස්තිත්වය විසින් සෑම කාලපරිච්ඡේදයක් තුළම ලාභයේ හෝ අලාභයේ හඳුනාගනී. වෙනත් විස්තීරණ ආදායම් හඳුනාගත් ඉදිරි රකුම්ගත අයිතමයේ ප්‍රතිලාභ හෝ අලාභ ඉදිරිරකුම අයිතමය ලාභයේ හෝ අලාභවල හඳුනාගත්විට ~~හෝ ඉදිරිරකුම් සම්බන්ධතාවය අවසන් වූ විට~~, 12.25 ඡේදයේ අවශ්‍යතාවයන්ට යටත්ව ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරනු ඇත. කෙසේ වෙතත් අනෙකුත් විස්තීරණ ආදායම් හි හඳුනාගනු ලැබූ විදේශීය මෙහෙයුමක ශුද්ධ ආයෝජනයක ඉදිරි රකුමට සම්බන්ධ විදේශීය විනිමය අනුපාතිකයක වෙනසේ සමුච්චිත වටිනාකම, විදේශීය මෙහෙයුම සහමුලින් හෝ අර්ධ වශයෙන් ඉවත් කිරීමකදී ලාභයට හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය නොකරනු ඇත.

12.25 පහත දෑ සිදු වුවහොත් අස්තිත්වය 12.23 ඡේදයෙහි නිශ්චය කර ඇති ඉදිරිරකුම් ගිණුම්කරණය ඉදිරියට බලපාන පරිදි අත්හැර දමනු ඇත.

(අ) ........

පුරෝකථන ගණුදෙනුව සිදුවේයැයි තවදුරටත් අපේක්ෂා නොකරයි නම් හෝ ක්‍රමක්ෂය පිරිවැයට ඉදිරිරකුම් ගත ණය සාධන පත්‍රය හඳුනාගැනීම ඉවත් කරයි නම් විස්තීරණ ආදායම් හඳුනාගත් ඕනෑම ලාභයක් හෝ අලාභයක් ~~වෙනත් විස්තීරණ ආදායමෙන්~~ ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරනු ඇත.

## හෙළිදරව් කිරීම්

.....................

12.29 විචල්‍ය පොලී අනුපාතික අවදානම, විදේශ විනිමය අවදානම, ස්ථාවර බැඳීමක හෝ අතිශයින්ම විය හැකි පුරෝකථනය කළ ගණුදෙනුවක වෙළඳ ද්‍රව්‍ය මිල අවදානම හෝ විදේශීය මෙහෙයුමක, ශුද්ධ ආයෝජනයක ඉදිරිරකුමක් සඳහා අස්තිත්වයක් ඉදිරිරකුම් ගිණුම්කරණය භාවිතා කරයි නම් (12.23 - 12. 25 ඡේදයන්) එය පහත දෑ හෙළිදරව් කළ යුතුය.

(අ) ........

(ඈ) කාලපරිච්ඡේදය තුළදී ~~වෙනත් විස්තීරණ ආදායමෙන්~~ ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කළ වටිනාකම (12.23 - 12.25 ඡේද)

(ඊ) කාලපරිච්ඡේදය සඳහා ලාභයේ හෝ අලාභයේ හඳුනාගත් මුදල් ප්‍රවාහවල සාධාරණ වටිනාකමේ සමුච්චිත වෙනසට වඩා ඉදිරිරකුම් සාධන පත්‍රයේ සාධාරණ වටිනාකමේ සමුච්චිත වෙනසක අතිරික්තයක වටිනාකම (12.23 ~~24~~ ඡේද)

## 14 වන කොටසට සංශෝධනයන් ආශ්‍රිතයන්හි ආයෝජන

14.15 ඡේදය සංශෝධනය කර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**හෙළිදරව් කිරීම්**

14.15 සාධාරණ වටිනාකම් ආකෘතිය අනුව ගිණුම්ගත කළ ආශ්‍රිතවල ආයෝජන සඳහා ආයෝජකයකු 11.14 - 11.44 ඡේදයන්ගෙන් අවශ්‍ය වන හෙළිදරව් කිරීම් කළ යුතුය. ආශ්‍රිතයක් සඳහා ආයෝජකයකු 14.10 ඡේදයේ අනිසි පිරිවැය හෝ පරිශ්‍රමය ව්‍යතිරේඛය භාවිතා කරන්නේ නම්, එය ඒ බවද සාධාරණ අගය මිනුම්කරණය සඳහා අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් දැරීමට සිදුවිය හැකි හේතූන් සහ පිරිවැය ආකෘතිය මත ගිණුම්කරණය කරන ලද්‍, ආශ්‍රිතයේ ආයෝජනයන්හි ධාරණ අගයද හෙළිදරව් කළ යුතුය.

## 15 වන කොටසට සංශෝධනයන්, බද්ධ ව්‍යාපාරයන්හි ආයෝජන

15.21 ඡේදය සංශෝධනය කර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**හෙළිදරව් කිරීම්**

15.21 සාධාරණ වටිනාකම් ක්‍රමය ප්‍රකාර ගිණුම්ගත කළ බද්ධ පාලිත අස්තිත්වයක් සඳහා ව්‍යාපාරිකයකු 11.14 -11.44 ඡේද වලින් අවශ්‍ය වන අනාවරණයන්ද කරනු ඇත. බද්ධ ව්‍යාපාරිකයකු විසින් ඕනෑම බද්ධව පාලනය කරනු ලබන අස්තිත්වයක් සඳහා 15.15 ඡේදයෙහි අනවශ්‍ය පිරිවැයක් හෝ ප්‍රයත්නයක් ව්‍යතිරේඛය භාවිතා කරන්නේ නම් එය ඒ වුවද සාධාරණ අගය මිනුම්කරණය සඳහා අනවශ්‍ය පිරිවැය හෝ ප්‍රයත්නයක් දැරීමට සිදුවිය හැකි හේතූන් සහ පිරිවැය ආකෘතිය මත ගිණුම්කරණය කරන ලද බද්ධව පාලනය කරනු ලබන අස්තිත්වයන් හි ඇති ආයෝජනයන්ගේ ධාරණ අගයද හෙළිදරව් කළ යුතුය.

## 16 වන කොටසට සංශෝධනයන් ආයෝජන දේපළ

16.10 ඡේදය සංශෝධනය කර ඇත. ඉවත් කරන ලද පාඨයන් කපාහැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**හෙළිදරව් කිරීම්**

16.10 සියළුම ආයෝජන දේපළ සඳහා ලාභ හෝ අලාභ හරහා සාධාරණ අගයකට ගිණුම්කරණ අස්තිත්වයක් පහත සඳහන් කරුණු හෙළිදරව් කළ යුතුය. (16.7 ඡේදය)

(අ) .......

(ඉ) පහත සඳහන් අයිතම් වෙන වෙනම පෙන්වමින් ආයෝජන දේපළ වල ධාරණ අගයේ ආරම්භක හා අවසාන කාලපරිච්ඡේදය අතර සැසඳුම් විස්තරයක්

(i) .......

(iii) ~~අනවශ්‍ය පිරිවැයක් හෝ ප්‍රයත්නයක් නොමැතිව සාධාරණ අගය විශ්වාසදායක ලෙස මැනීමට තවදුරටත් නොහැකිවීම~~ පිරිවැයෙන් සමුච්චිත ක්ෂය හානිකරණය අඩුකළ අගයට ඉදිරියට ගෙන යන අයෝජනයන් දේපළ,~~ පිරියත හා උපකරණ~~ වලට මාරුකිරීම් හෝ වලින් ඉවත්කිරීම් (16.8 ඡේදය බලන්න.)

(iv) .......

## 17 වැනි කොටසට සංශෝධනයන් දේපළ, පිරියත හා උපකරණ

17.5 - 17.6 සහ 17.31 - 17.32 සංශෝධනය කර ඇත. 17.15 ඡේදය 17.15 අ ලෙස නැවත අංක කර ඇත. 17.15 නව ඡේදයන් එකතුකර ඇත. 17.15 ආ - 17.15 ඈ සහ ඒවායේ අදාළ ශීර්ෂ පාඨයන් සහ 17.33 ඡේදය එකතුකර ඇත. ඉවත්කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**හඳුනාගැනීම**

17.5 අමතර කොටස් පොරොත්තුවට සිටින උපකරණ වැනි අයිතමයන් සහ සේවා උපකරණ ඒවා දේපළ, පිරියත සහ උපකරණ නිර්වචනය සපුරාලන විට මෙම කොටස ප්‍රකාරව පිළිගනු ලැබේ. එසේ නැතහොත් ඒවා ~~සාමාන්‍යයෙන් තොගවල ඇතුලත් කර, පරිභෝජනය කළ ලෙස ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගැනෙයි.~~ තොග වශයෙන් වර්ගීකරණය කෙරේ. ~~කෙසේ වුවද අස්තිත්වය විසින් එක් කාලපරිච්ඡේදයක් ඉක්මවන පාවිච්චි කිරීමට අපේක්ෂාකරන ප්‍රධාන අමතර කොටස් සහ පොරොත්තුවට~~

සිටින උපකරණ දේපළ පිරියත සහ උපකරණ ලෙස සැලකෙයි. එසේම අමතර කොටස් සහ සේවා උපකරණ එක් දේපළ පිරියත සහ උපකරණ අයිතමයක් සමඟ පමණක් පාවිච්චියට ගත හැකි වන්නේ නම්, ඒවා දේපළ පිරියත සහ උපකරණ ලෙස සැලකෙයි.

17.6 ඇතැම් දේපළ, පිරියත සහ උපකරණවල කොටස් (උදා ගොඩනැගිල්ලක වහල) ක්‍රමානුකූලව කාලපරිච්ඡේදයකට වරක් ප්‍රතිශ්ඨාපනය කිරීමට සිදුවිය හැකිය. ප්‍රතිසම්පාදනය කළ කොටස මඟින්, අස්තිත්වයට අනාගත වර්ධක ප්‍රතිලාභ ලැබීම අපේක්ෂාකරන්නේ නම්, අස්තිත්වය එම ප්‍රතිසම්පාදනය කළ කොටස්, පිරිවැය දේපළ පිරියත සහ උපකරණ අයිතමයෙහි ධාරණ අගයට එකතුකළ යුතුය. එම ඉවත්කළ කොටස් වල **ධාරණ අගය** ඒවා වෙන් වෙන්ව ක්ෂය කරනු ලැබුවේද යනු නොතකමින්, 17.27 - 17.30 ඡේද වලට අනුකූලව **හඳුනාගැනීමෙන් බැහැර කළ යුතුය.** ප්‍රතිශ්ඨාපනය කළ කොටසෙහි ධාරණ අගය නිශ්චය කිරීම ප්‍රායෝගික නොවන්නේ නම්, අස්තිත්වය විසින් ප්‍රතිසම්පාදන පිරිවැය එය අත්පත්කර ගැනීමේ හෝ ගොඩනැගීමේ අවස්ථාවේ ඇරීමට සිදුවිය හැකි පිරිවැය පිළිබිඹු කරන්නක් ලෙස භාවිතා කළ හැකිය. දේපළ පිරියත සහ උපකරණ අයිතමයක ප්‍රධාන උපාංගයන් ආර්ථික ප්‍රතිලාභ පරිභෝජනය කිරීමේ රටාවේ සැලකිය යුතු වෙනස්කම් තිබේනම් අස්තිත්වය වත්කමෙහි මූලික පිරිවැය, එහි ප්‍රධාන උපාංග වලට බෙදා වෙන්කළ යුතු අතර ඒ එක් එක් උපාංගය ඒවායේ **ප්‍රයෝජනවත් ජීවිතකාලය පුරා ක්ෂය කළයුතු බවටත්** 17.16 ඡේදයෙන් ඉඩ සලසා දෙයි.

**මුල් හඳුනාගැනීමට පසුව මැනීම**

17.15 අස්තිත්වයක් 17.15 අ ඡේදයෙහි දැක්වෙන පිරිවැය ආකෘතිය හෝ 17.15 ආ ඡේදයෙහි දැක්වෙන ප්‍රත්‍යාගණන ආකෘතිය හෝ එහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය ලෙස තෝරාගත යුතු අතර එම ප්‍රතිපත්තිය දේපළ, පිරියත සහ උපකරණ සෑම පන්තියකටම භාවිතා කළ යුතුය. අනවශ්‍ය පිරිවැය හෝ ප්‍රයත්නයන් නොදරා විශ්වාසනීය ලෙස සාධාරණ අගය මැනිය නොහැකි ආයෝජන දේපළ සඳහා අස්තිත්වයක් පිරිවැය ආකෘතිය භාවිතා කළ යුතුය. දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක එදිනෙදා සේවා කිරීමේ පිරිවැය, අස්තිත්වයක් එම පිරිවැය අදාල කාලපරිච්ඡේදයේ ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගත යුතුය.

**පිරිවැය ආකෘතිය**

17.15 අ. අස්තිත්වයක් විසින් සියළුම දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් මුල්වරට හඳුනාගත් පසුව යම් සමුච්චිත ක්ෂය සහ යම් සමුච්චිත **හානිකරණ අලාභ** අඩුකළ පිරිවැයට මිණුම් කළ යුතුය. දේපළ පිරියත සහ උපකරණ අයිතමයන්, එදිනෙදා සේවා කිරීමෙහි පිරිවැය, එම පිරිවැය දරනු ලැබූ කාලපරිච්ඡේදයෙහි ලාභයෙහි හෝ අලාභයෙහි අස්තිත්වය විසින් හඳුනාගත යුතුය.

**ප්‍රත්‍යාගණන ආකෘතිය**

17.15 ආ. අස්තිත්වයක් විසින් දේපළ, පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන දිනයෙන් පසුව වන සමුච්චිත ක්ෂය සහ පසුව වන හානිකරණ අලාභයන් ඇතොත් අඩුකළ පසු, සාධාරණ අගය වන විශ්වාසනීය ලෙස මැණිය හැකි සාධාරණ අගයට මැණිය යුතුය. වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදය අවසානයේ නිශ්චය කරනු ලැබූ සාධාරණ අගය ධාරණ අගයෙන් ප්‍රමාණාත්මක වෙනස් නොවන බවට සහතිකවීම පිණිස ප්‍රත්‍යාගණනය ප්‍රමාණයක් නිත්‍යත්වයක් අනුව කළ යුතුය. 11.27 - 11.32 ඡේදයන් සාධාරණ අගය නිශ්චය කිරීමේ උපදෙස් සපයයි. දේපළ පිරියත සහ උපකරණ එක් අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන්නේ නම්, එම අයිතමය අයිතිවන දේපළ, පිරියත සහ උපකරණ සම්පූර්ණ පංතියම ප්‍රත්‍යාගණනය කළ යුතුය.

17.15 ඇ. වත්කමක ධාරණ අගය, ප්‍රත්‍යාගණනය කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් වැඩිවේ නම්, වැඩිවීම අනෙකුත් විස්තීරණ ආදායම්හි හඳුනාගත යුතු අතර ප්‍රත්‍යාගණන අතිරික්තය ශීර්ෂය යටතේ ස්කන්ධයෙහි සමුච්චිත කළ යුතුය. කෙසේ වෙතත් එය පූර්වයෙහි ලාභයෙහි හෝ අලාභයෙන් හැඳින්වූ ප්‍රත්‍යාගණන හානියක් ප්‍රතිවර්තනය කරන්නේ නම්, එම ප්‍රමාණයට වැඩිවීම ලාභයෙහි හෝ අලාභයෙහි හැඳින්විය යුතුය.

17.15 ඈ. ප්‍රත්‍යාගණනයේ ප්‍රතිඵලයක් වශයෙන් වත්කමක ධාරණ අගය අඩුවේනම් අඩුවීම ලාභයෙහි හෝ අලාභයෙහි හැඳින්විය යුතුය. කෙසේ වෙතත්, එම වත්කම වෙනුවෙන් ප්‍රත්‍යාගණන අතිරික්තයක තිබෙන යම් බැර ශේෂයක ප්‍රමාණය අඩුවීම අනෙකුත් විස්තීරණ ආදායම් හි හැඳින්විය යුතුය. අනෙකුත් විස්තීරණ ආදායම් හි හැඳින් වූ අඩු කිරීමෙන් ප්‍රත්‍යාගණන අතිරික්තය ශීර්ෂය යටතේ ස්කන්ධයේ සමුච්චිත අගය අඩු වේ.

**හෙළිදරව් කිරීම්**

17.31 4.11 (අ) ඡේදය අනුව නිශ්චය කරන ලද අදාළ වන සේ සැලකුනු දේපළ, පිරියත සහ උපකරණ එක් එක් පන්තිය සඳහා ය. වෙන් වෙන්ව සමුච්චිත ක්ෂය සහ හානිකරණ අඩුකළ පසු පිරිවැයට ගෙනයන ආයෝජන දේපළ සඳහා පහත දැක්වෙන හෙළිදරව් කිරීම් කළ යුතුය.

(අ) ......

(ඉ) පහත දැක්වෙන වෙන්වෙන්ව පෙන්නුම් කෙරෙන අයුරින් වාර්තාකරන කාලපරිච්ඡේදය ආරම්භයෙහිත් අවසානයෙහිත් ධාරණ අගය සැසඳීමත්

(i) ....................

(iv) 17.15 ආ - 17.15 ඈ ඡේදයන් යටතේ ප්‍රත්‍යාගණනයන්ගේ ප්‍රතිඵලයන් වන වැඩිවීම් හෝ අඩුවීම් සහ 27 වන කොටස ප්‍රකාරව අනිකුත් විස්තීරණ ආදායම් හි හැඳින්වූ හෝ ප්‍රතිවර්තනය කරන ලද හානිකරණ අලාභයන්

(iv) ලාභයෙහි හෝ අලාභයෙහි සාධාරණ අගයට ගෙනයන ~~අගයෙහි විශ්වාසනීය මිණුමක් ඇත්තේ නම්~~ ආයෝජන වත්කම් වලට මාරුකිරීම් (16.8 ඡේදය බලන්න.)

(vi) .......................

17.32 අස්තිත්වය විසින් පහත සඳහන් දෑ ද හෙළිදරව් කළ යුතුය.

(අ) ........

(ඈ) අස්තිත්වයකට, අනවශ්‍ය පිරිවැයක් හෝ ප්‍රයත්නයක් නොමැතිව විශ්වාසනීය ලෙස සාධාරණ අගය මිණුම්කරණය කළ නොහැකි ආයෝජන දේපල තිබේනම්, එය ඒ බව සහ එම ආයෝජන දේපළ අයිතමයන් සඳහා සාධාරණ අගය මිණුම්කරණයට අනවශ්‍ය පිරිවැය හෝ ප්‍රයත්නයක් දැරීමට විය හැකි හේතූන් හෙළිදරව් කළ යුතුය.

17.33 දේපළ, පිරියත සහ උපකරණ අයිතමයන් ප්‍රත්‍යාගණන අගය මත ප්‍රකාශ කෙරේ නම්, පහත සඳහන් දෑ හෙළිදරව් කළ යුතුය.

(අ) ප්‍රත්‍යාගණනය බලාත්මක වූ දිනය,

(ආ) ස්වාධීන තක්සේරුකරුවෙකු සම්බන්ධ වූවේද,

(ආ) සාධාරණ අගයේ අයිතමයන් ඇස්තමේන්තු කිරීමේ දී භාවිතා කළ ක්‍රමයන් හා වැදගත් උපකල්පනයන්

(ඈ) සෑම ප්‍රත්‍යාගණනය කරන ලද දේපළ, පිරියත සහ උපකරණ පන්තියක් සඳහා එම වත්කම පිරිවැය ආකෘතිය මත ගෙන ගියේ නම්, හඳුන්වනු ලබන ධාරණ අගය, සහ

(ඉ) කාලපරිච්ඡේදය සඳහා වෙනස්වීම් සහ ශේෂය කොටස් හිමියන්ට බෙදා හැරිමට එරෙහිව ඇති බාධකයන් පෙන්වමින් ප්‍රත්‍යාගණන අතිරික්තය

## 18 වැනි කොටසට සංශෝධනයන් කීර්තිනාමය හැර අනිකුත් අස්පෘශ්‍ය වත්කම්

18.8 සහ 18.20 ඡේදයන් සංශෝධනය කර ඇත. ඉවත් කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**ව්‍යාපාර සංයෝජනයක කොටසක් ලෙස අත්පත් කර ගැනීම**

18.8 **ව්‍යාපාර සංයෝජනයකදී** අත්පත් කරගනු ලබන අස්පෘශ්‍ය වත්කමක් එහි සාධාරණ අගය ~~සෑහෙන තරම් විශ්වාසනීය ලෙස මිනුම් කළ හැකි බැවින්~~, අත්පත් කර ගැනීමේ දිනයේදී අනවශ්‍ය පිරිවැය හෝ ප්‍රයත්නයක් නොදරා විශ්වාසනීය ලෙස මිනුම් කළ නොහැකි වන්නේ නම් හැර වත්කමක් ලෙස හඳුනාගනු ලබයි. ~~කෙසේ වුවද, ව්‍යාපාර සංයෝජනයකදී අත්පත්කරගත් අස්පෘශ්‍ය වත්කමක් එය නෛතික ගිවිසුම් ගත අයිතීන් කෙරෙන් පැනනගින වීම එහි සාධාරණ අගය විශ්වාසදායී ලෙස මැනිය නොහැකි නිසා එක්කෝ වත්කම~~

~~(අ) කීර්තිනාමයෙන් වෙන්කළ නොහැකි විම, හෝ~~

~~(ආ) කීර්තිනාමයෙන් වෙන්කළ හැකි වුවද, එයට සමාන වත්කම්වලට ඉතිහාසයක් හෝ හුවමාරු ගණුදෙනු~~

**ප්‍රයෝජනවත් ජීවිතකාලය මත ක්‍රමක්ෂය**

18.20 විශ්වාස කළ හැකි අයුරින් අස්පෘශ්‍ය වත්කමක ප්‍රයෝජනවත් ජීවිතකාලය ~~ඇස්තමේන්තු කිරීමට අස්තිත්වයකට~~ විශ්වාසදායී ලෙස ස්ථාපනය කළ නොහැකිනම්, ජීවිතකාලය හොඳම කළමනාකාරිත්වයේ ඇස්තමේන්තුන් මත නිශ්චය කෙරේ යැයි උපකල්පනය කළයුතු නමුත් එය වර්ෂ දහයක් ඉක්මවිය යුතු නැත.

## 19 වැනි කොටසට සංශෝධනයන් ව්‍යාපාර සංයෝජන සහ කීර්තිනාමය

19.2, 19.11, 19.14 - 19.15, 19.23 සහ 19.25 - 19.26 ඡේදයන් සංශෝධනය කර ඇත. ඉවත්කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**මෙම කොටසේ විෂය පථය**

19.2 පහත සඳහන් අවස්ථා හැර, අනෙකුත් සියළුම ව්‍යාපාර සංයෝජනවල ගිණුම්කරණය මේ කොටසින් විශේෂයෙන් සඳහන් කෙරේ.

(අ) පොදු **පාලනය** යටතේ අස්තිත්වයන් හෝ **ව්‍යාපාර** සංයෝජනය, සංයෝජනය කරනු ලබන සියළුම අස්තිත්වයන් හෝ ව්‍යාපාර ව්‍යාපාර සංයෝජනය වීමට පෙරත් ඊට පසුවත් අවසානයේදී එකම පාර්ශවයක් හෝ පාර්ශවයන් මඟින් පාලනය කරනු ලැබීමත්, පාලනය අස්ථිර නොවීමත්, පොදු පාලනය යනුවෙන් අදහස් කෙරෙයි.

(ආ) .......

**ව්‍යාපාර සංයෝජනයක පිරිවැය**

19.11 අත්පත් කරගන්නා විසින් ව්‍යාපාර සංයෝජනයෙහි පිරිවැය පහත දැක්වෙන දෑ වල සමුච්චිතයට මැනිය යුතුය.

(අ) අත්පත් කරගැනීමට භාජනය වනු ලබන්නාගේ පාලනයට ~~හුවමාරුවට~~ අත්පත් කරගැනීමට අත්පත් කරගන්නා විසින් දෙන ලද වත්කම්, දරන ලද හෝ පවරගත් වගකීම් සහ නිකුත්කරන ලද ස්කන්ධ උපකරණවල හුවමාරුව සිදුවන දිනට සාධාරණ අගය එකතු කළ,

(ආ) .......

**ව්‍යාපාර සංයෝජනයක පිරිවැය අත්පත්කරගත් වත්කම් සහ වගකීම්වලටත් පවරාගත් අසම්භාව්‍ය වගකීම් වලටත් වෙන් කිරීම.**

19.14 පහත සඳහන් අවස්ථාවන්හිදී හැර අත්පත් කරගන්නා දිනට අත්පත් කරගන්නා විසින් අත්පත්කර ගැනීමට භාජනයවන්නාගේ හඳුනාගත හැකි වත්කම් සහ වගකීම්ද 19.~~20~~ 15 ඡේදයෙහි හඳුනාගැනීමේ නිර්ණායක සපුරාලන අසම්භාව්‍ය වගකීම් සඳහා ප්‍රතිපාදන ද හඳුනාගෙන ව්‍යාපාර සංයෝජනයක පිරිවැය එදිනට සාධාරණ අගයට වෙන්කළ යුතුය.

(අ) ව්‍යාපාර සංයෝජනයකදී අත්පත්කරගන්නා ලද වත්කම් සහ භාරගන්නා ලද වගකීම් කෙරෙහි උද්ගතවන විලම්භිත බදු වත්කමක් හෝ වගකීමක් 29 වන කොටස ආදායම් බදු ප්‍රකාරව හඳුනාගැනීම සහ මිණුම්කරණය කළ යුතුය.

(ආ) අත්පත් කර ගනු ලබන්නාගේ සේවා නියුක්ති ප්‍රතිලාභයන් හා සබැඳි, වගකීමක් හෝ (වත්කමක් තිබේ නම්) 28 වන කොටස සේවා නියුක්ති ප්‍රතිලාභයන් ප්‍රකාරව හඳුනාගැනීම සහ මිණුම්කරණය කළ යුතුය.

ව්‍යාපාර සංයෝජනයෙහි පිරිවැය සහ එසේ හඳුනාගන්නා ලද අත්පත් කර ගනු ලබන්නාගේ හඳුනාගත හැකි වත්කම්, වගකීම් හා අසම්භාව්‍ය වගකීම් වෙනුවෙන් ප්‍රතිපාදන අතර කිසියම් වෙනසක් 19.22 - 19.24 ඡේද වලට අනුව (කීර්තිනාමය ලෙස හෝ ඍණ කීර්තිනාමය ලෙස) ගිණුම්ගත කළ යුතුය. අත්පත්කර ගැනීමට භාජනයවන්නාගේ **පාලනයට අයත් නොවන ඇල්මක්** ඇතොත්, අත්පත් කර ගැනීමට භාජනයවන්නාගේ හඳුනාගත හැකි ශුද්ධ වත්කම් වල හඳුනාගත් කොටසට ප්‍රතිප්‍රමාණානුකූලව මිණුම්කරණය කළ යුතුය.

19.15 අත්පත් කර ගැනීමට භාජනයවන්නාගේ අත්පත් කරගනු ලබන දිනට හඳුනාගත හැකි වත්කම්, වගකීම් හා අසම්භාව්‍ය වගකීම් අත්පත් කරගන්නා විසින් වෙන් කොට හඳුනාගත යුත්තේ, ඒවා එම දිනට පහත දැක්වෙන නිර්ණායක සපුරා ලන්නේ නම් පමණකි.

(අ) ......

(ඇ) අස්පෘශ්‍ය වත්කමක් ~~හෝ අසම්භාව්‍ය වගකීමක්~~ සම්බන්ධයෙන්, එහි සාධාරණ අගය, අනවශ්‍ය පිරිවැය හෝ ප්‍රයත්නයක් නොදරා විශ්වාසදායක ලෙස මැණිය හැකිවීම.

(ඈ) අසම්භාව්‍ය වගකීමක් සම්බන්ධයෙන් එහි සාධාරණ අගය විශ්වාසදායක ලෙස මැණිය හැකිවීම.

**කීර්තිනාමය**

19.23 ආරම්භක හඳුනාගැනීමෙන් පසුව, පවරා ගන්නා විසින් ව්‍යාපාර සංයෝජනයකදී පවරාගනු ලබන කීර්තිනාමය මැනිය යුත්තේ පිරිවැයෙන් සමුච්චිත **ක්‍රමක්ෂය** සහ සමුච්චිත **හානිකරණ** අලාභ අඩුකළ පසුවය.

(අ) කීර්තිනාමය ක්‍රමක්ෂය කිරිමේදී අස්තිත්වයක් විසින් 18.19 - 18.24 ඡේදවල මූලධර්ම අනුගමනය කළ යුතුය. කීර්තිනාමයෙහි ප්‍රයෝජනවත් ජීවිතකාලය විශ්වාසනීය ලෙස ~~ඇස්තමේන්තු~~ ස්ථාපනය කළ නොහැකි නම්, එහි ජීවිත කාලය, කළමනාකාරිත්වයේ හොඳම ඇස්තමේන්තුව පදනම් කරගෙන නිශ්චය කළයුතු වුවත්, එය වර්ෂ දහයක් නොඉක්මවිය යුතුය. ~~අනුමාන කරනු ලබයි.~~

(ආ) ......

**වාර්තාකරන කාලපරිච්ඡේදය තුළ සිදුකරන ලද ව්‍යාපාර සංයෝජනය(න්) සඳහා**

19.25 කාලපරිච්ඡේදය තුල ~~සිදුකරන ලද~~ සෑම ව්‍යාපාර සංයෝජනයක් වෙනුවෙන් අත්පත්කරගන්නා විසින් පහත සඳහන් දෑ හෙළිදරව් කළ යුතුය.

(අ) .......

(උ) අත්පත්කරගනු ලබන්නා ලබන්නාගේ අත්පත්කරගන්නාගේ සංයෝජන මෙහෙයුම් වලින් අපේක්ෂිත උපච්ඡේදයන් හෝ 19.15 ඡේදය අනුව, හඳුනා නොගන්නා ලද, අස්පෘශ්‍ය වත්කම් හෝ අනිකුත් අයිතමයන් වැනි හඳුනාගන්නා ලද කීර්තිනාමය සෑදී ඇති කරුණු පිළිබඳ ගුණාත්මක විස්තරයක්

**සියළුම ව්‍යාපාර සංයෝජනයන් වෙනුවෙන්**

19.26 අත්පත් කර ගන්නෙකු විසින් වාර්තාකරනු ලබන කාලපරිච්ඡේදය ආරම්භයෙහිත් අවසානයෙහිත් කීර්තිනාමයෙහි ප්‍රයෝජනවත් කාලයන් සහ ධාරණ අගයන්හි සැසඳීමක් පහත සඳහන් දෑ වෙන වෙනම පෙන්නුම් කරමින් හෙළිදරව් කළ යුතුය.

(අ) .......

## 20 කොටසට සංශෝධනයන් කල්බදු

20.1 සහ 20.3 ඡේදයන් සංශෝධනය කර ඇත. ඉවත්කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**මෙම කොටසෙහි විෂය පථය**

20.1 පහත සඳහන් දෑ හැර සියළුම **කල්බදු** ගිණුම්කරණය මේ කොටසින් ආවරණය වෙයි.

(අ) .......

(ඉ) කල්බදු වත්කමෙහි මිල වෙනස්වීම්, විදේශ විනිමය අනුපාතික වෙනස්වීම්, විචල්‍ය වෙළඳපොල, පොලී අනුපාතිකයන් පදනම් වන කල්බදු ගෙවීම්වල වෙනස්වීම් හෝ ප්‍රතිපාර්ශ්වකරුවන්ගෙන් එක් පාර්ශවයක පැහැර හැරීමක් කෙරෙහි වෙනස්වීම් වලට අදාල නොවන ගිවිසුම් කොන්දේසි නිසා කල්බදු දීමනාකරුට හෝ කල්බදු ගැණුම්කරුට අලාභ විදීමට සිදුවන කල්බදු (12.3 (ඊ) ඡේදය බලන්න.)

(ඊ) ............

20.3 සමහර බැහැරින් ලබාගැනීමට දුරකථන කොන්ත්‍රාත්තුවක් වැනි, පරිමා පරිහරණ අයිතිය සැපයෙන වැඩ පිළිවෙලවල් සහ ගැණුම් හෝ ගෙවීම් කොන්ත්‍රාත්තු වැනි නීතිමය වශයෙන් කල්බඳු ස්වරූපය නොගන්නා නමුත් මුදලින් ගෙවීමෙක් වෙනුවෙන් වත්කම් පාවිච්චි කිරීමේ අයිතිය පැවරෙයි. එවැනි වැඩ පිළිවෙලවල් හරයක් වශයෙන් වත්කම් කල්බදු කිරීමක් වනුයෙන් මෙම කොටස යටතේ ගිණුම් ගත කළ යුතුමය.

## 21 වැනි කොටසට සංශෝධනයන්, ප්‍රතිපාදන සහ අසම්භාව්‍යතා

21.6 ඡේදය සංශෝධනය කර ඇත. ඉවත් කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

### අසම්භාව්‍ය වත්කම් පිළිබඳ හෙළිදරව් කිරීම්

21.16 ආර්ථික ප්‍රතිලාභ ගලාඒමක් (එසේ නොවීමට වඩා අපේක්ෂා කළ හැකි වීමක්) වන්නේ වුවද ඇත්ත වශයෙන්ම එසේ නිගමනය කළ නොහැකිවීම අස්තිත්වය විසින් **වාර්තාකරන ලද කාලපරිච්ඡේදය** අවසානයට අසම්භාව්‍ය වත්කම්වල ස්වභාවය විස්තරාත්මකව හෙළිදරව් කළයුතු අතර, ~~ප්‍රයෝගික වන විට~~ අනවශ්‍ය පිරිවැයක් හෝ වියදමක් දැරීමකින් තොරව 21.7 -21.11 ඡේදවල දක්වා ඇති මූලධර්මවලට අනුකූලව ගිණුම් කළ ඒවායෙහි මූල්‍ය බලපෑම් වල ඇස්තමේන්තුවක් ද ඉදිරිපත් කළ යුතුය. ~~මෙම හෙළිදරව් කිරීම ප්‍රායෝගික නොවන විට~~ එවැනි ඇස්තමේන්තුවක් සඳහා අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් ඇත්නම් අස්තිත්වය ඒ බවද, ඇස්තමේන්තු කිරීමට අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් දැරීමට විය හැකි හේතුන්ද හෙළිදරව් කළ යුතුය. ~~ඒ බව සඳහන් කළ යුතුය.~~

## 22 කොටසට සංශෝධනයන්, වගකීම් හා ස්කන්ධය

22.8 - 22.9, 22.15 සහ 22.17 - 22.18 ඡේදයන් සංශෝධනය කර ඇත. 22.3 අ, 22.15 අ - 22.15 ඇ සහ ඒවායේ ශීර්ෂ පාඨයන් 22.18 අ - 22.18 ආ සහ 22.20 සහ ඒවායේ ශීර්ෂ පාඨයන් එකතු කර ඇත. ඉවත් කර ඇති පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

### සාධන පත්‍රයක් වගකීම් හෝ ස්කන්ධයන් ලෙස වර්ගීකරණය

22.3 අ. ගිවිසුම් වැඩ පිළිවෙලක නීතිමය ආකෘතිය අනුවම නොව, ගිවිසුමේ හරයට අනුකූලව සහ මූල්‍ය වගකීමක සහ ස්කන්ධයක නිර්වචනයට අනුකූලව අස්තිත්වයක් විසින් මූල්‍ය සාධනපත්‍ර වර්ගීකරණය කළ යුතුය. ගිවිසුම් බන්ධනයක් නිරාකරණය කිරීම සඳහා මුදල් හෝ වෙනත් මූල්‍ය වත්කම් දීමෙන් වැලකී සිටීමේ කොන්දේසි විරහිත අයිතියක් නොතිබේ නම් හැර, එම බැඳීම මූල්‍ය වගකීමක නිර්වචනය සපුරාලන අතර, 22.4 ඡේදයට අනුකූලව ස්කන්ධ සාධනපත්‍ර ලෙස වර්ගීකරණය කරන ලද සාධනපත්‍රයන් හැර අස්තිත්වය විසින් එසේ වර්ගීකරණය කළ යුතුය.

### කොටස් හෝ වෙනත් ස්කන්ධ සාධනපත්‍ර මුල්වතාවට නිකුත් කිරීම

22.8 අස්තිත්වයක්, ව්‍යාපාර සංයෝජනයක කොටසක් වශයෙන් නිකුත්කරන ලද හෝ 22.15 අ - 22.15 ආ ඡේද ප්‍රකාරව ගිණුම්ගත කරනු ලබන ස්කන්ධ සාධනපත්‍ර මැනිය යුත්තේ ලැබූ සහ ලැබිය යුතු මුදල් හෝ අනිකුත් සම්පත් වල සාධාරණ වටිනාකමෙන් ~~ස්කන්ධ සාධනපත්‍ර නිකුත් කිරීම සඳහා වැය වූ සෘජු~~ **ගණුදෙනු පිරිවැය** අඩු කිරීමෙනි. ගෙවීම් විලම්භනය කර ඇති අවස්ථාවක මුදලේ කාල අගය ප්‍රමාණාත්මක වූ විට මූලික මැනීම විය යුත්තේ **වර්තමාන අගය** පදනම මතය.

22.9 අස්තිත්වයක් විසින් ස්කන්ධ ගණුදෙනුවේ ගණුදෙනු පිරිවැය ස්කන්ධයෙන් අඩු කොට ~~එසට අදාල ආදායම් බදු ප්‍රතිලාභය ගලපා~~ ගිණුම්ගත කළ යුතුය. ගණුදෙනු පිරිවැයට අදාළ ආදායම් බද්ද, 29 වන කොටස ආදායම් බදු ප්‍රකාරව ගිණුම් ගත කළ යුතුය.

### පරිවර්ත්‍ය ණය හෝ ඒ හා සමාන සංයුක්ත මූල්‍ය සාධන පත්‍ර

22.15 සාධනපත්‍ර නිකුත් කිරීමෙන් පසු කාලපරිච්ඡේදවලදී අස්තිත්වය විසින් වගකීම් සංරචකය පහත දැක්වෙන අයුරු ගිණුම් ගත කළ යුතුය.

(අ) වගකීම් සංචරකය 11.9 ඡේදයේ කොන්දේසි සපුරාලන්නේ නම්, 11 කොටස මූලික මූල්‍ය සාධනපත්‍ර ප්‍රකාරව, මෙම අවස්ථාවලදී, අස්තිත්වය **සඵල පොලීක්‍රමය** භාවිතාකරමින් වගකීම් සංචරක සහ පරිනතවීමේදී ගෙවිය යුතු මුල් මුදල අතර කිසියම් වෙනසක් අතිරේක පොලී වියදමක් ලෙස ක්‍රමානුකූලව හඳුනාගත යුතුය. (11.15 - 11.20 ඡේද බලන්න.) මෙම කොටසට වන පරිශිෂ්ඨයේ, වගකීම් සංචරකය 11.9 ඡේදයේ කොන්දේසින් සපුරාලන විට, පරිවර්ත්‍ය ණය නිකුත්කරන්නා ගිණුම්කරණ ආකාරය පිළිබඳ නිදර්ශන දැක්වේ.

(ආ) වගකීම් සංචරකය 11.9 ඡේදයේ කොන්දේසි සපුරාලන්නේ නැත්නම්, 12 කොටස වන අනිකුත් මූල්‍ය සාධනපත්‍ර අනුකූලව

**ස්කන්ධ උපකරණයන් සමග මූලය වගකීම් ශූන්‍ය කිරීම**

22.15 අ. අස්තිත්වයක් ණයහිමියකු සමඟ මූල්‍ය වගකිම් මත කොන්දේසි නැවත සාකච්ඡා කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, වගකීම අස්තිත්වය ණයහිමියාට ස්කන්ධ සාධනපත්‍ර නිකුත් කිරීමෙන් සහමුලින් හෝ අර්ධ වශයෙන් ශූන්‍ය කර ගනු ඇත. ස්කන්ධ සාධන පත්‍ර නිකුත් කිරීම 11.38 ඡේදය ප්‍රකාරව ප්‍රතිශ්ඨාවක් වනු ඇත. අස්තිත්වය නිකුත්කරන ලද ස්කන්ධ සාධනපත්‍ර ඒවායේ සාධාරණ අගය මත මිණුම්කරණය කළ යුතුය. කෙසේ වෙනත් නිකුත්කරන ලද ස්කන්ධ සාධනපත්‍රයන්ගේ සාධාරණ අගය අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් නොදරා විශ්වාසනීය ලෙස මිණුම්කරණය කළ නොහැකි නම්, ස්කන්ධ සාධනපත්‍රයන් ශූන්‍ය කරන ලද මූල්‍ය වගකීමේ සාධාරණ අගය මත මිණුම්කරණය කළ යුතුය. 11.36 - 11.38 ඡේදයන් ප්‍රකාරව, අස්තිත්වය මූල්‍ය වගකීම හෝ මූල්‍ය වගකීමේ කොටස හඳුනාගැනීමෙන් ඉවත් කළ යුතුය.

22.15 ආ. ගෙවන ලද ප්‍රතිශ්ඨාවේ කොටසක් වගකීමේ ඉතිරි කොටසේ කොන්දේසි වෙනස් කිරීමක් වන්නේ නම් අස්තිත්වය ගෙවන ලද ප්‍රතිශ්ඨාව වගකීමේ ශූන්‍ය කරන ලද කොටස හා ගෙවීමට ඇති ඉතිරි කොටස අතර වෙන්කළ යුතුය. මෙම වෙන්කිරීම සාධාරණ පදනමක් මත විය යුතුය. වගකීමේ ඉතිරි කොටස ප්‍රමාණාත්මක ලෙස වෙන්ස්කර තිබේ නම්, අස්තිත්වය විසින් වෙනස් කිරීම 11.37 ඡේදය අනුව වගකීම වෙනස් කිරීම ශූන්‍ය කිරීමක් හා නව වගකීමක් හඳුනාගැනීමක් ලෙස ගිණුම්කරණය කළ යුතුය.

22.15 ඇ. 22.15 අ - 22.15 ආ ඡේදයන් පහත තත්වයන් යටතේ වන ගණුදෙනු සඳහා අස්තිත්වයක් විසින් භාවිතා නොකළ යුතුය.

(අ) ණයහිමියා සෘජු හෝ වක්‍ර කොටස් හිමියකු වන අතර සෘජු හෝ වක්‍ර කොටස් හිමියෙකුගේ තත්වයෙන් කටයුතු කිරීම

(ආ) ණයහිමියා සහ අස්තිත්වය ගණුදෙනුවට පෙර හා පසුව එකම පාර්ශවය හෝ පාර්ශවයන් විසින් පාලනය කරනු ලබන්නේ නම් සහ ගණුදෙනුවේ හරය ලෙස ස්කන්ධ විභාජනයක් හෝ ස්කන්ධයට දායකත්වයක් ඇතුලත් වීම.

(ඇ) මූල්‍ය වගකීමේ ආරම්භක කොන්දේසිවලට අනුකූලව ස්කන්ධයන් නිකුත් කිරීමෙන් මූල්‍ය වගකීම ශූන්‍ය කෙරේ නම්, (22.13 - 22.15 ඡේදයන් බලන්න.)

**අයිතිකරුවන්ට බෙදාහැරීම**

22.17 අස්තිත්වයක් එහි අයිතිකරුවන්ට (එහි ස්කන්ධ සාධනයන් දරන්නන්ට) කරන බෙදාහැරීම් ~~ආදායම් බදු ප්‍රතිලාභ ගැලවීමෙන් පසු~~ ස්කන්ධයෙන් අඩුකළ යුතුය. ~~ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද සම්බන්ධව ගිණුම්කරණ ආකාරය පිළිබඳ උපදේශන 29.26 ඡේදය යටතේ ලබාදී ඇත.~~ අයිතිකරුවන්ට බෙදාහැරීම් සම්බන්ධයෙන් වන ආදායම් බද්ද 29 වන කොටස ප්‍රකාරව ගිණුම් ගතකළ යුතුය.

22.18 ඇතැම් විට මුදල් වෙනුවට වත්කම් අස්තිත්වයක් ~~ලාභාංශ වශයෙන්~~, අයිතිකරුවන්ට බෙදාහැරීම් (මුදල් - නොවන බෙදාහැරීම්) කරනු ලැබේ. එවන් බෙදාහැරීමක් අස්තිත්වය ප්‍රකාශයට පත්කළ විට, සහ මුදල් නොවන වත්කම් අයිතිකරුවන්ට බෙදාහැරීමට බැඳීමක් ඇතිවිට එය වගකීමක් ලෙස හඳුනාගත යුතුය. 22.18 අ ඡේදයෙහි කොන්දේසි නොසපුරන්නේ නම්, බෙදා හැරීමට නියමිත වත්කම්වල සාධාරණ අගය මත වගකීම වාර්තා කළ යුතුය. සෑම **වාර්තාකරන කාලපරිච්ඡේදයක්** අවසානයේදී සහ නිරවුල් කරන ලද දින බෙදාහරින ලද වටිනාකමට කරන ගැලපුමක් ලෙස සලකා ස්කන්ධයේ සිදුවූ යම් හඳුනාගත් වෙනස්වීම් සමඟ අස්තිත්වය සමාලෝචනය කර ගෙවිය යුතු ලාභාංශවල ධාරණ අගය බෙදාහැරිය යුතු වත්කම්වල සාධාරණ අගයේ වෙනස්වීම පිළිබිඹුවීමට ගැලපිය යුතුය. අස්තිත්වය ගෙවිය යුතු ලාභාංශ නිරවුල් කරන විට, බෙදාහරින ලද වත්කම් වල ධාරණ අගයේ සහ ගෙවිය යුතු ලාභාංශවල ධාරණ අගයේ ඇති වෙනසක් ලාභයේ හෝ අලාභයෙහි හඳුනාගත යුතුය.

22.18 අ. බෙදාහරින වත්කම්වල සාධාරණ අගය, අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් නොදරා විශ්වාසදායී ලෙස මැනිය නොහැකි නම්, වගකීම බෙදාහරින වත්කම් වල ධාරණ අගය මත මිණුම්කරණය කළ යුතුය. නිරවුල් කිරීමට පෙරාතුව බෙදාහරින වත්කම්වල සාධාරණ අගය අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් නොදරා විශ්වාසදායී ලෙස මැනිය හැකි නම්, වගකීම බෙදාහරින වටිනාකමට, අනුරූප ගැලපීමක් සහිතව සාධාරණ අගය මත ප්‍රතිමිණුම්කරණය සහ 22.18 ඡේදය ප්‍රකාරව ගිණුම්ගත කිරීම කෙරේ.

22.18 ආ. එකම පාර්ශවය හෝ පාර්ශවයන් විසින් බෙදාහැරීමට පෙර හා පසුව අවසාන වශයෙන් පාලනය කරනු ලබන, මුල්‍ය නොවන බෙදාහැරීමක් සඳහා 22.18 - 22.18 අ ඡේදයන් අදාල නොවේ. මෙම ව්‍යතිරේඛය බෙදාහැරීම කරන අස්තිත්වයක වෙන් වශයෙන් වන, තනි සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ වේ.

**හෙළිදරව් කිරීම**

22.20 22.18 - 22.18 අ ඡේද ප්‍රකාරව බෙදාහරිනු ලබන වත්කමක සාධාරණ අගය අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් නොදරා විශ්වාසදායී ලෙස මැනිය නොහැකි නම් අස්තිත්වය ඒබව සහ විශ්වාසදායී සාධාරණ අගය මිණුම්කරණයක් සඳහා අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් දැරීමට විය හැකි හේතූන් හෙළිදරව් කළ යුතුය.

## 26 වැනි කොටසට සංශෝධනයන් කොටස් පදනම් ගෙවීම්

26.1, 26.9, 26.12, 26.16 - 26.17 සහ 26.22 ඡේදයන් සහ ඒවායේ සබැඳි ශීර්ෂ පාඨයන් සංශෝධනය කර ඇත. 26.1 අ - 26.1 ආ ඡේදයන් එකතුකර ඇත. ඉවත්කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**මෙම කොටසෙහි විෂය පථය**

26.1 ස්කන්ධ වලින් හෝ මුදලින් නිරවුල් කෙරෙන හෝ වැඩ පිළිවෙලහි කොන්දේසි අනුව අස්තිත්වයට ගණුදෙනුව මුදලින් (හෝ අනෙකුත් වත්කම් වලින්) හෝ ස්කන්ධ සාධනයන් නිකුත් කිරීමෙන් නිරවුල් කළ හැකිවීමේ තේරීමක් ඇති ඒවාද ඇතුළත්ව සියළුම **කොටස් පදනම් කරගත් ගණුදෙනු** ගිණුම්කරණය මෙම කොටසින් විශේෂයෙන් සඳහන් කරනු ලබයි.

~~(අ) අස්තිත්වයේ ස්කන්ධ සාධන පත්‍ර (කොටස් හෝ කොටස් විකල්ප ඇතුළුව) සඳහා ප්‍රතිශ්‍යාව ලෙස අස්තිත්වයට භාණ්ඩ හෝ සේවා අත්පත් කරගන්නා ස්කන්ධවලින් නිරවුල් කරන කොටස් පදනමේ ගෙවීම් ගණුදෙනු, සහ~~

~~(ආ) අස්තිත්වයේ කොටස් හෝ අස්තිත්වයේ වෙනත් ස්කන්ධ සාධනපත්‍රවල මිල ගණන් හෝ වටිනාකම පදනම් කරගත් මිල ගණන් මත ගෙවීම් කිරීම සඳහා භාණ්ඩ හෝ සේවා සැපයුම්කරුවන්ට වගකීමක් ඇතිවන සේ අස්තිත්වය භාණ්ඩ හෝ සේවා මිලදී ගැනීමක් සිදුවන මුදලින් නිරවුල් කරන කොටස් පදනම් ගෙවීම් ගණුදෙනු, සහ~~

~~(ඇ) වැඩ පිළිවෙලේ කොන්දේසි අනුව අස්තිත්වයට භාණ්ඩ හෝ සේවා සැපයුම්කරුට ගණුදෙනුව මුදලින් නිරවුල් කරනවාද (නොවෙනස් වත්කම්) එසේ නැත්නම් ස්කන්ධ සාධන පත්‍ර නිකුත් කිරීම මගින් නිරවුල් කරන්නේද යන්න තෝරා ගැනීමට ඉඩ සලසන ආකාරයට අස්තිත්වයට භාණ්ඩ හෝ සේවා ලැබීමේ හෝ අත්පත් කර ගැනීමේ ගණුදෙනු~~

26.1 අ. කොටස් පදනම් ගෙවීමේ ගණුදෙනුවක් සමූහයේ වෙනත් අස්තිත්වයක් (හෝ සමූහයේ ඕනෑම අස්තිත්වයක කොටස් හිමියකු) විසින් භාණ්ඩ හෝ සේවාවන් ලබා ගන්නා අස්තිත්වය වෙනුවෙන් නිරවුල් කළ හැකිය. මෙම කොටස එසේම

(අ) එම සමූහයේ වෙනත් අස්තිත්වයක් (හෝ සමූහයේ ඕනෑම අස්තිත්වයක කොටස්හිමියකු) විසින් කොටස් පදනම් ගෙවීමේ ගණුදෙනුවක් නිරවුල් කිරීමට බැඳී ඇති භාණ්ඩ හෝ සේවාවන් ලබා ගන්නා, හෝ

(ආ) සමූහයේ වෙනත් අස්තිත්වයක් විසින් භාණ්ඩ හෝ සේවාවන් ලබාගන්නා විටදී ගණුදෙනුව අස්තිත්වයට සපයන ලද භාණ්ඩ හෝ සේවාවන් සඳහා පැහැදිලිවම ගෙවීමක් නොවන අරමුණක් සඳහා නොවේ නම්, කොටස් පදනම් ගෙවීමේ ගණුදෙනුවක් නිරවුල් කිරීමට බැඳීමක් ඇති අස්තිත්වයකටද අදාල වේ.

26.1 ආ. නිශ්චිතව හඳුනාගත නොහැකි භාණ්ඩ හෝ සේවාවන් නොමැති විටකද භාණ්ඩ හෝ සේවාවන් ලැබුණ (හෝ ලැබෙන) බව අනිකුත් කරුණු වලින් පෙන්නුම් කෙරෙන විටකදී මෙම කොටස අදාල වේ. (26.17 ඡේදය බලන්න.)

**මිණුම් කිරීම් මූලධර්ම**

26.9 ස්කන්ධ උපකරණ ප්‍රදානය සේවකයින් සේවය හෝ කාර්ය සාධනය සම්බන්ධයෙන් නියමිත **පවරා ගැනීමේ කොන්දේසි** සපුරාලීමට යටත්ව සිදුවිය හැකිය. උදාහරණයක් වශයෙන් සේවකයකුට ප්‍රදානය කරනු ලබන කොටස් හෝ කොටස් විකල්ප, කිසියම් නිශ්චිත කාලපරිච්ඡේදයක් සේවකයා අස්තිත්වයේ සේවයේ නිරත විය යුතුවීමේ දර්ශීය කොන්දේසියට යටත්වීම සේවය සම්බන්ධයෙන් නියමිත පවරා ගැනීමේ කොන්දේසියකට උදාහරණයකි. අස්තිත්වය විශේෂිත ලාභ වර්ධනයක් (වෙළඳපල නොවන හිමිකම් ලැබීමේ කොන්දේසියක්) සපුරා ගැනීම හෝ අස්තිත්වයේ කොටස් මිලෙහි **(වෙළඳපල හිමිකම් ලැබීමේ කොන්දේසියක්)** විශේෂිත වර්ධනයක් වැනි කාර්ය සාධනයන් තෘප්ත කිරීමේ කොන්දේසි තිබිය හැකිය. කාර්ය සාධනයන් සම්බන්ධයෙන් නියමිත පවරා ගැනීමේ කොන්දේසිවලට උදාහරණයන්ය. පවරා ගැනීමේ කොන්දේසින් පහත දැක්වෙන අයුරින් ගිණුම්කරණය කරනු ලැබේ.

(අ) පැවරීමට අපෙක්ෂා කරන ස්කන්ධ සාධනපත්‍ර සංඛ්‍යාව ඇස්තමේන්තු කිරිමේදී සාකල්‍යයෙන්ම සේවක සේවාවට හෝ වෙළඳපල නොවන කාර්ය සාධක කොන්දේසිවලට අදාලවන සියළුම පැවරීමේ කොන්දේසි සැලකිල්ලට ගත යුතුය. අනතුරුව අවශ්‍යවන්නේ නම් නවතම තොරතුරු වලට අනුව පැවරීමට ඇස්තමේන්තු කරනු ලැබ ඇති ස්කන්ධ ඒකක සංඛ්‍යාව කලින් ඇස්තමේන්තුවෙන් වෙනස්වන්නේ නම් අස්තිත්වය එම ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කළ යුතුය. පැවරීම සිදුකරන දින දි අස්තිත්වය අවසානයේදී පවරනු ලබන ස්කන්ධ සාධන පත්‍ර සංඛ්‍යාවට සමාන වන පරිදි ඇස්තමේන්තුව ප්‍රතිශෝධනය කළ යුතුය. සේවක සේවයට හෝ වෙළඳපල නොවන කාර්යසාධන කොන්දේසින් හා සබැඳි පවරා ගැනීම් කොන්දේසි මිණුම්කරණ දිනයේදී කොටස් කොටස් විකල්ප හෝ අනෙකුත් ස්කන්ධ සාධනපත්‍රයන්ගේ සාධාරණ අගය ඇස්තමේන්තු කිරිමේදී සැලකිල්ලට නොගත යුතුය.

(ආ) කොටස් හෝ කොටස් විකල්ප වල හෝ අනෙකුත් ස්කන්ධ සාධන පත්‍රයන්ගේ සාධාරණ අගය, මිණුම් කරනු ලබන දිනට ඇස්තමේන්තු කිරිමේදී අනෙකුත් සියළුම පවරා ගැනීමේ කොන්දේසි සපුරා තිබේනම්, වෙළඳපල හෝ වෙළඳපල නොවන පවරා ගැනීමේ කොන්දේසිවල ප්‍රතිඵලය කුමක් වුවත්, ඇස්තමේන්තු කළ සාධාරණ අගයට පසුව වන ගැලපිළි නොමැතිව සියළුම වෙළඳපල පැවරීම් හෝ නොපැවරීම් කොන්දේසි සැලකිල්ලට ගත යුතුය.

**ස්කන්ධ සාධන පත්‍ර ප්‍රදානය කරනු ලැබූ නියමයන් හා කොන්දේසි විකරණය කිරීම්**

26.12 අස්තිත්වයක් විසින් සේවකයින්ට ප්‍රතිලාභ වන අයුරින් උදාහරණයක් වශයෙන් විකල්පයක ක්‍රියාත්මක මිල අඩු කිරීමෙන්, පැවරුම් කාලය අඩුකිරිමෙන් හෝ කාර්ය සාධන කොන්දේසි ඉවත් කිරීමෙන්, ස්කන්ධ සාධන පත්‍රයන් ප්‍රදානය කිරීමේ නියමයන් සහ පවරා ගැනීමේ කොන්දේසින් විකරණය කළ හැකිය. අනෙක් අතට අස්තිත්වයක් විසින් සේවකයන්ට ප්‍රතිලාභ නොවන අයුරින් උදාහරණ වශයෙන් පැවරුම් කාලය වැඩිකිරිමෙන් හෝ කාර්ය සාධන කොන්දේසියක් එකතු කිරිමෙන්, නියමයන් හා කොන්දේසින් විකරණය කළ හැකිය. අස්තිත්වය විසින් විකරණය කරන ලද කොටස් පදනම් කරගත් ගෙවීම් ගණුදෙනු ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් දෑ සැලකිල්ලට ගත යුතුය.

(ආ) ........

මෙම ඡේදයේ අවශ්‍යතාවයන් දක්වා ඇත්තේ, සේවකයින් සමඟ වන කොටස් පදනම් ගණුදෙනු සම්බන්ධයෙනි. අවශ්‍යතාවයන් සේවකයින් නොවන අනෙකුත් පාර්ශ්වයන් සමඟ වන කොටස් පදනම් ගෙවීම් ගණුදෙනු සඳහාද ඒවා ප්‍රදානය කරන ලද ස්කන්ධ සාධන පත්‍රයන්ගේ සාධාරණ අගයට යොමුකර මිණුම්කරන්නේ වී නමුත් යොමු කරන දිනය, අස්තිත්වයට විසින් භාණ්ඩ ලැබෙන දිනය හෝ ප්‍රතිපාර්ශවය සේවය සපයන දිනයට යොමු වේ නම් අදාල වේ.

**සමූහ සැලසුම්**

26.16 පරිපාලන අස්තිත්වය සමූහයේ එකක් හෝ වැඩිගණනක පරිපාලතයන්හි අස්තිත්වයක් සමූහයේ එක් හෝ වැඩි අස්තිත්වයන්හි සේවකයින්ට කොටස් පදනම් කරගත් ගෙවීම් පිරිනැමීමක් ප්‍රදානය කිරිමක් සහ පරිපාලිතය සමූහය එක්කේ කුඩා සහ මධ්‍ය පරිමාණ අස්තිත්වයන් සඳහා ගිණුම්කරණ ප්‍රමිත හෝ **සම්පූර්ණ SLFRS** භාවිතයෙන් එහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරන්නේ නම්, එවැනි පරිපාලිතයන්ට සමූහ අස්තිත්වයන්ට 26.3 - 26.15 ඡේදයන් ප්‍රකාරව සැකසීමේ විකල්පයක් ලෙස, කොටස් පදනම් කරගත් ගෙවීම් වියදම් (සහ පාලනයේ අදාල ප්‍රග්ධන දායකත්වය) සමූහය වෙනුවෙන් හඳුනාගනු

~~ලබන~~ වියදමෙහි සාධාරණ වෙන්කිරිමේ පදනම් කර ගනිමින් ~~හඳුනාගැනීමට සහ~~ මිණුම් කිරීමට අවසර ලැබෙයි.

**~~රජයේ නිලනියෝග මත සැලසුම්~~ හඳුනා නොගත් භාණ්ඩ හෝ සේවාවන්**

26.17 ලැබී ඇති හඳුනාගත නොහැකි ප්‍රතිශ්ඨාවය ප්‍රදානය කරන ලද ස්කන්ධ සාධනයන්ගේ හෝ දරා ඇති වගකීමේ සාධාරණ අගයට අඩුබව පෙනේ නම්, මෙයින් බොහෝ විට පෙන්නුම් කෙරෙන්නේ අනිකුත් ප්‍රතිශ්ඨාවයන් (එනම් හඳුනානොගත් භාණ්ඩ හෝ සේවාවන්) ලැබී (හෝ ලැබීමට) ඇති බවයි. උදාහරණ වශයෙන් විශේෂිත කොට හඳුනාගත නොහැකි භාණ්ඩ හෝ සේවාවන් සපයා දෙමින් (හෝ ප්‍රදානය කරනු ලබන ස්කන්ධ සාධන පත්‍රවල සාධාරණ අගයට පැහැදිලිවම අඩු භාණ්ඩ හෝ සේවාවන් සපයා දෙමින්) ~~ස්කන්ධ ආයෝජනයන්ට~~ අයිතිකරුවන්ට (සේවකයින් වැනි) ස්කන්ධ අත්පත් කරගත හැකිවන සේ ~~නීතියෙන් ස්ථාපනය කරන ලද~~ වැඩසටහන් ඇතැම් අධිකරණ බල ප්‍රදේශවල තිබේ. වෙනත් ප්‍රතිශ්ඨාවක් (සේවකයින්ගේ අතීත හෝ අනාගත සේවාවන් කෙරෙහි) ලැබි ඇති හෝ ලැබෙනු ඇති බව මින් හැඟවෙයි. ~~මෙම කොටසෙහි විෂය පථය තුළ මේවා ස්කන්ධයෙන් නිවැරදි කෙරෙන කොටස් පදනම් කරගත් ගෙවීම්ය.~~ ගණුදෙනු හඳුනා නොගත් ලැබුන භාණ්ඩ හෝ සේවා (හෝ ලැබීමට ඇති) අස්තිත්වය විසින් මැනිය යුත්තේ ප්‍රදානය කළ දින මිණුම්කරන ලද කොටස් පදනම් ගෙවීම්වල සාධාරණ අගය සහ හඳුනාගනු ලැබුන ඕනෑම භාණ්ඩ හෝ සේවාවල සාධාරණ අගය අතර වෙනස ලෙසය. මුදලින් නිරවුල් කරන ලද ගණුදෙනු සඳහා, එය සම්පූර්ණයෙන් නිරවුල් කරනතුරු, සෑම වාර්තාකරන කාලපරිච්ඡේදයක් අවසානයේ දීම වගකීම 26.14 ඡේදය ප්‍රකාරව ප්‍රති මිණුම්කරණය කරනු ඇත.

**හෙළිදරව් කිරීම්**

26.22 අස්තිත්වය සමුහ කොටස් පදනම් කරගත් ගෙවීම් විධිවිධාන හෝ සැලැස්මක කොටස් නම් සහ එය එහි කොටස් පදනම් කරගත් ගෙවීම් වියදම් සමුහය විසින් හඳුනාගන්නා ලද සාධාරණ වියදම් වෙන්කිරීම පදනම් කරගෙන ~~හඳුනාගන්නා විට සහ~~ මිණුම්කරන විට එය ඒ කරුණද වෙන්කළ පදනමද හෙළිදරව් කළ යුතුය. (26.16 ඡේදය බලන්න.)

## 27 කොටසට සංශෝධනයන් වත්කම් හානිකරණය

27.1, 27.6, 27.14 සහ 27.30 - 27.31 ඡේදයන් සංශෝධනය කර ඇත. ඉවත්කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**අරමුණ හා විෂය පථය**

27.1 වත්කමක **ධාරණ අගය** එහි **අයකර හැකි වටිනාකම** ඉක්මවන විට **හානිකරණ අලාභයක්** සිදුවෙයි. මෙම SLFRS හි වෙනත් කොටස් වලින් හානිකරණ අවශ්‍යතා ස්ථාපනය කරනු ලැබ ඇති පහත දැක්වෙන වත්කම් හැරුණ විට, අනිකුත් සියළුම වත්කම් වල හානිකරණ ගිණුමගත කිරීම සඳහා මෙම කොටස ව්‍යවහාර කළ යුතුය.

(අ) .......

(ඊ) ගොඩනැගිලි කොන්ත්‍රාත්තු මඟින් උද්ගතවන වත්කම් (23 වන කොටස් ආදායම් බලන්න.)

**පොදු මුලධර්ම**

.......

27.6 වත්කම 17 වන කොටස දේපළ, පිරියත සහ උපකරණ හි ප්‍රත්‍යාගණන ආකෘතිය ප්‍රකාරව ප්‍රත්‍යාගණන අගයක් මත ගෙන යන්නේ නම් හැර, අස්තිත්වයක් විසින් හානිකරණ අලාභයක් ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගත යුතුය. ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක හානිකරණ අලාභයක් වෙතොත්, 17.15 ඇ ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණන හීනවීමක් ලෙස සැලකිය යුතුය.

**විකිණීම සඳහා වන පිරිවැය අඩුකළ සාධාරණ අගය**

27.14 විකිණීම සඳහා වන පිරිවැය අඩුකළ සාධාරණ අගය යනු දැනුමැති හා කැමැත්තක් ඇති පාර්ශවයන් අතර අතේ දුරින් සිදුවන ගණුදෙනුවකදී ලබාගත හැකි වටිනාකමින් අපහරණ පිරිවැය අඩුකළ අගයයි. (11.27 - 11.32 ඡේදයන් සාධාරණ අගයට උපදෙස් සපයයි.) ~~වත්කමක විකිණීම සඳහා වන පිරිවැය අඩුකළ සාධාරණ අගය සඳහා වඩාත්ම හොඳ සාක්ෂිය වනුයේ බන්ධිත ගිවිසුමක් මත අතේ දුරින් කෙරෙන ගණුදෙනුවකදී ලබාගත හැකි මිල හෝ ක්‍රියාකාරී වෙළඳපොලක වෙළඳපළේ මිලය. වත්කමක් සඳහා~~

~~බන්ධිත විකුණුම් ගිවිසුමක් හෝ ක්‍රියාකාරී වෙළඳපොලක් නොමැති නම්, විකුණුම් සඳහා වන පිරිවැය අඩුකළ සාධාරණ අගය පදනම් වනුයේ වාර්තාකරන දිනට ඇති හොඳම තොරතුරු වලින් පිළිබිඹු කෙරෙන අන්දමට දැනුමැති කැමැත්තක් ඇති පාර්ශවයන් අතර අතේ දුරින් සිදුවන ගණුදෙනුවකදී වත්කම අපහරණය කිරීමෙන් අස්තිත්වයට ලබාගත හැකි වටිනාකමින් අපහරණ පිරිවැය අඩුකළ පසු ලැබෙන අගයයි. මෙම වටිනාකම නිර්ණය කිරීමේදී අස්තිත්වයත් එම කර්මාන්තය තුළම සමාන වත්කම් සම්බන්ධයෙන් මෑතකාලීන සිදුවූ ගණුදෙනුවල ප්‍රතිඵල සැලකිල්ලට ගනියි.~~

**හානිකරණය වූ තනි වත්කමක් සඳහා නැවත අයකරගත යුතු වටිනාකම ඇස්තමේන්තු කර ඇති විට ප්‍රතිවර්ත කිරීම.**

27.30 හානිකරණය වූ තනි වත්කමක අයකරගත හැකි වටිනාකම මත පෙර හානිකරන අලාභය පදනම් වී ඇතිවිට, පහත සඳහන් වන අවශ්‍යතා ව්‍යවහාර වේ.

(අ) .......

(ආ) වත්කමෙහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි වටිනාකම එහි ධාරණ අගය ඉක්මවන්නේ නම් අස්තිත්වය විසින් පහත (ඇ) හි විස්තර කර ඇති සීමාවන්ට යටත්ව ධාරණ අගය නැවත අයකර ගත හැකි ප්‍රමාණයට ඉහළ නැංවිය යුතුය. ඒ ඉහළ නැංවීම හානිකරණ අලාභය ප්‍රතිවර්තනය කිරීමකි. <u>17.15 ආ ඡේදයේ ප්‍රත්‍යාගණන ආකෘතිය ප්‍රකාරව ප්‍රත්‍යාගණන අගය මත ගෙන යන වත්කමක 17.15 ඇ ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණන වර්ධනයක් ලෙස සැලකිය යුතු හානිකරණයක ප්‍රතිවර්තනයක් වන්නේ නම් හැර,</u> අස්තිත්වය ප්‍රතිවර්තනය කිරීම ලාභයෙහි හෝ අලාභයෙහි වහාම හඳුනාගත යුතුය.

(ඇ) ........

**මුදල් උත්පාදන ඒකකයක් සඳහා නැවත අයකර ගත හැකි වටිනාකම ඇස්තමේන්තු කර ඇති විට ප්‍රත්‍යාවර්ත කිරීම.**

27.31 මුල්හානිකරණ අලාභය වත්කම අයත් වන මුදල් උත්පාදන ඒකකයෙහි නැවත අයකර ගත හැකි ප්‍රමාණය මත පදනමව ඇති විට පහත දැක්වෙන අවශ්‍යතා ව්‍යවහාර වනු ඇත.

(අ) ......

(ආ) මුදල් උත්පාදන ඒකකයෙහි ඇස්තමේන්තු කළ නැවත අයකර ගත හැකි වටිනාකම එහි ධාරණ අගය ඉක්මවන්නේ නම් අතිරික්තය හානිකරණ අලාභයක් ප්‍රතිවර්ත කිරීමකි. අස්තිත්වය විසින් එම ප්‍රතිවර්ත කිරීමේ වටිනාකම පහත (ඇ) හි විස්තර කර ඇති සීමාවන්ට යටත්ව කීර්තිනාමය හැර ඒකකයෙහි අනිකුත් වත්කම්වලට එම වත්කම්වල ධාරණ අගයන්ට සමානුපාතිකව වෙන්කළ යුතුය. <u>වත්කම 17.15 ආ ඡේදයෙහි ප්‍රත්‍යාගණන ආකෘතිය ප්‍රකාරව, ප්‍රත්‍යාගණන අගය මත ගෙන යන්නේ නම් හැර,</u> ධාරණ අගයන්හි එකී වැඩිවීම් එක් එක් වත්කම් වෙනුවෙන් හානිකරණ අලාභයන් ප්‍රතිවර්ත කිරීම් ලෙස සලකා වහාම ලාභයෙහි හෝ අලාභයෙහි හඳුනාගත යුතුය. <u>ප්‍රත්‍යාගණනය කරන ලද වත්කමක හානිකරණ අලාභයක ප්‍රතිවර්ත වීමක් 17.15 ඇ ඡේදය ප්‍රකාරව, ප්‍රත්‍යාගණන වර්ධනයක් ලෙස සැලකිය යුතුය.</u>

(ඇ) .......

## 28 වැනි කොටසට සංශෝධනයන් සේවක ප්‍රතිලාභ

28.30, 28.41 සහ 28.43 ඡේදයන් සංශෝධනය කර ඇත. ඉවත්කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**<u>වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ</u>**

28.30 වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ සඳහා වගකීමක් අස්තිත්වය විසින් පහත සඳහන් වටිනාකම්වල මනින ලද ශුද්ධ එකතුවට හඳුනාගත යුතුය.

(අ) ......

අස්තිත්වය විසින් <u>කාලපරිච්ඡේදය තුළ</u> වගකීමේ ශුද්ධ වෙනස්වීම ~~28.33 ඡේදය අනුව හඳුනාගත යුතුය.~~ කාලපරිච්ඡේදය තුළ සේවකයන්ට ගෙවන ලද ප්‍රතිලාභයන්ට ආරෝපණය කළ හැකි වෙනස්වීම් හෝ කාලපරිච්ඡේදය තුළ වෙනත් දිගුකාලීන සේවක ප්‍රතිලාභ පිරිවැය වන සේව්‍යයාගේ දායකවීම් හැර, හඳුනාගත යුතුය. <u>එම පිරිවැය මෙම SLFRS මඟින් දේපළ, පිරියත සහ උපකරණ තොග වැනි වත්කමක</u>

පිරිවැයෙහි කොටසක් ලෙස හඳුනාගත යුතු යැයි අවශ්‍ය කරන්නේ නම් හැර වියදම ලෙස සහ මුලින්ම ලාභයෙන් හෝ අලාභයෙන් හඳුනාගත හැක.

**නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් වෙනුවෙන් හෙළිදරව් කිරිම**

28.41 නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් සඳහා පහත සඳහන් තොරතුරු (28.11 ඡේදයට අනුකූලව නිර්වචිත දායකත්ව සැලැස්මක් ලෙස ගිණුම්ගත කරන ලද ඒ වෙනුවට 28.40 ඡේදයෙහි හෙළිදරව් කිරීම් ව්‍යවහාර වන නිර්වචිත සමූහ සේවක ප්‍රතිලාභ සැලසුම් හැර) අස්තිත්වය විසින් හෙළිදරව් කළ යුතුය. අස්තිත්වයකට නිර්වචිත ප්‍රතිලාභ සැලසුම් එකකට වැඩි සංඛ්‍යාවක් ඇතිවිට මෙම හෙළිදරව් කිරිම් එක් එක් සැලැස්මෙහි එකතුව වෙන් වෙන් වශයෙන් වඩාත්ම ප්‍රයෝජනවත් ලෙස සැලසෙන අන්දමේ කාණ්ඩ ලෙසින් හෝ පිළියෙල කළ යුතුය.

(අ) ......

(ආ) එහි නිර්වචිත ප්‍රතිලාභ බැඳීම් මිනුම් කිරිමේදී අස්තිත්වය 28.19 ඡේදයෙහි දැක්වෙන කවර හෝ සරල කිරිමක් භාවිතා කරන්නේ නම් ඒ ~~පිළිබඳ කෙටි පැහැදිලි කිරීමක්~~ බව සහ නිර්වචිත ප්‍රතිලාභ ක්‍රමයේ බැඳීම් හා පිරිවැය අගය කිරීම සඳහා "යෝජිත ඒකක බැර ක්‍රමය" භාවිතා කිරීමේදී අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් දැරීමට තුඩු දිය හැකි හේතුන් ද හෙළිදරව් කළ යුතුය.

(ඇ) ............

**සේවය අවසන් කිරිමේ ප්‍රතිලාභ සඳහා හෙළිදරව් කිරිම්.**

28.43 අස්තිත්වයක් එහි සේවකයින්ට සපයන ලබන එක් එක් ප්‍රභේදයේ අනෙකුත් දිගුකාලීන ප්‍රතිලාභ වෙනුවෙන් ප්‍රතිලාභයේ ස්භාවය, ~~එහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය~~ එහි බැඳීමෙහි වටිනාකම සහ වාර්තාකරන දිනට මුල්‍ය සැපයුම් ප්‍රමාණය අස්තිත්වය විසින් හෙළිදරව් කළ යුතුය.

## 29 වැනි කොටස ආදායම් බදු

| |
|---|
| 29 වැනි කොටස ප්‍රතිශෝධනය කර ඇත. 29.1 - 29.41 ඡේදයන් හා ඒවායේ සබැඳි ශීර්ෂ පාඨයන් එකතු කර ඇත. |

**මෙම කොටසෙහි විෂය පථය**

29.1 මෙම SLFRS හි අරමුණ සඳහා **බදු අයකළ හැකි ලාභය** මත පදනම් වන සියළුම දේශීය හා විදේශීය බදු **ආදායම් බදුවලට** ඇතුළත්ය. වාර්තාකරන අස්තිත්වයට බෙදා හරිනු ලබන පරිපාලිතයකින්, ආශ්‍රිතයකින් හෝ බද්ධ ව්‍යාපාරියකින් ගෙවිය යුතු රඳවා ගැනීමේ බදු වැනි බදුද ආදායම් බද්දට ඇතුළත්ය.

29.2 මෙම කොටස ආදායම් බදු සඳහා ගිණුම්කරණය ආවරණය කරයි. මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගෙන ඇති ගණුදෙනු හා සිදුවීම් වල ප්‍රවර්තන සහ අනාගත බදු ප්‍රතිලාභය හඳුනාගැනීම එමගින් අවශ්‍ය කෙරේ. මෙම හඳුනාගනු ලැබූ බදු වටිනාකම් **ප්‍රවර්තන බද්ද** සහ **විලම්භිත බද්දෙන්** සමන්විත වෙයි. ප්‍රවර්තන බද්ද යනු ප්‍රවර්තන කාලපරිච්ඡේදය හෝ පසුගිය කාලපරිච්ඡේදවල බදු අයකළ හැකි ලාභය (බදු අලාභය) මත ගෙවිය යුතු (නැවත අයකරගත හැකි) ආදායම් බද්ද වේ. සාමාන්‍යයෙන් අස්තිත්වයක් එහි **වත්කම්** සහ **වගකීම්** ඒවායේ වර්තමාන අගයට අයකර ගැනීමේදී හෝ නිරවුල් කිරීමෙන් සහ වර්තමානයේ ප්‍රයෝජනයට නොගත් බදු අලාභ හෝ බදු බැර ඉදිරියට ගෙන යාමේ බලපෑමෙහි ප්‍රතිඵලය නිසා අනාගත කාලපරිච්ඡේද වල ගෙවිය යුතු හෝ අයකරගත හැකි බද්ද විලම්භිත බද්ද වේ.

29.3 මෙම කොටසින් **රාජ්‍ය ප්‍රදානයන්** සඳහා ගිණුම් ගත කිරීමේ ක්‍රමයන් ගැන සඳහන් නොකෙරේ. (24 වන කොටස රාජ්‍ය ප්‍රදාන බලන්න.) කෙසේ වෙතත් මෙම කොටසින් එවැනි ප්‍රදානයන් මගින් ඇතිවිය හැකි තාවකාලික වෙනස්වීම් සඳහා ගිණුම්ගත කිරීමේ ක්‍රමය සාකච්ඡා කෙරේ.

**ප්‍රවර්තන බද්ද හඳුනාගැනීම සහ මැනීම**

29.4 ප්‍රවර්තන හා අතීත කාලපරිච්ඡේදයන් සඳහා බදු අයකළ හැකි ලාභය මත ගෙවිය යුතු ප්‍රවර්තන බදු වගකීමක් අස්තිත්වයක් විසින් හඳුනාගත යුතුය. ප්‍රවර්තන සහ අතීත කාලපරිච්ඡේද සඳහා ගෙවන ලද ප්‍රමාණය ඒ කාලපරිච්ඡේදය සඳහා ගෙවිය යුතු ප්‍රමාණය ඉක්මවා ඇත්නම්, අතිරික්තය ජංගම බදු වත්කමක් ලෙස අස්තිත්වය විසින් හඳුනාගත යුතුය.

29.5 අතීත කාලපරිච්ඡේදයක ගෙවන ලද බදු අයකර ගැනීම සඳහා ආපසු ගෙනයා හැකි ජංගම බදු වත්කමක්, බදු අලාභයක ප්‍රයෝජනය සඳහා අස්තිත්වයක් විසින් හඳුනාගත යුතුය.

29.6 **වාර්තාකරන දිනයට** පනවා ඇති හෝ සන්තාවීව පනවන බදු අනුපාතික සහ නීති භාවිතාකරමින් අස්තිත්වයක් විසින් ගෙවීමට (අයකර ගැනීමට) අපේක්ෂා කරන ප්‍රවර්තන බදු වගකීම (වත්කම) මිනුම් කළ යුතුය. අතීත නීති පැනවීම් ක්‍රියාවලියෙන් අවශ්‍ය කෙරෙන පරිදි අතීත සංසිද්ධීන්හි ප්‍රතිඵල වලට බලපෑමක් නොමැතිවන විටත්, එසේ වීමේ ඉඩකඩක් නොමැති විටත්, අස්තිත්වයක් බදු අනුපාතික හා බදු නීති සන්තාවීම පනවනු ලැබූ සේ සැලකිය යුතුය. මිනුම් කිරීම සඳහා අමතර මාර්ගෝපදේශ 29.32 -29.33 ඡේදවලින් සැපයෙයි.

## විලම්භිත බද්ද හඳුනාගැනීම

### පොදු හඳුනාගැනීමේ ප්‍රතිපත්තිය

29.7 වත්කමක් හෝ වගකීමක් හඳුනාගැනීමේදී. වාර්තා කරනු ලබන අස්තිත්වය එම වත්කමේ හෝ වගකීමේ ධාරණ අගය අයකර ගැනීමට හෝ නිරවුල් කිරිමට අපේක්ෂාකිරිම. නෛසර්ගිකය අයකර ගැනීම හෝ නිරවුල් කිරිම ආනුෂංගික නොවීමට වඩා ධාරණ අගයේ අයකර ගැනීම හෝ නිරවුල් කිරිම මඟින් අනාගත බදු ගෙවීම් වැඩි (අඩු) වීමේ සම්භාවිතයක් තිබේනම්, මෙම කොටස මඟින් සමහර සීමා ව්‍යතිරේඛයන් සහිතව **විලම්භිත බදු වගකීම (විලම්භිත බදු වත්කම)** අස්තිත්වය විසින් හඳුනාගත යුතු යැයි අවශ්‍ය කෙරේ. බද්දට යටත් ලාභයට බලපෑමක් නොමැතිව, වත්කමක ධාරණ අගය අයකර ගැනීමට හෝ වගකීමක ධාරණ අගය නිරවුල් කිරීමට, අස්තිත්වය අපේක්ෂා කරන්නේ නම්, එම වත්කම හෝ වගකීම වෙනුවෙන් විලම්භිත බද්දක් උද්ගත වන්නේ නැත.

29.8 අතීත ගණුදෙනු සහ සිද්ධීන්වල ප්‍රතිඵලයක් වශයෙන් අනාගත කාලපරිච්ඡේදවලද අයකර ගැනීමට හෝ ගෙවීමට ඇති බදු වෙනුවෙන් විලම්භිත බදු වත්කමක් හෝ විලම්භිත බදු වගකීමක් අස්තිත්වයක් විසින් හඳුනාගත යුතුය. එවැනි බදු පැන නගින්නේ මුල්‍ය තත්වය දැක්වෙන ප්‍රකාශයේ ඇති අස්තිත්වයේ වත්කම් සහ වගකීම් සඳහා හඳුනාගත් ධාරණ වටිනාකම් සහ එම වත්කම් සහ වගකීම් සඳහා බදු අධිකාරීන් විසින් හඳුනාගන්නා ලද වටිනාකම් අතර වෙනස (එවැනි වෙනස්කම් **තාවකාලික වෙනස්කම්** ලෙස නම් කෙරේ.) සහ ඉදිරියට ගෙන යන වර්තමානයේ භාවිතා නොකළ බදු අලාභ සහ බදු බැර වලිනි.

### බදු පදනම් සහ තාවකාලික වෙනස්කම්

29.9 වත්කමක **බදු පදනම** යනු, වත්කමක එහි ධාරණ අගය අයකර ගැනීමේදී අස්තිත්වයට ප්‍රමාණ වන බද්දට යටත් ආර්ථික ප්‍රතිලාභයන්ගෙන් බදු අරමුණ වෙනුවෙන්, අඩුකළ හැකි මුදලය. එම ආර්ථික ප්‍රතිලාභයන් බද්දට යටත් නොවන්නේ නම් වත්කමේ බදු පදනම එහි ධාරණ අගයට සමාන වනු ඇත.

29.10 වගකීමක බදු පදනම යනු අනාගත කාලපරිච්ඡේදයන්හිදී, බදු අරමුණ උදෙසා අඩුකළ හැකි මුදල් කපාහැරීමෙන් පසු එහි ධාරණ වටිනාකමය. කලින් ලැබූ ආදායම සම්බන්ධයෙන් ඇතිවන වගකීමේ බදු පදනම යනු එහි ධාරණ අගයෙන් අනාගත කාලපරිච්ඡේදයන්හිදී බද්දට යටත් නොවන ආදායම් අඩුකිරීමෙන් පසු ලැබෙන අගය වේ.

29.11 ඇතැම් අයිතම්වල බදු පදනමක් ඇති නමුත් වත්කමක් හෝ වගකීමක් ලෙස මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනාගනු නොලැබේ. උදාහරණයක් ලෙස ගිණුම්කරණ ලාභය තීරණය කිරීමේදී පර්යේෂණ හා සංවර්ධන පිරිවැය දරනු ලබන අවස්ථාවේ වියදමක් ලෙස හඳුනාගනු ලබන නමුත් පසු කාලපරිච්ඡේදයක් දක්වා බදු අයකළ හැකි ලාභය (අලාභය) තීරණය කිරීමේදී අඩු කිරීමට අවසර නොලැබෙයි. බදු අධිකාරීන් විසින් අනාගත කාලපරිච්ඡේදයකදී අඩු කිරීමක් ලෙස ඉඩදෙනු ලබන මුදල සහ ශුන්‍ය වන ධාරණ අගය අතර ඇති වෙනස **අඩුකළ හැකි තාවකාලික වෙනස්කමක්** වන අතර එයින් විලම්භිත වත්කමක් හෝ වගකීමක් ඇතිවේ.

29.12 තාවකාලික වෙනස්කම් යනු මූල්‍ය තත්ව ප්‍රකාශයේ ඇති වත්කමක ධාරණ අගය සහ එහි බදු පදනම අතර ඇති වෙනසය. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන්හි තාවකාලික වෙනස්කම් තීරණය කරනු ලබන්නේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයේ වත්කම් සහ වගකීම්වල ධාරණ අගය යෝග්‍ය බදු පදනම සමඟ සැසඳීමෙනි. බදු පදනම නිර්ණය කරනු ලබන්නේ එවැනි බදු වාර්තාවක් ගොනු කරනු ලබන අධිකරණ බල ප්‍රදේශයන්හි ඒකාබද්ධ බදු වාර්තාවක් අනුසාරයෙනි. අනෙකුත් අධිකරණ බල ප්‍රදේශයන්හි සමූහයේ එකිනෙක අස්තිත්වයේ බදු වාර්තා අනුසාරයෙන් බදු පදනම තීරණය කෙරෙනු ඇත.

**29.13 තාවකාලික වෙනස්කම් ඇතිවෙන තත්වයන්ට උදාහරණයක් ලෙස :**

(අ) ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කර ගන්නා ලද හඳුනාගත හැකි වත්කම් සහ භාරගන්නා ලද වගකීම්, 19 වන කොටස ව්‍යාපාර සංයෝජනයන් හා කීර්තිනාමය, ප්‍රකාරව සාධාරණ අගය මත හඳුනාගන්නා නමුත් බදු අරමුණු උදෙසා සමාන ගැලපීමක් කරනු නොලැබේ. (උදාහරණයක් ලෙස, වත්කමක බදු පදනම, පෙර අයිතිකරුට වූ පිරිවැය මත රඳා පවතිනු විය හැකිය.) එයින් උද්ගත වන විලම්භිත බදු වත්කම හෝ වගකීම අස්තිත්වයක් විසින් හඳුන්වනු ලබන කීර්තිනාමයේ අගයට බලපෑමක් ඇති කරයි.

(ආ) ප්‍රතිමිණුම්කරණය කළ නමුත්, බදු අරමුණු උදෙසා සමාන ගැලපීමක් නොකරන ලද වත්කම් උදාහරණ ලෙස සාධාරණ අගයට ප්‍රතිමිණුම්කරණය කිරීමට හෝ ප්‍රත්‍යාගණනය කිරීමට මෙම SLFRS මඟින් ඉඩ සැලසීම හෝ අවශ්‍ය වීම කෙරේ. (උදාහරණ ලෙස 16 යන කොටස ආයෝජන දේපළ සහ 17 වන කොටස දේපළ, පිරියත සහ උපකරණ)

(ඇ) ව්‍යාපාර සංයෝජනයකදී කීර්තිනාමය උද්ගත වේ. උදාහරණ ලෙස, බදු අධිකාරීන් විසින් බද්දට යටත් වන ලාභය තීරණය කිරීමේදී කීර්තිනාමයෙහි ක්‍රමක්ෂය හෝ හානිකරණය අඩුකළ හැකි වියදමක් ලෙස ඉඩ නොදෙන්නේ නම් සහ පරිපාලිතය ඉවත් කිරීමේදී කීර්තිනාමයෙහි පිරිවැය අඩුකළ හැකි වියදමක් ලෙස ඉඩ නොදෙන්නේ නම්, කීර්තිනාමයේ බදු පදනම ශුන්‍ය වනු ඇත.

(ඈ) මූලික හඳුනාගැනීමේදී වත්කමක හෝ වගකීමක බදු පදනම එහි මූලික ධාරණ අගයට වෙනස්වීම

(ඉ) පරිපාලිතයන්, ශාඛාවන්, ආශ්‍රිතයන් හෝ බද්ධ ව්‍යාපාරයන්හි ඇල්මැති ආයෝජනයන්හි ධාරණ අගය ආයෝජනයෙහි හෝ ඇල්මෙහි බදු පදනමට වෙනස්වීම ඇතුලත් වේ.

ඉහත දැක්වූ සියළුම තාවකාලික වෙනස්කම් වලින් විලම්භිත බදු වත්කම් සහ බදු වගකීම් උද්ගත නොවනු ඇත. (29.14 සහ 29.16 ඡේදයන් බලන්න)

**බද්දට යටත්වන තාවකාලික වෙනස්කම්**

29.14 විලම්භිත බදු වගකීමක් උද්ගත වන්නේ,

(අ) කීර්තිනාමය මුල්වරට හඳුනාගැනීමේදී, හෝ

(ආ) (i) ව්‍යාපාර සංයෝජනයක් නොවන සහ

(ii) ගණුදෙනුව වන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභය හෝ බද්දට යටත්වන ලාභය හෝ බදු අලාභයට බලපෑමක් නොවන ආකාරයට උද්ගත නොවන ගණුදෙනුවක වත්කමක් හෝ වගකීමක් මුල්වරට හඳුනාගැනීමේදී

නම් හැර සියළුම **බද්දට යටත් තාවකාලික වෙනස්කම්** සඳහා විලම්භිත බදු වගකීමක් හඳුනාගත යුතුය.

කෙසේවෙතත්, පරිපාලිතයන්, ශාඛාවන් සහ ආශ්‍රිතයන්හි ආයෝජනයන් සහ බද්ධ ව්‍යාපාරයන්හි ඇල්මට ආශ්‍රිය වන බද්දට යටත්වන තාවකාලික වෙනස්කම් සඳහා විලම්භිත බදු වගකීමක් 29.25 ඡේදය ප්‍රකාරව හඳුනාගත යුතුය.

29.15 ආදායම හෝ වියදම ගිණුම්කරණ එක් කාලපරිච්ඡේදයක ඇතුලත් කරන නමුත්, වෙනත් කාලපරිච්ඡේදයක බදු ලාභයෙහි ඇතුලත් කරන විට, සමහර තාවකාලික වෙනස්කම් උද්ගත වේ. එවැනි තාවකාලික වෙනස්කම් කාලීය වෙනස්කම් ලෙස බොහෝ විට විස්තර කරනු ලැබේ. බද්දට යටත් වන තාවකාලික වෙනස්කම් වන සහ එමනිසා විලම්භිත බදු වගකීමක් උද්ගතවන මෙම වර්ගයේ තාවකාලික වෙනස්කම්වලට උදාහරණයන් පහත දැක්වේ.

(අ) පොලී ආදායම කාල ප්‍රතිප්‍රමාණානුකූල වන පදනම මත ගිණුම්කරණ ලාභයට ඇතුළත් කිරීම සහ සමහර අධිකරණ බල ප්‍රදේශයක මුදල් අයකර ගනු ලැබුවිට බද්දට යටත් ලාභයට ඇතුලත් කිරීම. එම ආදයම සඳහා ලැබිය යුතු මුදලක බදු පදනම ආදායම මුදලින් අයකර ගන්නා තෙක් බද්දට යටත් ලාභයට බලපෑමක් නොකෙරෙන බැවින් ශුන්‍ය වේ. සහ

(ආ) බදු ලාභය (බදු අලාභය) නිර්ණය කිරීමේදී භාවිතා කළ ක්ෂයවීම ගිණුම්කරණ ලාභය නිර්ණය කිරීමේදී භාවිතාකරන ලද්දට වෙනස් විය හැකිය. තාවකාලික වෙනස්කම් යනු ප්‍රවර්තන හා පූර්වකාලයන්හි බදු ලාභය තීරණය කිරීමේදී බදු අධිකාරීන් විසින් එම වත්කම පිළිබඳව ඉඩදෙනු ලැබූ සියළුම අඩු කිරීම් හැර එම වත්කමෙහි බදු පදනම වන මුල් පිරිවැය සහ ධාරණ අගයෙහි වෙනස වේ. බදු ක්ෂය අනුපාතිකය ත්වරණය කිරීමේදී බද්දට යටත් තාවකාලික වෙනසක් උද්ගත

වන අතර විලම්භිත බදු වගකීමක් ප්‍රතිඵලයක් ලෙස ඇති වේ. බදු ක්ෂය අනුපාතිකය ගිණුම්කරණ ක්ෂය අනුපාතිකයට වඩා ලැසි වන්නේ නම්, විලම්භිත බදු වත්කමක් ප්‍රතිඵලයක් වන තාවකාලික වෙනස්කමක් උද්ගත වේ. (29.16 ඡේදය බලන්න)

**අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්**

29.16 සියළුම අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා ඒවා භාවිතා කිරීමට, බදු ලාභයන් සම්භාවිතවීමේ ප්‍රමාණයට විලම්භිත බදු වත්කමක් හඳුනාගත යුතුය. එසේ නොකළ යුත්තේ විලම්භිත බදු වත්කම වත්කමක් හෝ වගකීමක් පළමුවර හඳුනාගැනීමේදී උද්ගත වන ගණුදෙනුව :

(අ) ව්‍යාපාර සංයෝජනයක් නොවීම, සහ

(ආ) ගණුදෙනුව වන අවස්ථාවේදී ගිණුම්කරණ ලාභයට හෝ බදු ලාභය (බදු අලාභය) ට බල නොපාන්නේ නම්ය.

කෙසේ වෙතත්, පරිපාලිතයන්, ශාඛාවන් සහ ආශ්‍රිතයන් හි ආයෝජනයන් සහ බද්ධ ව්‍යාපාරයන් හි ඇල්ම ආශ්‍රිතව වන අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා 29.26 ඡේදය ප්‍රකාරව විලම්භිත බදු වත්කමක් හඳුනාගත යුතුය.

29.17 විලම්භිත බදු වත්කම් ඇතිවන බද්දට යටත් තාවකාලික වෙනස්කම් වලට උදාහරණ පහත දැක්වේ.

(අ) විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය, සේවා නියුක්තිකයා විසින්, සේවය සපයනු ලබන කාලයේ ගිණුම්කරණ ලාභය තීරණය කිරිමේදී අඩුකළ හැකි නමුත්, අස්තිත්වය විසින් අරමුදල තම දායක මුදල් ගෙවීමේදී හෝ අස්තිත්වය විසින් විශ්‍රාම ප්‍රතිලාභයන් ගෙවන විටකදී, බද්දට යටත් ලාභය තීරණය කිරිමේදී අඩුකළ යුතුය. වගකීම් ධාරණ අගයේ හා එහි බදු පදනම අතර තාවකාලික වෙනස්වීමක් පවතී. වගකීමේ බදු පදනම සාමාන්‍යයෙන් ශුන්‍ය වේ. දායක මුදල් හෝ විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීමේදී අඩුකිරීම් වශයෙන්, ආර්ථික ප්‍රතිලාභ අස්තිත්වයට ප්‍රධාන වන බැවින්, එවැනි තාවකාලික වෙනස්වීම් වලින් විලම්භිත බදු වත්කම් ඇතිවේ.

(ආ) බදු අරමුණු සඳහා සමානුපාතික ගැලපීම් නොමැතිව, සමහර වත්කම් සාධාරණ අගය මත ධාරණය කළ හැකිය. වත්කමෙහි බදු පදනම, එහි ධාරණ අගය ඉක්මවුහොත්, තාවකාලික අඩුකළ හැකි වෙනස්වීමක් උද්ගත වේ.

29.18 අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් ප්‍රවර්තනයෙන්, අනාගත කාලපරිච්ඡේදයන්හි බදු ලාභය නිර්ණය කිරිමේදී, අඩුවීම් උද්ගත වේ. ප්‍රතිවර්තනය කිරීමට අපේක්ෂිත එකම බදු අධිකාරියකට සහ එකම බද්දට යටත් අස්තිත්වයකට සම්බන්ධව ප්‍රමාණාත්මක තාවකාලික බදු වෙනස්කම් ඇතිවිටක අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් උපයෝගී කිරිම සඳහා බදු ලාභ පැවතීමෙ සම්භාවිතාවයක් තිබිය යුතුය. එනම්,

(අ) අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය කිරිමට අපේක්ෂිත කාලපරිච්ඡේදයේදීම, හෝ

(ආ) විලම්භිත බදු වත්කමෙන් උද්ගත වන බදු අලාභය පූර්ව කාලයට හෝ ඉදිරිකාලයට ගෙන යා හැකි කාලපරිච්ඡේදයන්හිදී

එවැනි තත්වයන් යටතේ, විලම්භිත බදු වත්කම අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් උද්ගත වන කාලපරිච්ඡේදයේදී හඳුනාගැනෙන්නේ, පහත ප්‍රමාණයන් දක්වාය.

29.19 එකම බදු අධිකාරියකට හෝ එකම බද්දට යටත් වන අස්තිත්වයකට අදාල බද්දට යටත් තාවකාලික වෙනස්කම් ප්‍රමාණවත් නොවන විටකදී විලම්භිත බදු වත්කම හඳුනාගනු ලබන්නේ,

(අ) අස්තිත්වයට අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් ප්‍රතිවර්තනය කරන එකම කාලපරිච්ඡේදයේ දී (හෝ විලම්භිත බදු වත්කමෙන් උද්ගත වන බදු අලාභය පූර්ව කාලයට හෝ ඉදිරියට ගෙන යා හැකි කාලයන්හිදී) එකම බදු අධිකාරියකට සහ එකම බද්දට යටත් අස්තිත්වයකට සම්බන්ධව ප්‍රමාණවත් බදු ලාභයන් තිබීමේ සම්භාවිතාවක් තිබිය හැකිය. අනාගත කාලයන්හිදී එයට ප්‍රමාණාත්මක බදු ලාභ තිබිය හැකිදැයි ඇගැයීමේදී අනාගතයේදී ජනිත විය හැකි යැයි අපේක්ෂා කරන අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් වලින් උද්ගත වන බදු ප්‍රමාණයන් අස්තිත්වයක් විසින් නොසලකා සිටිනු ඇත්තේ, එම අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් වලින් විලම්භිත බදු වත්කමට උපයෝගී වීම සඳහා අනාගත බදු ලාභයෙන් තිබීම අවශ්‍ය වන නිසාය, හෝ

(ආ) උචිත කාලයන්හි බදු ලාභ උපදවන බදු සැලසුම් අවස්ථාවන් අස්තිත්වයට තිබිය හැකි නිසාය.

29.20 අස්තිත්වයට මෑත අලාභයන් පිළිබඳ ඉතිහාසයක් තිබේනම් 29.21 - 29.22 ඡේදයන්හි උපදෙස් අස්තිත්වය සලකා බලයි.

**භාවිතා නොකළ බදු අලාභයන් සහ භාවිතා නොකළ බදු බැර**

29.21 භාවිතා නොකළ බදු අලාභයන් සහ භාවිතා නොකළ බදුබැර උපයෝගිකරගත හැකි යැයි සම්භාවිත කෙරෙන අනාගත බදු ලාභ ප්‍රමාණය දක්වා භාවිතා නොකළ බදු අලාභයන් සහ භාවිතා නොකළ බදු බැර ඉදිරියට ගෙන යාම පිණිස විලම්භිත බදු වත්කමක් හඳුනාගත යුතුය. භාවිතා නොකළ බදු අලාභයන් හෝ භාවිතා නොකළ බදු බැර උපයෝගි කරගනු පිණිස බදු ලාභයන් තිබිය හැකි සම්භාවිතාවය තක්සේරු කිරීමේ දී අස්තිත්වය විසින් පහත සඳහන් නිර්ණායකයන් සලකා බලයි.

(අ) ඉකුත්වීමට පෙර උපයෝගි කරගත හැකි භාවිතා නොකළ බදු අලාභයන් හෝ භාවිතා නොකළ බදු බැර වලින් පියවාගත හැකි එකම බදු අධිකාරියට සහ එකම බදු අස්තිත්වයකට සම්බන්ධව බදු මුදල් ප්‍රමාණයන් උද්ගතවන බද්දට යටත් තාවකාලික වෙනස්කම් අස්තිත්වයට තිබේද,

(ආ) භාවිතා නොකළ බදු අලාභයන් හෝ බදු බැර ඉකුත්වීමට පෙර අස්තිත්වයට බදු ලාභ ඇතිවීමේ සම්භාවිතාවයක් තිබේද,

(ඇ) භාවිතා නොකළ බදු අලාභයන් උද්ගත වන්නේ පුනරාවර්තනය විය නොහැකි හඳුනාගත හැකි හේතූන් නිසාද, සහ

(ඈ) භාවිතා නොකළ බදු අලාභයන් හෝ භාවිතා නොකළ බදු බැර උපයෝගි කරගත හැකි කාලයන්හිදී බදු ලාභ ජනිත කළ හැකි බදු සැලසුම් අවස්ථාවන් අස්තිත්වයට තිබේද

භාවිතා නොකළ බදු අලාභයන් හෝ භාවිතා නොකළ බදු බැර හිලව් කළ හැකි බදු ලාභ ඇතිවීමේ අසම්භාවිතාවයේ ප්‍රමාණයට විලම්භිත බදු වත්කම හඳුනා නොගනු ඇත.

29.22 භාවිතා නොකළ බදු අලාභයන් තිබීම අනාගත බදු ලාභයන් ලැබීමට නොහැකිවීම පිළිබඳ දැඩි සාක්ෂියකි. එමනිසා මෑත කාලයේ බදු අලාභයන් පිළිබඳ ඉතිහාසයක් ඇතිවිට අස්තිත්වය භාවිතා නොකළ බදු අලාභයන් හෝ බදු බැර වලින් උද්ගත වන විලම්භිත බදු වත්කම් හඳුනාගනු ලබන්නේ අස්තිත්වයට තිබෙන ප්‍රමාණවත් බදුමය තාවකාලික වෙනස්කම් වල ප්‍රමාණයට හෝ අස්තිත්වය විසින් උපයෝගි කර ගත හැකි වන ප්‍රමාණවත් බදුලාභ තිබීමේ ඒත්තු ගත හැකි අනෙකුත් සාක්ෂි තිබෙන ප්‍රමාණයට ය.

**හඳුනා නොගන්නා ලද විලම්භිත බදු වත්කම් ප්‍රති තක්සේරු කිරීම**

29.23 සෑම වාර්තා කරනු ලබන කාලයක් අවසානයේ දීම අස්තිත්වයක් හඳුනා නොගන්නා ලද විලම්භිත බදු වත්කම් ප්‍රතිතක්සේරු කරයි. අස්තිත්වය පූර්වයේ දී හඳුනා නොගන්නා ලද විලම්භිත වත්කමක් අනාගත බදු ලාභයක් මඟින් විලම්භිත බදු වත්කම අයකර ගැනීමට සම්භාවිතාවී ඇති ප්‍රමාණයට හඳුනාගනු ලබයි.

**පරිපාලිතයන් ශාඛාවන් සහ ආශ්‍රිතයන්හි ආයෝජනයන් සහ බද්ධ ව්‍යාපාරයන්හි ඇල්ම**

29.24 පරිපාලිතයන්, ශාඛාවන් සහ ආශ්‍රිතයන්ගේ ආයෝජනයන් සහ බද්ධ ව්‍යාපාරයන්හි ඇල්මෙහි ධාරණ අගය (උදාහරණ වශයෙන් මව් සමාගමක ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශයන්හි පරිපාලිතයක ධාරණ අගය, සබැඳි කීර්තිනාමයක ධාරණ අගයන් ඇතුළත්ව ශුද්ධ ඒකාබද්ධ වත්කම් වල ධාරණ අගය වේ) ආයෝජනයේ හෝ ඇල්මෙහි බදු පදනම (බෙහෝ විට පිරිවැය) ට වෙනස් වන විටකදී තාවකාලික වෙනස්කම් උද්ගත වේ. එකිනෙකට වෙනස් අවස්ථාවන් කීපයකදී එවැනි වෙනස්වීම් උද්ගත විය හැකිය. නිදහසුන් ලෙස,

(අ) පරිපාලිතයන්, ශාඛාවන්, ආශ්‍රිතයන් හා ඒකාබද්ධ ව්‍යාපාරයන්හි බෙදා හැර නොමැති ලාභයන් තිබීම

(ආ) මව් සමාගම හා පරිපාලිතය වෙනත් රටවල් වල පිහිටා ඇති විටකදී, විදේශීය විනිමය අනුපාතිකයන්හි වෙනස්වීම්

(ඇ) ආශ්‍රිතයක ආයෝජනයේ ධාරණ අගය එහි අයකරගත හැකි මුදලට වඩා අඩු වීම

ආයෝජනයන් ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් සමඟ මව් සමාගමේ, සැසඳීමේදී වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශනයන්හි ගිණුම් ගත කිරිමට වඩා වෙනස් විය හැකිය. එවැනි විටකදී එම ආයෝජනයට සබැඳි, තාවකාලික වෙනස්වීම් ද වෙනස් විය හැකිය. නිදසුන් ලෙස, වෙන් වශයෙන් වූ මූල්‍ය ප්‍රකාශනයන්හි පරිපාලිතයත ධාරණ අගය, 9.26 ඡේදයෙන් තොරාගත් ගිණුම් ප්‍රතිපත්තිය මත රඳා පවතිනු ඇත.

29.25 අස්තිත්වයක් විසින් පරිපාලිතයන්, ශාඛාවන් හා ආශ්‍රිතයන්හි ආයෝජනයන්ට හා බද්ධ ව්‍යාපාරයන්හි ඇල්මට සබැඳි සියළුම බද්දට යටත්, තාවකාලික වෙනස්කම් සඳහා පහත සඳහන් කොන්දේසි සපුරාලන ප්‍රමාණයකට හැර, විලම්භිත බදු වගකීමක් හඳුනාගත යුතුය.

(අ) මව් සමාගමට, ආයෝජනයට හෝ බද්ධ ව්‍යාපාරිකයාට තාවකාලික වෙනස්වීම් ප්‍රතිවර්තනය කිරීමේ කාලය පාලනය කළ හැකි සහ

(ආ) දැනගත හැකි අනාගත කාල පරිභෝජනයකදී තාවකාලික වෙනස්වීම් ප්‍රතිවර්තනය නොවීමේ සම්භාවිතාවයක් තිබිය හැකිය.

29.26 අස්තිත්වයක් විසින් පරිපාලිතයන් ශාඛාවන් සහ ආශ්‍රිතයන්හි ආයෝජනයන් හා බද්ධ ව්‍යාපාරයන්හි ඇල්මෙන් උද්ගත වෙන අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා, විලම්භිත බදු වත්කමක් පිළිගත යුත්තේ ඒවා

(අ) දැනගත හැකි අනාගත කාලපරිච්ඡේදයකදී තාවකාලික වෙනස්වීම් ප්‍රතිවර්තනය සහ

(ආ) තාවකාලික වෙනස්වීම් උපයෝගිකර හිලව් කළ හැකි බදු ලාභ තිබිය හැකි

සම්භාවිතාවයේ ප්‍රමාණයට පමණි.

**විලම්භිත බදු මිණුම්කරණය**

29.27 අස්තිත්වයක් විසින්, විලම්භිත බදු වගකීමක් (වත්කමක්) වාර්තාකරනු ලබන දිනයේදී පනවා ඇති හෝ සත්තාවී ලෙස පනවා ඇති බදු අනුපාතයන් හා නීතින් භාවිතා කරමින් මිණුම්කරණය කළ යුතුය. බදු පැනවීමේ ක්‍රියාවලියේ ඉතිරි පියවරවල් අතීත කාලසීමාවන්හි ප්‍රතිඵලයන්ට බලපෑමක් ඇති නොවී තිබේ නම් හා එසේ වීමට ඉඩකඩ නොමැති නම් බදු අනුපාතයන් හා බදු නිතීන් සත්තා වී ලෙස පනවා තිබේ යැයි අස්තිත්වයක් විසින් සැලකිය යුතුය.

29.28 වෙනස් තලයන්හි බද්දට යටත් ලාභයන් සඳහා වෙනත් බදු අනුපාතයන් භාවිතා කළයුතු විටකදී, අස්තිත්වයක් විසින් විලම්භිත බදු වගකීම නිරාකරණය කෙරෙනු (විලම්භිත බදුවත්කම අයකරගත) හැකිවේ යැයි අපේක්ෂා කරන කාලපරිච්ඡේදයේ බද්දට යටත් වන ලාභයට (බදු අලාභයට) භාවිතා විය හැකියයි. අපේක්‍ෂා කරන පනවා ඇති හෝ සත්තාවී ලෙස පනවා ඇති සාමාන්‍ය බදු අනුපාතයන් භාවිතා කෙරෙමින් විලම්භිත බදු වගකීම් (වත්කම්) මිනුම්කරණය කළ යුතුය.

29.29 අස්තිත්වයක් විසින් වාර්තා කරනු ලබන දිනයේ දී සම්බන්ධිත වත්කම් හා වගකීම් වල ධාරණ අගය අඩුකර ගැනීමට හෝ නිරවුල් කිරිමට, අපේක්ෂා කරනු ලබන ආකාරය හේතුකොට ගෙන ඇතිවන බදු අනුසංගිතයන් පිළිබිඹු වන ලෙසට, විලම්භිත බදු වගකිම හා විලම්භිත බදු වත්කම මිනුම්කරණය කළ යුතුය. අනුෂංගිකව අස්තිත්වයක් විලම්භිත බදු වගකීම සහ විලම්භිත බදු වත්කම්, අපේක්ෂිත අයකර ගැනීමේ හෝ නිරවුල් කිරීමේ ක්‍රමයකට අනුරූප බදු අනුපාතයන් හා බදු පදනම් භාවිතා කරමින් මිනුම්කරණය කරයි. නිදසුන් ලෙස, අනාගත කාලපරිච්ඡේදයකදී ප්‍රාග්ධන ලාභයක් ලෙස බද්දට යටත්විය හැකි යයි අපේක්ෂා කෙරෙන ආදායම් අයිතමයන් හේතු කොට ගෙන තාවකාලික වෙනසක් උද්ගත වන්නේ නම් විලම්භිත බදු වැය ධාරණ අගය අයකර ගැනීමට අනුරූපි වන ප්‍රාග්ධන ලාභ බදු අනුපාතය සහ බදු පදනම භාවිතා කරමින් මිණුම්කරණ කළ යුතුය.

29.30 විලම්භිත බදු වගකීමක් හෝ විලම්භිත බදු වත්කමක් 17 වන කොටසේ සඳහන් ප්‍රත්‍යාගණන ආකෘතිය භාවිතාකරමින් මිණුම්කරණය කරන ලද, ක්‍ෂය නොකරන වත්කමක් නිසා උද්ගත වන්නේ නම්, විලම්භිත බදු වගකීම් හෝ විලම්භිත බදු වත්කම්, මිණුම්කරණය ක්‍ෂය නොකරනු ලබන වත්කම විකිණීමෙන් ධාරණ අගය අයකර ගැනීමේදී ඇතිවන බදු අනුෂංගිකය පිළිබිඹු විය යුතුය. සාධාරණ අගය මත මිණුම්කරණය කෙරෙන ආයෝජන දේපලක් නිසා විලම්භිත බදු වගකීමක් හෝ වත්කමක් උද්ගත වන්නේ නම්, දේපළ ආයෝජනයෙහි ධාරණ අගය විකිණීමෙන් අයකර ගත හැකිය යන බැහැර කළ හැකි විශ්වාසයක් තිබේ. එමනිසා විශ්වාසය බැහැර නොකරන්නේ නම් විලම්භිත බදු වගකීම හෝ විලම්භිත බදු වත්කම, මිණුම්කරණය කිරිම දේපළ ආයෝජනයේ ධාරණ අගය විකිණීමෙන් මඟින් අයකර ගැනීමේදී බදු අනුෂංගික තත්වය පිළිබිඹු විය යුතුය. ආයෝජන දේපළ ක්‍ෂය කළ හැකි නම් සහ විකිණීමෙන් නොව, ආයෝජන දේපළ අන්තර්ගත වී ඇති ආර්ථික ප්‍රතිලාභයන් සම්පූර්ණයෙන්ම පරිභෝජනය කිරීම අරමුණක් ඇති ව්‍යාපාර ආකෘතියක් මත එය රඳවා ගෙන තිබේ නම් මෙම විශ්වාසය බිඳ වැටෙනු ඇත. විශ්වාසය බිඳ වැටෙන්නේ නම්, 29.29 ඡේදයේ අවශ්‍යතාවයන් අනුගමනය කළ යුතුය.

29.31 සෑම වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයක් අවසානයේ දීම, විලම්භිත බදු වත්කමේ ධාරණ අගය සමාලෝචනය කළ යුතුය. විලම්භිත බදු වත්කමෙහි, ධාරණ අගය පිළිගනු ලැබූ බදු වත්කමෙහි ප්‍රතිලාභයෙන් අර්ධ වශයෙන් හෝ මුළුමනින්ම උපයෝගි කරගත හැකි ප්‍රමාණවත් බද්දට යටත්වන

ලාභයක් තිබීම, තව දුරටත් සම්භාවිත නොවන ප්‍රමාණයට අස්තිත්වයක් විසින් විලම්භිත බදු වත්කමක ධාරණ අගය අඩුකළ යුතුය. ප්‍රමාණවත් බද්දට යටත් ලාභයක් ඇතිවීමේ සම්භාවිතයේ ප්‍රමාණයට එවැනි අඩු කිරිමක් ප්‍රතිවර්තනය කළ යුතුය.

**ප්‍රවර්තන සහ විලම්භිත බදු දෙවර්ගයට මිණුම්කරණය කිරිම**

29.32 ප්‍රවර්තන හෝ විලම්භිත බදු වත්කම් හා වගකිම් අස්තිත්වයක් විසින් වට්ටම් නොකළ යුතුය.

29.33 අස්තිත්වයේ කොටස්හිමියන්ට ලාභාංශ වශයෙන් ලාභ හෝ රඳවාගත් ඉපයීම් අර්ධ වශයෙන් හෝ සහමුලින්ම ගෙවන්නේ නම් සමහර අධිකරණ බල ප්‍රදේශයන්හි ආදායම් බදු ඉහළ හෝ පහත අනුපාතයන් අනුව ගෙවිය යුතුය. වෙනත් අධිකරණ බල ප්‍රදේශයන්හි අස්තිත්වය කොටස් හිමියන්ට ලාභ හෝ රඳවාගත් ඉපයීම් අර්ධ වශයෙන් හෝ සහමුලින්ම ගෙවන්නේ නම් ආදායම් බදු ආපසු ගෙවීම හෝ ගෙවීම් කළ හැකිය. ලාභාංශයක් ගෙවීමට ඇති වගකීම අස්තිත්වය විසින් හඳුනාගන්නා තුරු නොබෙදු ලාභ වලට අදාල බදු අනුපාතය මත මෙම අවස්ථා ද්විත්යේදීම ප්‍රවර්තන සහ විලම්භිත බදු මිණුම්කරණය කළ යුතුය. අස්තිත්වය විසින් ලාභාංශ ගෙවීමට වගකීම හඳුනාගන්නා විටකදී, ජනිත වන ප්‍රවර්තන හෝ විලම්භිත බදු වගකීම (වත්කම) සහ සබැඳි **බදු වියදම** (ආදායම) හඳුනාගත යුතුය.

**ලාභාංශ මත රඳවා ගැනීමේ බද්ද**

29.34 අස්තිත්වයක් විසින් කොටස්හිමියන්ට ලාභාංශ ගෙවන විටකදී, ලාභාංශයෙන් කොටසක් කොටස්හිමියන් වෙනුවෙන්, බදු අධිකාරින්ට ගෙවීමට සිදුවිය හැකිය. බදු අධිකාරින්ට ගෙවු හෝ ගෙවිය යුතු එවැනි මුදලක් ලාභාංශයේ කොටස් වශයෙන් ස්කන්ධයට අයකරනු ලැබේ.

**ඉදිරිපත් කිරිම**

**විස්තීරණ ආදායම් සහ ස්කන්ධයෙහි වෙන් කිරිම**

29.35 අස්තිත්වයන් විසින්, බදු වියදම එකතු විස්තීර්ණ ආදායමෙහි එම සංචරකයේම (එනම් පවත්නා මෙහෙයුම් නවතා දමන ලද මෙහෙයුම් හෝ අනිකුත් විස්තීරන ආදායම්) හෝ ස්කන්ධයෙහි බදු වියදම ජනිත වු ගණුදෙනු හෝ අනිකුත් සිදුවිම ලෙස හඳුනාගත යුතුය.

**ජංගම / ජංගම නොවන ප්‍රභේදය**

29.36 අස්තිත්වයක් විසින්, එහි මුල්‍ය තත්වය ප්‍රකාශනයේ ජංගම සහ ජංගම නොවන වත්කම් සහ ජංගම හා ජංගම නොවන, වගකීම් වෙනම වර්ගීකරණයක් ලෙස ඉදිරිපත් කරන විට විලම්භිත බදු වත්කම් (වගකීම්) ජංගම වත්කම් (වගකීම්) ලෙස වර්ගීකරණය නොකළ යුතුය.

**හිලව් කිරිම**

29.37 අස්තිත්වයට හිලව් කිරිම සඳහා නීතිමය අයිතියක් තිබේ නම් හා ශුද්ධ පදනම මත එකවර නිරවුල් කිරිමට හෝ එක්වරම වත්කම උපලබ්ධිකර, වගකීම නිරවුල් කිරීමට එයට හැකි බව අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් නොදරා පෙන්විය හැකි නම් පමණක් ජංගම බදු වත්කම් සහ ජංගම බදු වගකිම් හිලව් කිරිම හෝ විලම්භිත බදු වත්කම් හා විලම්භිත බදු වගකීම් හිලව් කිරිම කළ හැකිය.

**හෙළිදරව් කිරීම්**

29.38 අස්තිත්වයක් විසින් හඳුනාගන්නා ලද ගණුදෙනු හා අනෙකුත් සිදුවීම් වල ස්වභාවය ජංගම හා විලම්භිත බදු අනුෂංගිකත්වය මුල්‍ය ප්‍රකාශයන් භාවිතා කරන්නන්ට ඇගයීමට හැකිවන ආකාරයේ තොරතුරු හෙළිදරව් කළ යුතුය.

29.39 බදු වියදම් (ආදායම්) වල ප්‍රධාන සංචරකයන් වෙන් වෙන්වම අස්තිත්වයක් විසින් හෙළිදරව් කළ යුතුය. බදු වියදම (ආදායම) හි එවැනි සංරචකයන්ට.

(අ) ප්‍රවර්තන බදු වියදම (ආදායම)

(ආ) පූර්ව කාලයන් වෙනුවෙන්, පවත්නා කාලයේදි පිළිගන්නා ලද ප්‍රවර්තන බදු වෙනුවෙන් ඇති ගැලපීම්

(ඇ) තාවකාලික වෙනස්වීම් වල සම්භාවය ප්‍රතිවර්තනය හා සබැඳි විලම්භිත බදු වියදම (ආදායම)

(ඈ) බදු අනුපාතයන් වෙනස්වීම් හෝ නව බදු පැනවීම් හා සබැඳි විලම්භිත බදු වියදම (ආදායම)

(ඉ) බදු වියදම අඩුකර ගැනීම සඳහා භාවිතා කරන ලද, පූර්වයෙන් හඳුනානොගන්නා ලද බදු අලාභයන්, බදු බැර හෝ පූර්ව කාලයක තාවකාලික වෙනස්වීමක් නිසා උද්ගත වන ප්‍රතිලාභය

(ඊ) අස්තිත්වයේ හෝ එහි කොටස්හිමියන්ගේ බදු තත්වය වෙනස්වීම නිසා උද්ගත වන විලම්භිත බදු වියදම් (ආදායම්) ගැලපිම්

(එ) 29.31 ඡේදය අනුව, විලම්භිත බදු වත්කමක් කපා හැරීමේදී හෝ පූර්වයෙන් කරන ලද කපා හැරීමක් ප්‍රතිවර්තනය කිරීමේදී උද්ගත වන විලම්භිත බදු වියදම (ආදායම)

(ඒ) පූර්ව කාලයන්ට බලපාන ලෙස ගිණුම් ගතකළ නොහැකි නිසා 10 වන කොටස ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇස්තමේන්තු හා වැරදිවලට අනුකූලව ලාභයෙහි හෝ අලාභයෙහි ඇතුළත් කරන ලද, ගිණුම්කරණ ප්‍රතිපත්තීන් වෙනස්කිරිම් හා වැරදි වලට සබැඳි බදු වියදම (ආදායම)

ඇතුළත් විය හැකිය.

29.40 අස්තිත්වයක් විසින්, පහත සඳහන් කරුණු වෙන වෙනම හෙළිදරව් කළ යුතුය.

(අ) අනිකුත් විස්තීරණ ආදායම් අයිතමයන් ලෙස හඳුනාගන්නා ලද, අයිතමයන්ට සබැඳි සමාහාර ප්‍රවර්තන හා විලම්භිත බදු

(ආ) ස්කන්ධයට ඍජුවම අය කරන ලද හෝ බැර කරන ලද, අයිතමයන්ට සබැඳි සමාහාර ප්‍රවර්තන හා විලම්භිත බදු

(ඇ) අදාළ බදු අනුපාතය අනුව ගුණිත කරන ලද බදු වියදම (ආදායම) සහ ගිණුම්කරණ ලාභය අතර ප්‍රමාණාත්මක වෙනස්කමක් ගැන කරුණු පැහැදිලි කිරිමක්; නිදසුන් ලෙස, බද්දෙන් නිදහස් ආදායම් හෝ බද්දට යටත් ලාභය (බදු පාඩුව) අඩු කිරිමට නොහැකි වියදම් වැනි දෑ හේතු කොට ගෙන එවැනි වෙනස්වීම් උද්ගත විය හැකිය.

(ඈ) පෙර වාර්තා කාලය හා සසඳන විට බදු අනුපාතයේ (යන්හි) වෙනස්කම් ගැන කරුණු පැහැදිලි කිරීමක්

(ඉ) සෑම වර්ගයකම බදු වෙනස්කම් හා සෑම වර්ගයකම භාවිතා නොකරන ලද, බදු අලාභ යන් හා බදු බැර සඳහා,

(i) වාර්තාකරන කාලය අවසානයේ දී විලම්භිත බදු වගකීම් හා විලම්භිත බදු වත්කම් සහ
(ii) අදාළ කාලය තුළ විලම්භිත බදු වගකීම් හා විලම්භිත බදු වත්කම් හි වෙනස්කම් පිළිබඳ විග්‍රහයන්

(ඊ) මූල්‍ය තත්ව ප්‍රකාශනයේ, විලම්භිත බදු වත්කමක් පිළිනොගන්නා ලද, අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් භාවිතා නොකරන ලද බදු අලාභයන් භාවිතා නොකරන ලද බදු බැර වල මුදල සහ (අවසන් වන දිනයන් ඇතොත් එය)

(එ) 29.33 ඡේදයේ දක්වා ඇති තත්වයන් යටතේ කොටස් හිමියන්ට ලාභාංශ ගෙවීමෙන් ඇතිවිය හැකි බදු අනුෂංගිකත්වයේ ස්වභාවය ගැන කරුණු පැහැදිලි කිරීමක්.

29.41 අස්තිත්වයක් බදු වත්කම් සහ වගකීම් ශුද්ධ පදනමක් අනුව නිරවුල් කිරිමට හෝ එකවරට උපලබ්ධි කර ගැනීමට අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් නොදරා පෙන්වීමට අපොහොසත් වන නිසා 29.37 ඡේදය ප්‍රකාරව බදු වත්කම් සහ වගකීම් හිලව් නොකරන්නේ නම් අස්තිත්වය, හිලව් නොකර ඇති මුදල් ප්‍රමාණය සහ අවශ්‍යතාවය භාවිතා කිරිමේ දී අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් දැරිමට සිදු විය හැකි හේතුන් හෙළිදරව් කළ යුතුය.

## 30 වැනි කොටසට සංශෝධනයන්, විදේශ ව්‍යවහාර මුදල් පරිවර්තනය

30.1 සහ 30.18 ඡේදයන් සංශෝධනය කර ඇත. ඉවත් කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**මෙම කොටසේ විෂය පථය**

30.1 අස්තිත්වයකට විදේශ ක්‍රියාකාරකම් දෙයාකාරයකින් පවත්වාගෙන යා හැකිය. එයට විදේශ ව්‍යවහාර මුදලෙන් කෙරෙන ගණුදෙනු හෝ **විදේශීය ක්‍රියාකාරකම්** තිබිය හැකිය. ඊට අමතරව අස්තිත්වය එහි මූල්‍ය ප්‍රකාශන විදේශීය ව්‍යවහාර මුදලෙන් ඉදිරිපත් කරනු විය හැකිය. අස්තිත්වයක් විසින් විදේශීය ව්‍යවහාර මුදල් ගණුදෙනු සහ විදේශීය ක්‍රියාකාරකම් එහි මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කළයුතු අන්දමත්, මූල්‍ය ප්‍රකාශන **ඉදිරිපත් කරනු ලබන ව්‍යාවහාර මුදල්වලට** පරිවර්තනය කරන අන්දමත්, මෙම කොටසින්

නියම කරනු ලබයි. ~~විදේශ ව්‍යවහාර මුදල්වලින් නම් කෙරෙන~~ නියත විදේශ විනිමය අනුපාතයක වෙනස්විමක් මඟින් එහි අගය ව්‍යුත්පන්න වන (උදාහරණ ලෙස විදේශීය ව්‍යවහාර මුදල් ඉදිරි විනිමය ගිවිසුම්) **මූල්‍ය සාධන පත්‍ර** සහ විදේශ ව්‍යවහාර මුදලෙන් නම් කෙරෙන ඉදිරිරැකුම් අයිතමයන් ගිණුම්කරණය ~~11 වැනි කොටස මූලික මූල්‍ය සාධන පත්‍ර සහ~~ 12 වැනි කොටසේ අනෙකුත් මූල්‍ය සාධන පත්‍ර නිකුතුව යටතේ කටයුතු කෙරේ.

**ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල් වර්ගයට පරිවර්තනය කිරීම**

30.18 ක්‍රියාකාරී ව්‍යවහාර මුදල් වර්ගය අති උද්ධමන ආර්ථිකයක ව්‍යවහාර මුදල් වර්ගය නොවේ. අස්තිත්වයක් එහි ප්‍රතිඵල සහ මූල්‍ය තත්වය පහත සඳහන් ක්‍රියාපටිපාටිය භාවිතා කරමින් වෙනත් ඉදිරිපත් කිරීම් ව්‍යවහාර මුදල් වර්ගයකට පරිවර්තනය කළ යුතුය.

(අ) ........

(ආ) ප්‍රතිඵලය වන සියලුම විනිමය වෙනස්කම් අනෙකුත් විස්තීර්ණ ආදායමෙන් හඳුනාගත යුතු අතර ස්කන්ධයේ සංචරකයන් ලෙස වාර්තා කළ යුතුය. ඒවා පසුව ලාභයට හෝ අලාභයට ප්‍රතිවර්ගීකරණය නොකළ යුතුය.

## 31 වැනි කොටසට සංශෝධනයන් අති උද්ධමනය

31.8 - 31.9 ඡේදයන් සංශෝධනය කර ඇත. ඉවත් කරන ලද පාඨයන් කපාහැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**මූල්‍ය තත්ව ප්‍රකාශනය**

.......

31.8 අනෙකුත් සියළුම වත්කම් සහ වගකීම් මූල්‍ය නොවන ඒවා වේ.

(අ) .......

(ආ අ) සමහර මූල්‍ය නොවන වත්කම්, අත්පත්කරගත් හෝ වාර්තාකරන දිනයක නොවන (උදාහරණ ලෙස පෙර දිනයක ප්‍රත්‍යාගණනය කරන ලද දේපළ, පිරියත සහ උපකරණ) අගයන් මත ඉදිරියට ගෙනයන ලැබේ. මෙවැනි අවස්ථාවලදී ඉදිරියට ගෙන යන අගයන් ප්‍රත්‍යාගණන දිනයේ සිට ප්‍රතිප්‍රකාශ කරනු ලැබේ.

(ඇ) .......

31.9 මෙම කොටස ව්‍යවහාර කරන ප්‍රථම කාලපරිච්ඡේදය ආරම්භයේදී, රඳවාගත් ඉපැයීම් සහ ප්‍රත්‍යාගණන අතිරික්තයක් ඇතොත් හැර **ස්කන්ධ** සංචරකය සංචරක දායක වූ හෝ වෙනත් ආකාරයකින් පැන නැගිණු දිනවල පොදු මිල දර්ශකයක් භාවිතාකර නැවත ප්‍රකාශ කළ යුතුය. පූර්ව කාලපරිච්ඡේදයන්හි ප්‍රත්‍යාගණන අතිරික්තයන් ඉවත් කෙරේ. නැවත ප්‍රකාශ කළ රඳවාගත් ඉපැයීම් නැවත ප්‍රකාශ කළ මූල්‍ය තත්ව ප්‍රකාශයේ සියළුම වෙනස් වටිනාකම් වලින් උපදවෙයි.

## 33 වැනි කොටසට සංශෝධනයන් සම්බන්ධිත පාර්ශව හෙළිදරව් කිරීම්

33.2 ඡේදයන් සංශෝධනය කර ඇත. ඉවත්කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**සම්බන්ධිත පාර්ශව නිර්වචනය කිරීම**

33.2 සිය මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන අස්තිත්වයක් (වාර්තාකරන අස්තිත්වයට) සම්බන්ධ පුද්ගලයෙක් හෝ අස්තිත්වයක් සම්බන්ධිත පාර්ශවයක් වේ.

(අ) පුද්ගලයෙක් හෝ **එම පුද්ගලයාගේ පවුලේ සමීප සාමාජිකයෙක්** වාර්තාකරන අස්තිත්වයට සම්බන්ධිත වන්නේ,

(i) ........

(ii) වාර්තාකරන අස්තිත්වය කෙරෙහි පාලනය හෝ බද්ධ පාලනය තිබීම, හෝ,

(iii) වාර්තාකරන අස්තිත්වය කෙරෙහි ~~බද්ධ පාලන බලයක් හෝ~~ සැලකිය යුතු බලපෑමක් කළ හැකිවීම ~~හෝ එහි සැලකිය යුතු ඡන්ද බලයක් තිබීම.~~

(ආ) පහත දැක්වෙන කවර හෝ කොන්දේසියක් ව්‍යවහාර වන විට අස්තිත්වයක් වාර්තාකරන අස්තිත්වයට සම්බන්ධිත වෙයි.

(i) ........

(ii) එක් අස්තිත්වයක් අනෙක් අස්තිත්වයේ ආශ්‍රිතයක් හෝ බද්ධ ව්‍යාපාරයක් වීම (හෝ අනෙක් අස්තිත්වය සාමාජිකත්වය දරන සමූහයක සාමාජිකයෙකුගේ ආශ්‍රිතයක් හෝ බද්ධ ව්‍යාපාරයක් වීම.)

(iii) අස්තිත්ව දෙකම, එකම තුන්වැනි අස්තිත්වයට බද්ධ ව්‍යාපාර වීම

(iv) එක් අස්තිත්වයක් තුන්වැනි අස්තිත්වයක බද්ධ ව්‍යාපාරයක් වීම සහ අනෙක් අස්තිත්වය තුන්වැනි අස්තිත්වයේ ආශ්‍රිතයක් වීම.

(v) වාර්තා කරනු ලබන අස්තිත්වයෙහි හෝ වාර්තා කරන අස්තිත්වයට සම්බන්ධිත අස්තිත්වයක සේවකයින්ගේ ප්‍රතිලාභ සඳහා අස්තිත්වය පශ්චාත් ප්‍රතිලාභ සේවා සැලැස්මක් වී වාර්තාකරන අස්තිත්වයම එවැනි සැලැස්මක් වන විට අනුග්‍රහක සේවායෝජකයෝද ~~සැලැස්මට~~ වාර්තාකරන අස්තිත්වයට සම්බන්ධිත වන්නේය.

(vi) .......

(vii) ~~(අ) (i) හි හඳුනාගනු ලබන පුද්ගලයකුට අස්තිත්වයෙහි සැලකිය යුතු ඡන්ද බලයක් තිබීම~~ අස්තිත්වය හෝ එය කොටසක් වන සමූහයක ඕනෑම සාමාජිකයකු වාර්තාකරන අස්තිත්වයට හෝ වාර්තාකරන අස්තිත්වයේ මව් සමාගමට ඉහළ කළමනාකාරිත්ව පුද්ගල සේවා සැපයීමක් සිදු කිරීම.

(viii) (අ) (ii) හි හඳුනාගනු ලබන පුද්ගලයකුට අස්තිත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදුකළ හැකිවීම හෝ ~~එහි සැලකිය යුතු ඡන්ද බලයක් තිබීම,~~ අස්තිත්වයක් හෝ (අස්තිත්වයේ මව් සමාගමේ) ඉහළ කළමනාකාරිත්වයේ සාමාජිකයකු වීම.

~~(ix) පුද්ගලයෙකුට හෝ ඒ පුද්ගලයාගේ පවුලේ සමීප සාමාජිකයකුට අස්තිත්වය කෙරෙහි සැලකිය යුතු බලපෑමක් සිදුකළ හැකි වීම හෝ එහි සැලකිය යුතු ඡන්ද බලයක් තිබීම යනාදි දෙකම සහ වාර්තාකරන අස්තිත්වය කෙරෙහි බද්ධ පාලනයක් තිබීම.~~

~~(x) අස්තිත්වය හෝ අස්තිත්වයේ පරිපාලනයක් ප්‍රමුඛ කළමනාකාරිත්වයෙහි සාමාජිකයකුට හෝ ඒ සාමාජිකයාගේ පවුලෙහි සමීප සාමාජිකයකුට වාර්තාකරන අස්තිත්වය කෙරෙහි පාලනයක් හෝ බද්ධ පාලනයක් තිබීම හෝ එහි සැලකිය යුතු ඡන්ද බලයක් තිබීම.~~

## 34 වැනි කොටසට සංශෝධනයන් විශේෂිත ක්‍රියාකාරකම්

34.7 ඡේදය සහ 34.10 - 34.11 ඡේදයන් සහ ඒවායේ සබැඳි ශීර්ෂ පාඨයන් සංශෝධනය කර ඇත. 34.11 අ - 34.11 ඊ ඡේදයන් එකතු කර ඇත. ඉවත්කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

**හෙළිදරව් කිරීම් - සාධාරණ අගය ආකෘතිය**

34.7 සාධාරණ අගයට මිනුම් කළ ජෛව වත්කම් සඳහා අස්තිත්වය පහත සඳහන් හෙළිදරව් කිරීම් කළ යුතුය.

(අ) ......

(ඉ) ප්‍රවර්තන කාලපරිච්ඡේදය ආරම්භයත් අවසානයත් අතර ජෛව වත්කම්වල ධාරණ අගයෙහි වෙනස්කම් සැසඳුමත්, සැසඳුමෙහි ඇතුළත් විය යුතු දෑ,

(i) .......

මෙම සැසඳුම පූර්ව කාලපරිච්ඡේදයන් සඳහා ඉදිරිපත් කිරීම අවශ්‍ය නොවේ.

**හෙළිදරව් කිරීම් - පිරිවැය ආකෘතිය**

34.10 පිරිවැය ආකෘතිය භාවිතකර මිනුම් කළ ජෛව වත්කම් සඳහා පහත සඳහන් දෑ හෙළිදරව් කළ යුතුය.

(අ) ......

(ආ) සාධාරණ අගය අනිසි පිරිවැය හෝ පරිශ්‍රමයක් නොදරා විශ්වසනීය ලෙස මිනුම් කළ නොහැක්කේ මන්ද යන වග පැහැදිලි කිරීමක්

(ඇ) ......

**~~නිස්සාරණ ක්‍රියාකාරකම්~~ ඛණිජ සම්පත් ගවේෂණ සහ ඇගැයීම**

34.11 ඛණිජ සම්පත් ඇගැයීමෙහි ~~හෝ නිස්සාරණයෙහි~~ හෝ ගවේෂණවල නිරතවන මෙම SLFRS භාවිතාකරන අස්තිත්වයක් (~~නිස්සාරණ ක්‍රියාකාරකම්~~) ~~නිස්සාරණ ක්‍රියාකාරකම්වල භාවිතා සහ ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් අත්පත් කර ගැනීම හෝ සංවර්ධනය කිරීමේ වියදම් පිළිවෙළින් 17 කොටස දේපළ, පිරියත සහ උපකරණ සහ 18 වැනි කොටස කීර්තිනාමය හැර~~ 10.4 ඡේදය අනුකූලව ගවේෂණ සහ ඇගැයීම් සඳහා කුමන වියදම් හඳුනාගත යුතු ද යන්න නිශ්චිත කෙරෙන ගිණුම් ප්‍රතිපත්තියක් තෝරාගත යුතු අතර, එය සංගතව භාවිතා කළ යුතුය. ~~අයිතමයන් කොටස් වශයෙන් ගැලවීමට හෝ ඉවත් කිරීමට හෝ වැඩබිම් යථා තත්වයට පත් කිරීම අස්තිත්වයට බැඳීමක් ඇතිවිටක එවැනි බැඳීම් සහ පිරිවැය 17 වැනි කොටස් සහ 21 වැනි කොටස ප්‍රතිපාදන සහ අසම්භාවිතා අනුව ගිණුම්ගත කරනු ලබයි.~~ වත්කම් ගවේෂණය සහ ඇගැයීම හඳුනාගැනීම සහ මිණුම්කරණය සඳහා එහි ගිණුම් ප්‍රතිපත්ති 10.5 ඡේදය භාවිතා කිරීමෙන් අස්තිත්වයක් නිදහස් කෙරෙනු ඇත.

34.11 අ. වත්කම් ගවේෂණය සහ ඇගැයීමේ ආරම්භක මිණුම්කරණයේදී ඇතුලත් කළ හැකි වියදම්වලට පහත සඳහන් දෑ උදාහරණ වේ. (ලැයිස්තුව අවසාන එකක් නොවේ.)

(අ) ගවේෂණ හිමිකම් අත්පත්කර ගැනීම

(ආ) ස්ථල විද්‍යා, භූ විද්‍යා, භූ රසායන හා භූ භෞතික අධ්‍යයනයන්

(ඇ) ගවේෂිත කැණීම්

(ඈ) කැපීම්,

(ඉ) නියැදි කිරීම් සහ

(ඊ) ඛණිජ සම්පත් ඇගයීමේ තාක්ෂණික යෝග්‍යතාවය සහ වාණිජ ස්වශක්තතාවය ඇගැයීමට සබැඳි කටයුතු

ඛණිජ සම්පත් සංවර්ධනය කිරීම හා සබැඳි වියදම් ගවේෂණ සහ ඇගැයීමේ වත්කම් ලෙස හඳුනානොගනු ඇත.

34.11 ආ. ගවේෂණ සහ ඇගැයීමේ වත්කම්, ආරම්භක හඳුනාගැනීමේදී පිරිවැය මත මිණුම්කරණය කළ යුතුය. ආරම්භක හඳුනාගැනීමෙන් පසු අස්තිත්වයක් විසින් 34.11 ඇ - 34.11 ඊ ඡේදයන්ට යටත්ව, ගවේෂණ සහ ඇගැයීමේ වත්කම් සඳහා අත්පත් කර ගන්නා ලද වත්කම් වල ස්වභාවය අනුව 17 වන කොටස දේපළ, පිරියත හා උපකරණ හා 18 වන කොටස කීර්තිනාමය හැර වෙනත් අස්පෘශ්‍ය වත්කම් භාවිතා කළ යුතුය. අයිතමයන් කොටස් වශයෙන් ගැලවීමට හෝ ඉවත්කිරීමට හෝ වැඩබිම් යථා තත්වයට පත්කිරීමට අස්තිත්ත්වයට බැඳීමක් තිබේ නම්, එවැනි බැඳීමක් සහ පිරිවැය 17 වැනි කොටස සහ 21 වැනි කොටස ප්‍රතිපාදන සහ අසම්භාවිතා අනුව ගිණුම්ගත කරනු ලබයි.

34.11 ඇ. ගවේෂණ සහ ඇගැයීමේ වත්කම් වල ධාරණ අගය, ඒවායේ අයකර ගත හැකි අගය අභිබවා යන බවට කරුණු සහ අවස්ථා වලින් පෙනේනම්, ගවේෂණ සහ ඇගැයීමේ වත්කම් හානිකරණය සඳහා තක්සේරු කළ යුතුය. උද්ගත වන හානිකරණ අලාභයක් ඇතොත්, අස්තිත්වයක් 34.11 ඊ ඡේදයේ දැක්වෙන ලෙසට හැර, 27 වැනි කොටස අනුකූලව මිණුම්කරණය, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම කළ යුතුය.

34.11 ඈ. ගවේෂණ සහ ඇගැයීම් වත්කම් සඳහා පමණක්, හානිකරණය විය හැකි ගවේෂණ සහ ඇගැයීම් වත්කමක් හඳුනාගැනීමේදී 27.7 - 27.10 ඡේදය වෙනුවට, 34.11 ඉ ඡේදය භාවිතා කළ යුතුය. 34.11 ඉ ඡේදය 'වත්කම්' යන පදය යොදන නමුත් එය සමානව වෙන්වූ ගවේෂණ සහ ඇගැයීමේ වත්කම් හෝ මුදල් ජනන ඒකකයකට ද අදාල වේ.

34.11 ඉ. අස්තිත්වයක් ගවේෂණ සහ ඇගැයීමේ වත්කම් හානිකරණය සඳහා පරීක්ෂා කළයුතු බව පහත දැක්වෙන කරුණු සහ අවස්ථාවන් එකක් හෝ කීපයකින් පෙන්නුම් කෙරේ. (ලැයිස්තුව අවසාන එකක් නොවේ.)

(අ) නිශ්චිත ප්‍රදේශයක අස්තිත්වයට ගවේෂණය සඳහා හිමිකම් ලැබෙන කාලය අහෝසි වී තිබීම හෝ නුදුරු අනාගතයේදී අහෝසි වීම සහ අළුත් කිරීමක් බලාපොරොත්තු විය නොහැකි වීම.

(ආ) නිශ්චිත ප්‍රදේශයක ඛණිජ සම්පත් සඳහා වැඩි දුරටත් ගවේෂණය කිරීම හෝ ඇගැයීම සඳහා සත්තාවි වියදම් අයවැය නොකිරීම හෝ සැලසුම් නොකිරීම

(ඇ) නිශ්චිත ප්‍රදේශයක ඛණිජ සම්පත් සඳහා ගවේෂණය කිරීමෙන් හෝ ඇගැයීමෙන් වාණිජ ශක්‍යතාවයක් ඇති ප්‍රමාණයක සම්පත් සොයා ගත නොහැකි වීම සහ නිශ්චිත ප්‍රදේශයෙහි එවැනි කර්තව්‍යයන් නවත්වා දැමීමට අස්තිත්වය තීරණය කර තිබීම.

(ඈ) නිශ්චිත ප්‍රදේශයෙහි සංවර්ධන කටයුතු ඉදිරියට ගෙන යෑම විය හැකි නමුත් සාර්ථක සංවර්ධනයකින් හෝ විකිණීමකින් ගවේෂණ සහ ඇගැයීම් වත්කම්වල ධාරණ අගය සම්පූර්ණයෙන් අයකර ගැනීමට නොහැකි වන බවට ප්‍රමාණවත් දත්ත පැවතීම.

අස්තිත්වය හානිකරණ පරීක්ෂණයක් කර හානිකරණ අලාභයක් ඇතොත්, 27 වැනි කොටස අනුව හඳුනාගත යුතුය.

34.11 ඊ. අස්තිත්වය ගවේෂණ සහ ඇගැයීම් වත්කම් හානිකරණය තක්සේරුකිරීමේ අරමුණ සඳහා මුදල් ජනනය කරන ඒකකයන්ට හෝ මුදල් ජනනය කරන ඒකකයන් සමූහයකට ගවේෂණ සහ ඇගැයීම් වත්කම් විභාජනය කිරීමේ ගිණුම්කරණ ප්‍රතිපත්තියක් තීරණය කළ යුතුය.

## 35 කොටස වන කුම අ සඳහා SLFRS ට සංක්‍රාන්තියට සංශෝධනයන්

35.2 හා 35.9 - 35.11 ඡේදයන් සංශෝධනය කර ඇත. 35.12 අ ඡේදය එකතු කර ඇත. ඉවත් කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් යටින් ඉරි ඇඳ ඇත.

### මෙම කොටසේ විෂයපථය

35.2 ~~කුඩා සහ මධ්‍යම පරිමාණ අස්තිත්ව සඳහා SLFRS ප්‍රථමවරට තෝරා ගන්නකුවීමට අස්තිත්වයකට හැකිවන්නේ එක් වරක් පමණකි.~~ කු. ම. අ. සඳහා ශ්‍රී ලං.මු.වා.ප්‍ර පූර්ව වාර්තාකරණය කාලයන්හි යොදාගත් එහෙත් එහි ඉතා මෑතකදී නිකුත් කළ පූර්ව වාර්ෂික මූල්‍ය ප්‍රකාශනයන්හි කු. ම. අ. සඳහා ශ්‍රී ලං.මු.වා.ප්‍ර න් අනුගමනය කිරීම ගැන නිශ්චිත හා පැහැදිලි ප්‍රකාශයන් කර නොමැති විටකදී, අස්තිත්වය විසින් කු.ම. අ. සඳහා වන ශ්‍රී ලං.මු.වා.ප්‍ර න් භාවිතය කිසිවිටක නවතා නොමැති පරිදි මෙම පරිච්ඡේදය භාවිතා කිරීම හෝ 10 පරිච්ඡේදය වන ගිණුම්කරණ ප්‍රතිපත්ති, ඇස්තමේන්තු හි වැරදි අනුකූලව කු. ම. අ. සඳහා ශ්‍රී ලං.මු.වා.ප්‍ර න් අතීතයට බලපාන ලෙස භාවිතා කළ යුතුය. ~~කුඩා සහ මධ්‍ය පරිමාණ අස්තිත්වයක් සඳහා SLFRS භාවිතා කරන අස්තිත්වයක් වාර්තාකරන කාලපරිච්ඡේද එකකට හෝ වැඩි ගණනකට එය භාවිතා කිරීම නතර කරන්නේ නම් සහ අනතුරුව එය නැවතත් තෝරා ගැනීමට අවශ්‍යකරන්නේ නම් මෙම කොටසෙහි විශේෂිත නිදහස් කිරීම් සරල කිරීම් සහ අනෙකුත් අවශ්‍යතා එම නැවත තෝරාගැනීම සඳහා අදාළ නොවේ.~~ එවැනි අස්තිත්වයක් විසින්, මෙම පරිච්ඡේදය භාවිතා කිරීම තෝරා නොගන්නා විටකදී 10 කොටසේ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන්ට අමතරව, 35.12 අ ඡේදයේ හෙළිදරව් කිරීම් අවශ්‍යතාවයන් සපුරාලීම අවශ්‍ය වේ.

### සංක්‍රාන්ති දිනයේදී මූල්‍ය ප්‍රකාශනයන් සකස් කිරීමේ වැඩ පිළිවෙළ

35.9 මෙම SLFRS ප්‍රථමවරට තෝරාගැනීමේදී අස්තිත්වයක් එය විසින් පෙර වූ මූල්‍ය වාර්තාකරන රාමුව යටතේ, පහත සඳහන් ගණුදෙනු කවරක් හෝ සම්බන්ධයෙන් අනුගමනය කළයුතු ගිණුම්කරණය, අතීතයට බලපාන ලෙස වෙනස් නොකළ යුතුය.

(අ) ........

(ඊ) රජයේ ණය පළමුවරට භාවිතාකරන්නකු විසින්, මෙම ශ්‍රී ලං.මු.වා.ප්‍ර ට සංක්‍රාන්ති වන දිනයේදී පැවති රජයේ ණය සඳහා 11 කොටසේ වන මූලික මූල්‍ය සාධන පත්‍ර, 12 කොටසේ හා 24 කොටසේ වන රාජ්‍ය ප්‍රදාන අතීතයට බලපාන ලෙස භාවිතා කළ යුතුය. අනුෂංගිකව පළමුවරට භාවිතාකරන්නෙකු විසින් එහි පූර්ව පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රතිපත්තීන් (පො.පි.ගි.ප්‍ර) GAAP අනුව මෙම ශ්‍රී ලං.මු.වා.ප්‍ර ට අනුකූල වන පදනමක් යටතේ රජයේ ණය පිළිගැනීම හා ගිණුම්කරණය කර නොමැතිනම් එය ශ්‍රී ලං.මු.වා.ප්‍ර ට සංක්‍රාන්ති වන දිනයට ණය මුදලේ පො.පි.ගි.ප්‍ර. GAAP ධාරණ අගය, එම දිනයට ධාරණ අගය ලෙස පිළිගත යුතු අතර වෙළඳපල පොලී අනුපාතයන්ට පහළ පොලී අනුපාතයන් ඇති රජයේ ණය ප්‍රතිලාභයන් රාජ්‍ය ප්‍රදානයන් ලෙස පිළිනොගත යුතුය.

35.10 මෙම SLFRS සමග අනුකූලවන එහි ප්‍රථම මූල්‍ය ප්‍රකාශනය පිළියෙල කිරීමේ දී පහත දැක්වෙන නිදහස් කිරීම් එකක් හෝ කීපයක් භාවිතා කරනු විය හැකිය.

(අ) ......

(ඇ.අ) **සිදුවීමක් මත ඇති වූ සාධාරණ අගය මිනුම්කරණය සලකනු ලබන පිරිවැය** ලෙස ප්‍රථමවරට භාවිතාකරන්නෙකු යම්කිසි සිද්ධියක් නිසා උදාහරණ ලෙස, සැලසුම් සහගතවන විකිණීමක් අභිලාෂයෙන් ව්‍යාපාරය හෝ ව්‍යාපාරයෙන් කොටසක් අගය කිරීම එහි පූර්ව පො.පි.ගි.ප්‍ර ට අනුව සමහර හෝ සියළුම වත්කම් හා වගකීම් සාධාරණ අගය මත මිණුම්කරණය **සලකනු ලබන පිරිවැයක්** ලෙස ස්ථාපනය කර තිබිය හැකිය.

මිණුම්කරණ දිනය :

(i) මෙම ශ්‍රී ලං.මූ.වා.ප්‍ර දිනය හෝ ඊට පූර්ව දිනයක නම්, මිනුම්කරණ දිනයේ **සලකනු ලබන පිරිවැය** ලෙස සිද්ධියක් නිසා ඇතිවූ සාධාරණ අගය මිණුම්කරණය අස්තිත්වය විසින් භාවිතා කළ හැකිය.

(ii) මෙම ශ්‍රී ලං.මූ.වා.ප්‍ර ට සංක්‍රාන්තිවන දිනයට පසුව එහෙත් මෙම ශ්‍රී ලං.මූ.වා.ප්‍ර අනුකූලවන ප්‍රථම මූල්‍ය ප්‍රකාශනයන්ගෙන් ආවරණය වන කාලය තුල නම් සිද්ධිය වන අවස්ථාවේදී සිද්ධියක් නිසා ඇතිවන සාධාරණ අගය මිණුම්කරණය **සලකනු ලබන පිරිවැය** ලෙස භාවිතා කළ හැකිය. අස්තිත්වය විසින් මිණුම්කරණ දිනයේදී උද්ගතවන ගැලපීම් සෘජුවම රඳවාගත් ඉපයීම්වල (හෝ යෝග්‍ය වන්නේ නම් වෙනත් ස්කන්ධ ප්‍රවර්ගයක) පිළිගත යුතුය. මෙම ශ්‍රී ලං.මූ.වා.ප්‍ර ට සංක්‍රාන්තිවන දිනයේදී 35.10 (ඇ - ඇ) ඡේදයන්හි දක්වා ඇති නිර්ණායකයන් භාවිතා කරමින් හෝ මෙම කොටසේ අනිකුත් අවශ්‍යතාවයන්ට අනුකූලව එම වත්කම් හා වගකීම් මිණුම්කරණය කරමින් **සලකනු ලබන පිරිවැය** ස්ථාපනය කළ යුතුය.

(ඉ) ......

(ඊ) **වෙන්ව ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනයන්** අස්තිත්වය වෙන්ව ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනයන් පිළියෙල කරන විට එහි පරිපාලිතවල, ආශ්‍රිතවල හා බද්ධපාලනය කරන අස්තිත්ව වල ආයෝජනයන් එක්කෝ

(i) හානිපූර්ණය අඩුකළ පිරිවැයට ~~හෝ~~

(ii) ලාභයේ හෝ අලාභයේ හඳුනාගත් සාධාරණ අගයෙහි වෙනස්කම් ඇතුළත්ව **සාධාරණ අගයට** හෝ

(iii) 14.8 ඡේදයෙහි දැක්වෙන ක්‍රමවේදයන් අනුගමනය කරමින් ස්කන්ධ ක්‍රමය භාවිතා කර ගිණුම්කරණය කළයුතු බවට, 9.26 ඡේයෙන් අවශ්‍ය කෙරේ.

එවැනි ආයෝජනයන්, ප්‍රථමවරට තෝරාගන්නෙකු විසින් පිරිවැයට මනින්නේ නම් සංක්‍රාන්ති දිනයේ දී එය මෙම SLFRS වලට අනුව පිළයෙල කර ~~ආරම්භක මූල්‍ය තත්වය දැක්වෙන ප්‍රකාශනයෙහි~~ පහත එක් වටිනාකමකට මිණුම්කරණය කළ යුතුය.

(i) ......

(උ) ......

(ඌ) **විලම්භිත ආදායම් බද්ද** ප්‍රථමවරට තෝරාගන්නකු කුම අ. සඳහා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර ට සංක්‍රාන්තිවන දිනයේ සිට ඉදිරියට 29 කොටස භාවිතා කළ හැකිය. ~~එම විලම්භිත වත්කම් සහ වගකීම් වල හඳුනාගැනීම සඳහා අධික පිරිවැයක් හෝ ප්‍රයත්නයක් අවශ්‍යකරන ඕනෑම වත්කමක හෝ වගකීමක ධාරණ අගය සහ බදු පදනම අතර වෙනස්කම් සම්බන්ධයෙන් විලම්භිත බදු වත්කම් හෝ විලම්භිත බදු වගකීම් ප්‍රථමවරට තෝරා ගන්නකු SLFRS වලට සංක්‍රමනය වන දින හඳුනාගැනීම අවශ්‍ය නොවේ.~~

(i) ......

(න) **ගාස්තු නියාමනයන්ට යටත්වන ක්‍රියාන්විතයන්** ප්‍රථමවරට භාවිතාකරන්නෙකු **ගාස්තු නියාමනයන්ට** (එනම් ගණුදෙනුකරුවන්ට භාණ්ඩයක් හෝ සේවාවන් අධිකාරී බලය ඇති ආයතනයක් විසින් ස්ථාපනය කරන ලද මිල හෝ අනුපාතයන්ට) යටත්වන ක්‍රියාන්විතයක භාවිතා

වන දේපල පිරියත හා උපකරණ හෝ අස්පෘශ්‍ය වත්කම් දරන්නේ නම් සංක්‍රාන්ති දිනයේදි ඒවායේ **සලකනු ලබන පිරිවැය** ලෙස පූර්ව පො.පි.ගි.ප්‍ර. GAAP ධාරණ අගයන් තෝරාගත හැකිය. අස්තිත්වයක් විසින් මෙම ව්‍යතිරේඛය එක් අයිතමයක් සඳහා භාවිතාකරන්නේ නම් එය සියළුම අයිතමයන් සඳහා භාවිතා කිරීම අවශ්‍ය නොවේ. 27 වන කොටස අනුකූලව අස්තිත්වය විසින් මෙම ශ්‍රී ලං.මූ.වා.ප්‍ර ට සංක්‍රාන්තිවන දිනයේදි එම වත්කම් හානිකරණ පරීක්ෂණයට බඳුන් කළ යුතුය.

(ජ) **උග්‍ර අති උද්ධමනය** ප්‍රථමවරට භාවිතාකරන්නෙකුට උග්‍ර අති උද්ධමනයට භාජනය වූ ව්‍යවහාර මුදලක් තිබේනම්,

(i) මෙම SLFRS වලට සංක්‍රාන්ති වන දිනය **ව්‍යවහාර මුදල් සාමාන්‍ය තත්වයට පත් වූ** දිනයේ හෝ ඊට පසුනම් ව්‍යවහාර මුදල් සාමාන්‍ය තත්වයට පත්වීමේ දිනයට පූර්වයෙන් වූ සියළුම වත්කම් හා වගකීම් මෙම SLFRS වලට සංක්‍රාන්ති වන දිනයේ සාධාරණ අගය මත මිණුම්කරණය කිරීමට තෝරාගත හැකි අතර එම දිනයේදී එම වත්කම් හා වගකීම් වල **සලකනු ලබන පිරිවැය** ලෙස එම සාධාරණ අගය භාවිතා කළ හැකිය, සහ

(ii) ව්‍යාවහාර මුදල් සාමාන්‍ය තත්වයට පත්වීමේ දිනය මාස දොළහක සාපේක්ෂ කාලයට ඇතුලත් වන්නේ නම්, අස්තිත්වය විසින් මාස දොලහකට අඩුවන සාපේක්ෂ කාලයක් එම කෙටි කාලය සඳහා (3.17 ඡේදයන් නියම කරනු ලබන) සම්පූර්ණ මූල්‍ය ප්‍රකාශයන් සකස් කරන්නේ නම් භාවිතා කළ හැකිය.

35.11 35.7 ඡේදයන් අවශ්‍ය කෙරෙන ගැළපිලි එකක් හෝ කිහිපයක් සඳහා සංක්‍රමනය වන දින ~~ආරම්භක මූල්‍ය තත්ව ප්‍රකාශනය නැවත ප්‍රකාශ කිරීම~~ සකස් කිරීම අස්තිත්වයකට **ප්‍රායෝගික නොවන්නේ නම්** අස්තිත්වය එවැනි ගැලපිලි සඳහා 35.7 - 35.10 ඡේද එසේ කිරීම ප්‍රයෝගික වන වඩාත්ම කලින් වූ කාලපරිච්ඡේදය වෙනුවෙන් ව්‍යවහාර කළයුතු අතර ~~පසුගිය කාලපරිච්ඡේද වෙනුවෙන් ඉදිරිපත්කරන මෙම වලට අනුකූලව එහි මූල්‍ය ප්‍රකාශන ප්‍රථමවරට පිළියෙල කරන කාලපරිච්ඡේද සමඟ සැසඳිය නොහැකි~~ මූල්‍ය ප්‍රකාශන වග සඳහන් නැවත ප්‍රකාශ නොකළ දත්තයන් හඳුනාගත යුතුය. මෙම වලට අනුකූලව ~~ප්‍රථම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කරන කාලපරිච්ඡේදයට පෙර කිසියම් කාලපරිච්ඡේදයක් වෙනුවෙන්~~ මෙම මඟින් අවශ්‍ය කෙරෙන සැසඳීම් කාලපරිච්ඡේදයන් සඳහා ඒවාද ඇතුළුව කවර හෝ හෙළිදරව් කිරීමක් සැපයීම ප්‍රයෝගික නොවන්නේ නම් අතහැරීම හෙළිදරව් කළ යුතුය.

**හෙළිදරව් කිරීම**

**කු. ම. අ. සඳහා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර ට සංක්‍රාන්තිය වීම පැහැදිලි කිරීම්**

35.12 අ 35.2 ඡේදයේ විස්තර කෙරෙන පරිදි පූර්ව කාලයකදී කු. ම. අ. සඳහා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර භාවිතා කළ අස්තිත්වයක් විසින්

(අ) කු.ම. අ. සඳහා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර භාවිතා කිරීම නවතා දැමීමේ හේතූන්

(ආ) කු.ම. අ. සඳහා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර භාවිතා කිරීම නැවත පටන් ගැනීමේ හේතූන් සහ

(ඇ) මෙම කොටසට හෝ 10 වැනි කොටසට අනුකූලව අතීත කාලයට බලපාන ලෙස කුම අ සඳහා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර භාවිතා කර තිබේද යන්න හෙළිදරව් කළ යුතුය.

අ. උපග්‍රන්ථය එකතු කර ඇත.

**බලාත්මක දිනය හා සංක්‍රාන්තිය**

අ1. 2015 ජුනි මස නිකුත් කරන ලද ශ්‍රී ලංකා ගිණුම් ප්‍රමිතිය ( කු. ම. අ. සඳහා ශ්‍රී ලං.මූ.වා.ප්‍ර) ට 2015 සංශෝධනයන්, සංශෝධිත ඡේදයන් 1.3, 2.22, 2.47, 2.49 - 2.50, 4.2, 4.12, 5.4 - 5.5, 6.2 - 6.3, 9.1 - 9.3, 9.16, 9.18, 9.24 - 9.26, 9.28, 11.2, 11.4, 11.7, 11.9, 11.11, 11.13 - 11.15, 11.27, 11.32, 11.44, 12.3, 12.8 - 12.9, 12.23, 12.25, 12.29, 14.15, 15.21, 16.10, 17.5 - 17.6, 17.15, 17.31 - 17.32, 18.8, 18.20, 19.2, 19.11, 19.14 - 19.15, 19.23, 19.25 - 19.26, 20.1, 20.3, 21.16, 22.8 - 22.9, 22.15, 22.17 - 22.18, 26.1, 26.9, 26.12, 26.16 - 26.17, 26.22, 27.1, 27.6, 27.14, 27.30 - 27.31, 28.30, 28.41, 28.43, 30.1, 30.18, 31.8 - 31.9, 33.2, 34.7, 34.10 - 34.11, 35.2, 35.9 - 35.11 සහ පාරිභාෂික ශබ්ද මාලාව සංශෝධිත 29 කොටසේ සහ එකතු කරන ලද ඡේදයන් 1.7, 2.14 අ - 2.14 ඈ, 9.3අ - 9.3ඈ, 9.23අ, 10.10අ, 11.9අ - 11.9ආ, 17.15අ - 17.15ඈ,

17.33, 22.3අ, 22.15අ - 22.15ඇ, 22.18අ - 22.18ආ, 22.20, 26.1අ - 26.1ආ, 34.11අ - 34.11ඊ, 35.12අ සහ අ2 - අ3 අස්තිත්වයක් විසින් එම ඡේදයන් 2017 ජනවාරි 1 න් පසු වාර්ෂික කාලයන් සඳහා භාවිතා කළ යුතුය. 2 - 34 කොටස්වල සංශෝධනයන් අ2 ඡේදයන් දැක්වූ ආකාරයට 10 කොටස වන ගිණුම්කරණ ප්‍රතිපත්ති ඇස්තමේන්තු හා වැරදි අනුකූලව අතීතයට බලපාන ලෙස භාවිතා කළ යුතුය. කු. ම. අ. සඳහා ශ්‍රී ලං.මු.වා.ප්‍ර ට 2015 එම සංශෝධනයන් ඊට තුලින් ව්‍යවහාරකරණය සඳහා අවසර දේ. අස්තිත්වයක් විසින් කු. ම. අ. සඳහා ශ්‍රී ලං.මු.වා.ප්‍ර 2015 සංශෝධනයන් ඊට ප්‍රථම කාලයකදී භාවිතා කරන්නේ නම් එය ඒ බැව් හෙළිදරව් කළ යුතුය.

අ2. අස්තිත්වයකට ඕනෑම නව හෝ 2 - 34 කොටස් වල සංශෝධනයන්ගෙන් ප්‍රතිශෝධිත අවශ්‍යතාවයන් අතීතයට බලපාන ලෙස භාවිතා කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් එසේ කිරීම ප්‍රයෝගික වන සමීපතම කාලයේදී එම අවශ්‍යතාවයන් සපුරාලිය යුතුය. ඊට අමතරව අස්තිත්වයන්

(අ) කු. ම. අ. සඳහා ශ්‍රී ලං.මු.වා.ප්‍ර හි 2015 සංශෝධනයන් ප්‍රථමවරට භාවිතාකරන කාලපරිච්ඡේදය ආරම්භයේදීම ප්‍රතිශෝධිත 29 කොටස ඉදිරි කාලයන් සඳහා භාවිතා කිරීම තෝරාගත හැකිය.

(ආ) කු. ම. අ. සඳහා ශ්‍රී ලං.මු.වා.ප්‍ර හි 2015 සංශෝධනයන් ප්‍රථමවරට භාවිතාකරන කාලපරිච්ඡේදය ආරම්භයේදීම 19.11 ඡේදයෙහි සංශෝධනයන් ඉදිරි කාලය සඳහා ද භාවිතා කළ යුතුය. මෙම ඡේදය අදාල වන්නේ 19 කොටසේ විෂය පථයට ඇතුළත්වන ව්‍යාපාර සංයෝජනයන් අස්තිත්වයට තිබේ නම් පමණකි.

(ඇ) කු. ම. අ. සඳහා ශ්‍රී ලං.මු.වා.ප්‍ර හි 2015 සංශෝධනයන් ප්‍රථමවරට භාවිතාකරන කාලපරිච්ඡේදය ආරම්භයේදීම 2.49 - 2.50, 5.4, 17.15, 27.6, 27.30 - 27.31 සහ 31.8 - 31.9 ඡේදයන්ට සංශෝධනයන් හා 10.10අ, 17.15අ - 17.15ඈ සහ 17.33 නව ඡේදයන් ඉදිරිකාලය සඳහා ද භාවිතා කළ යුතුය. මේ ඡේදයන් අදාළ වනුයේ 17.15 ඡේදයට අනුකූලව ප්‍රත්‍යාගණන ආකෘතිය දේපළ පිරියත හා උපකරණ ඕනෑම වර්ගයකට අස්තිත්වය විසින් භාවිතා කරන්නේ නම් පමණකි.

අ3. අ2 භාවිතා කිරීමේදී මූල්‍ය ප්‍රකාශයන්හි කුමන මුදල් ප්‍රමාණයන් ප්‍රතිප්‍රකාශ නොකර තිබේදැයි අස්තිත්වය විසින් හැඳින්විය යුතුය.

**පාරිභාෂික පද මාලාවට සංශෝධනයන්**

පාරිභාෂික ශබ්ද මාලාව ආ උපග්‍රන්ථයෙහි ස්ථාපනය කර ඇත පෙන්වා ඇත්තේ සංශෝධනය කරන ලද එකතුකරන ලද හෝ ඉවත් කරන ලද නිර්වචනයන් පමණකි ඉවත්කරන ලද පාඨයන් කපා හැර ඇත. නව පාඨයන් ඉරි ඇඳ ඇත.

## ආ උපග්‍රන්ථය පාරිභාෂික ශබ්ද මාලාව

**ගිණුම්කරණ ලාභය** — කාලපරිච්ඡේදයක් සඳහා වන බදු වියදම අඩු කිරීමට පෙර ලාභය හෝ අලාභය

**සක්‍රීය වෙළඳපොල** — ප්‍රමාණවත් සංඛ්‍යාතයකින් සහ පරිමාවකින් යුත් දිගටම පවත්නා පදනම මත වත්කමක් හෝ වගකීමක් සඳහා මිල කිරීමේ තොරතුරු ලබාදීමට ගනුදෙනුවන වෙළඳපොළකි.

**මුදලින් නිරවුල් කරන කොටස් - පදනම් ගෙවීම් ගණුදෙනුව** — අස්තිත්වයේ හෝ සමූහයේ වෙනත් අස්තිත්වයක ~~කොටස් හෝ වෙනත්~~ (කොටස් හෝ කොටස් විකලපයන්ද ඇතුළුව) ස්කන්ධ සාධන පත්‍රවල මිල (හෝ වටිනාකම) පදනම් කරගත් වටිනාකමකට අස්තිත්වය විසින් එම භාණ්ඩ හෝ සේවා සැපයුම්කරුවන්ට මුදල් හෝ වෙනත් වත්කම් පැවරීමේ වගකීමක් දරමින් අස්තිත්වය භාණ්ඩ හෝ සේවා මිලදී ගනු ලබන කොටස් පදනම් ගෙවීම් ගණුදෙනුවක්

**පුද්ගලයකුගේ පවුලෙහි ආසන්න සාමාජිකයින්** — අස්තිත්වයක් සමග කරන ගණුදෙනු සම්බන්ධයෙන් බලපෑම් කිරීමට හෝ කරනු ලැබීමට අපේක්ෂිත,

(අ) එම පුද්ගලයාගේ දරුවන් කාලාත්‍රයා හෝ ගෘහස්ත සහකරු

(ආ) එම පුද්ගලයාගේ කාලාත්‍රයාගේ හෝ ගෘහස්ත සහකරුගේ දරුවන්

(ඇ) එම පුද්ගලයාගේ හෝ එම පුද්ගලයාගේ කාලාත්‍රයා හෝ ගෘහස්ත සහකරුගේ යැපෙන්නන්

ද ඇතුළුව පවුලේ සාමාජිකයින්

**අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්** — වත්කම් හෝ වගකීම් ධාරණ අගය අයකර ගැනීමට හෝ නිරවුල් කෙරෙන අනාගත කාලපරිච්ඡේදයන්හි බදු ලාභය (බදු අලාභය) තීරණය කිරීමේදී අඩුකළ හැකි මුදල් ප්‍රමාණයෙන් උද්ගතවන තාවකාලික වෙනස්කම්

**විලම්භිත බදු වත්කම්** — පහත දෑ සම්බන්ධයෙන් අනාගත ~~වාර්තා කරන~~ කාලපරිච්ඡේදවලදී අයකර ගත යුතු ආදායම් බදු ප්‍රමාණයන් වේ.

(අ) අඩුකළ හැකි තාවකාලික වෙනස්කම්

(ආ) ඉදිරියට ගෙනයන භාවිතා නොකළ බදු අලාභයන් සහ

(ඇ) ඉදිරියට ගෙනයනු ලබන භාවිතා නොකළ බදු බැර

**විලම්භිත බදු බැරකම්** — බද්දට යටත් වන තාවකාලික වෙනස්කම් සඳහා අනාගත ~~වාර්තාකරන~~ කාලපරිච්ඡේද වලදී ගෙවිය යුතු ආදායම් බදු ප්‍රමාණයන් වේ.

**ස්කන්ධ පියවුම් කොටස් පදනම් ගෙවීම් ගණුදෙනුව** — අස්තිත්වයේ,

(අ) ස්කන්ධ සාධනපත්‍ර සඳහා ප්‍රතිශ්‍යාව වශයෙන් (කොටස් හෝ කොටස් විකල්ප ඇතුළුව) භාණ්ඩ හෝ සේවාවන් ලබාගැනීම හෝ

(ආ) සැපයුම්කරුට ගණුදෙනුව නිරවුල් කිරීමට වගකීමක් නොමැතිව වන නමුත් භාණ්ඩ හෝ සේවා ලබා ගැනීම වන ස්කන්ධ පදනම් ගෙවීම් ගණුදෙනුවක්

**විදේශීය මෙහෙයුම** — වාර්තාකරනු ලබන අස්තිත්වයක වෙනත් රටක පදනම් වූ හෝ වෙනත් රටක පවත්නා වූ හෝ වෙනත් රටක පවතින ක්‍රියාත්විතයන් හෝ වෙනත් ව්‍යවහාර මුදල් වර්ගයක් ඇති පරිපාලිතයන්, ආශ්‍රීතයන්, බද්ධ ව්‍යාපාරයන් හෝ ශාඛාවන්

**ව්‍යවහාර මුදල් සාමාන්‍යකරණ දිනය** — අස්තිත්වයක ව්‍යවහාර මුදල් තවදුරටත් උග්‍ර අති උද්ධමනයේ ද්විත්ව ලක්ෂණ එකක් හෝ දෙකක්ම නොමැති දිනය හෝ අස්තිත්වයේ ව්‍යවහාර මුදල් උග්‍ර අති උද්ධමනයට යටත් නොවන ව්‍යවහාර මුදලකට මාරු කළ දිනය

**වෙළඳපොල පැවරුම් කොන්දේසිය**

නිශ්චිත කොටස් මිලකට හෝ කොටස් මනාපයක නිශ්චිත නෛසර්ගික වටිනාකමකට හෝ අනෙකුත් අස්තිත්වයන්ගේ ස්කන්ධ සාධනයන්හි වෙළඳපොල දර්ශකයකට සාපේක්ෂව අස්තිත්වයයේ ස්කන්ධ වෙළඳමිල මත පදනම් වූ නිශ්චිත ඉලක්කයකට ළඟාවීම වැනි අස්තිත්වයේ ස්කන්ධ සාධනයන්ගේ භාවිත මිල, පැවරුම හෝ භාවිතත්වය තීරණය වන කොන්දේසිය

**අවම කල්බදු ගෙවීම්**

(අ) බදු ගැණුම්කරුවෙකු සඳහා බදු ගැණුම්කරුවෙකු විසින් හෝ බදු ගැණුම්කරුවෙකුට සම්බන්ධ පාර්ශවයක් විසින් ඇප වෙන ලද මුදල් ප්‍රමාණයක් හෝ

(ආ) බදු දීමනාකරු සඳහා බදු දීමනාකරුට

(i) බදු ගැණුම්කරු විසින්
(ii) බදු ගැණුම්කරුට සම්බන්ධ පාර්ශවයක් විසින් හෝ
(iii) ඇපය යටතේ වන බැඳීම් නිදහස් කිරිමට මූල්‍ය හැකියාව ඇති බදු දීමනාකරුට සම්බන්ධ නොවන තුන්වන පාර්ශ්වයක් විසින් ඇපවෙන දේවල් ද සහිතව අසම්භාව්‍ය කුලී බදු දීමනාකරු විසින් ගෙවිය යුතු හෝ බදු දීමනාකරුට ප්‍රතිපූර්ණය කළයුතු සේවා සඳහා පිරිවැය සහ බදු නොමැතිව බදු කාලපරිච්ඡේදය තුළ ගෙවනු ලබන හෝ ගෙවනු ලැබිමට අවශ්‍යවන ගෙවීම්

කෙසේවෙතත් මනාපය භාවිතා කිරිමට නියමිත දිනයේ සාධාරණ අගයට වඩා අඩුමිලකට වත්කම මිලදී ගැනීමට බදු ගැණුම්කරුට මනාපයක් තිබේනම් ද ආරම්භක දිනයේදී එම මනාපය භාවිතා කිරීමට හැකිවේයැයි සාධාරණ ලෙස නිශ්චිත වන විටද අවම කල්බදු ගෙවීම මෙම මිලදී ගැනීම් මනාපය භාවිතා කිරිමට අපේක්ෂිත දිනය දක්වා ගෙවීමට නියමිත අවම කල්බද්ද සහ එය භාවිතා කිරිමට ගෙවිය යුතු මුළු මුදල වේ.

**පොදු වගකීව යුතු භාවය**

~~ඔවුන්ගේ විශේෂ තොරතුරු අවශ්‍යතාවයන්ට සරිලන පරිදි වාර්තා පිළියෙල කරන ලෙස ඉල්ලීමට නොහැකි ආර්ථික තීරණ ගන්නා අස්තිත්වයේ දැනට සිටින සහ විභව්‍ය සම්පත් දායකයන් සහ අස්තිත්වයට පරිභාහිර වෙනත් අයට වගකීව යුතු භාවය~~ අස්තිත්වයකට පොදු වගකිව යුතු භාවයක් ඇත්වන්නේ:

(අ) එහි ණය හෝ ස්කන්ධ සාධනපත්‍ර පොදු වෙළඳපොලක හුවමාරු කෙරේනම් හෝ (දේශීය හෝ විදේශීය කොටස් විනිමය වෙළඳපොල හෝ දේශීය සහ ප්‍රාදේශීය වෙළඳපොළවල්ද ඇතුලත්ව අත්පිට වෙළඳපොලක හෝ) පොදු වෙළඳපොලක හුවමාරු කිරිම සඳහා එවැනි සාධන පත්‍රයක් නිකුත් කිරිමේ ක්‍රියාවලියක යෙදී සිටින්නේ නම් හෝ

(ආ) එහි ප්‍රාථමික ව්‍යාපාරයක් වශයෙන් බාහිර පුළුල් කණ්ඩායමක පුද්ගලයන් සඳහා විශ්වාසනීය තත්වයෙන් වත්කම් දරා සිටින්නේනම්ය. ~~මෙම තත්වය විශේෂයෙන් බැංකු ණය සමිති, රක්ෂණ සමාගම් සුරැකුම්පත් තැරැව්කරුවන් සහ වෙළෙන්දන් අන්‍යොන්‍ය අරමුදල් සහ ආයෝජන බැංකුවලට දර්ශීය වන අවස්ථාවන් වන විටය.~~

**සම්බන්ධිත පාර්ශවය**

සම්බන්ධ පාර්ශවයක් යනු මූල්‍ය ප්‍රකාශයන් පිළියෙල කරන අස්තිත්වයකට (වාර්ථාකරන අස්තිත්වයට) සම්බන්ධ පුද්ගලයකු හෝ අස්තිත්වයකි.

(අ) පුද්ගලයකු හෝ එම පුද්ගලයාගේ පවුලේ සමීප සාමාජිකයකු සම්බන්ධිත පාර්ශවයක් වන්නේ එම පුද්ගලයා ;

(i) වාර්තාකරන අස්තිත්වයේ හෝ වාර්තාකරන අස්තිත්වයේ මව් සමාගමක ඉහළ කළමනාකාරිත්වයේ සාමාජිකයකු නම්

(ii) වාර්තාකරන අස්තිත්වයෙහි පාලනය හෝ බද්ධ පාලනය තිබේනම් හෝ

(iii) වාර්තාකරන අස්තිත්වය පිළිබඳ සැහෙන බලපෑමක් තිබේ නම් ~~බද්ධ පාලනයක් හෝ සැලකිය යුතු ඡන්ද බලයක් තිබීම~~

(ආ) පහත සඳහන් කොන්දේසින් එකක් හෝ අදාළ වේ නම් අස්තිත්වයක් වාර්තාකරන අස්තිත්වයකට සම්බන්ධ වේ.

(i) අස්තිත්වය හා වාර්තාකරන අස්තිත්වය එකම සමූහයක සාමාජිකයන් වීම (එනම් සෑම මව් සමාගමක් පරිපාලිතයන් සහ සහාය පරිපාලිතයන් එකිනෙකට සම්බන්ධ වීම)

(ii) ~~එක්කෙ~~ එක් අස්තිත්වයක් වෙනත් අස්තිත්වයක ආශ්‍රිතයක් හෝ බද්ධ ව්‍යාපාරයක් වීම (හෝ අනෙක් අස්තිත්වය සාමාජිකයකු වන සමූහයක ආශ්‍රිතයන් හෝ බද්ධ ව්‍යාපාරයක් වීම)

(iii) අස්තිත්ව දෙකම එකම තෘතිය අස්තිත්වයක බද්ධ ව්‍යාපාරයක් වීම

(iv) ~~එක්කෝ~~ එක් අස්තිත්වයක් තෘතිය අස්තිත්වයක බද්ධ ව්‍යාපාරයක් සහ අනෙක් අස්තිත්වය තෘතිය අස්තිත්වයේ ආශ්‍රිතයක් වීම.

(v) අස්තිත්වය එක්කෝ වාර්තාකරන අස්තිත්වයට හෝ වාර්තාකරන අස්තිත්වයට සම්බන්ධ වු එකක් නම් එය ඒවායේ සේවකයන්ගේ සුභසාධනය සඳහා වු ප්‍රශ්චාත් සේවා ප්‍රතිලාභ සැලැස්මක් වීම වාර්තාකන අස්තිත්වයන් එවැනි සැලැස්මක් නම් සහ ව්‍යුහගත සේවකයන්ද ~~සැලැස්මට~~ වාර්තාකරන අස්තිත්වයට සම්බන්ධිත වේ.

(vi) (අ) න් හඳුන්වා ඇති පුද්ගලයකු විසින් අස්තිත්වය කේවලව හෝ බද්ධව පාලනය කෙරේ.

(vii) ~~ඉහත (අ) (ස) හි හඳුනාගත් පුද්ගලයකුට අස්තිත්වයේ සැලකිය යුතු ඡන්ද බලයක් තිබීම.~~ (අ) (ii) න් හඳුන්වා ඇති පුද්ගලයකුට අස්තිත්වය කෙරෙහි සැහෙන බලපෑමක් තිබීම හෝ අස්තිත්වයේ (හෝ අස්තිත්වයේ මව් සමාගමේ) ඉහළ කළමනාකාරීත්වයේ සාමාජිකයකු වීම.

(viii) වාර්තාකරන අස්තිත්වයට හෝ වාර්තා කරන අස්තිත්වයකට මව් සමාගමට අස්තිත්වය විසින් හෝ එහි කොටසක් වන සමූහයේ සාමාජිකයකු විසින් ඉහළ කළමනාකරණ පුද්ගල සේවා සපයයි.

~~(ix) පුද්ගලයකු හෝ එම පුද්ගලයාගේ පවුලේ කිට්ටුම සාමාජිකයකු වීම සහ ඔවුන් දෙදෙනාටම අස්තිත්වයේ සැලකිය යුතු බලපෑමක් හෝ සැලකිය යුතු ඡන්ද බලයක් තිබීම සහ වාර්තාකරන අස්තිත්වය මත බද්ධ පාලනයක් තිබීම.~~

~~(x) අස්තිත්වයේ හෝ අස්තිත්වයේ පරිපාලනයක හෝ එකී සාමාජිකයාගේ පවුලේ කිට්ටු සාමාජිකයකු වීමත්, ප්‍රධාන කළමනාකරන පිරිසේ සාමාජිකයකු වීම, වාර්තාකරන අස්තිත්වය මත පාලනය හෝ බද්ධ පාලනය තිබීම හෝ එහි සැලකිය යුතු ඡන්ද බලයක් තිබීම.~~

**වෙන්ව ඉදිරිපත් කරන මූල්‍ය ප්‍රකාශනයන්**

~~මව් ව්‍යාපාරයක් වන ආශ්‍රිතයක ආයෝජකයකු විසින් හෝ බද්ධපාලිත අස්තිත්වයක ව්‍යාපාරිකයකු විසින් වාර්තා වී ඇති ප්‍රතිඵල සහ ආයෝජිතයන්ගේ ශුද්ධ වත්කම් පදනම් කරගෙන නොව සෘජු ස්කන්ධ හිමිකම් පදනම මත ආයෝජනයන් පිළිබඳ ගිණුම් ගත කර ඇති~~

9.25 - 9.26 ඡේදයන් අනුව හානිකරණය අඩුකරන ලද පිරිවැය සාධාරණ අගයේ වෙනස්වීම් ලාභයෙහි හෝ අලාභයෙහි පිළිගනිමින් සාධාරණ අගය මත 14.8 ඡේදයේ ක්‍රමවේදය අනුගමනය කරමින් ස්කන්ධ ක්‍රමය මත පාරිපාලිතයන් බද්ධ ව්‍යාපාරයන් හෝ ආශ්‍රිතයන් තම ආයෝජකයන් පිළිබඳ ගිණුම්කරණය තෝරාගත හැකි අස්තිත්වයක් විසින් ඉදිරිපත් කරනු ලබන ගිණුම් ප්‍රකාශනයන්

**උග්‍ර අති උද්ධමනය**

පහත සඳහන් ලක්ෂණයන් ද්වයම තිබේනම්

(අ) ව්‍යවහාර මුදලෙන් ගණුදෙනු හා ශේෂයන් ඇති සියළුම අස්තිත්වයන් සඳහා විශ්වාසදායී පොදු මිල දර්ශකයන් නොමැති සහ

(ආ) ව්‍යවහාර මුදල හා සාපේක්ෂව ස්ථාවර විදේශ ව්‍යවහාර මුදලක් අතර හුවමාරු කිරීමේ හැකියාවක් නොමැති

අති උද්ධමනකාරී ආර්ථිකයක ව්‍යවහාර මුදල් උග්‍ර අති උද්ධමනයකට යටත් ව්‍යවහාර මුදල් වේ.

**කොටස් පදනම් ගෙවීම් වැඩ පිළිවෙල**

අස්තිත්වය (හෝ සමූහයේ වෙනත් අස්තිත්වයක් හෝ සමූහයේ ඕනෑම අස්තිත්වයක කොටස්කරුවකු) හා වෙනත් පාර්ශවයක් (සේවා නියුක්තියකු ද ඇතුළුව) අතර ඇතිවන

(අ) අස්තිත්වයේ හෝ සමූහයේ වෙනත් අස්තිත්වයක ස්කන්ධ සාධන පත්‍රයන් (කොටස් හෝ කොටස් මනාපයන්ද ඇතුළුව) මත පදනම් වන මුදල් ප්‍රමාණයක් සඳහා මුදලින් හෝ අස්තිත්වයේ වෙනත් වත්කම්වලින් හෝ

(ආ) අස්තිත්වයේ හෝ සමූහයේ වෙනත් අස්තිත්වයක (කොටස් හෝ කොටස් මනාපයන්ද ඇතුළුව) ස්කන්ධ සාධන පත්‍රයන් සඳහා තිබිය හැකි නිශ්චිත පැවරුම් කොන්දේසි තිබේ නම් ලබාගත හැකි වන ගිවිසුමයි.

කොටස් පදනම් ගෙවීමේ ගණුදෙනුව

අස්තිත්වයක් විසින්

(අ) කොටස් පදනම් ගෙවීමේ ගණුදෙනුවකින් (සේවා නියුක්තියකුද ඇතුළුව) සැපයුම්කරුවෙකුගෙන් භාණ්ඩ හෝ සේවා ලැබීම හෝ

(ආ) සමූහයේ වෙනත් අස්තිත්වයක් විසින් භාණ්ඩ හෝ සේවා ලැබීමකදී ගණුදෙනුව නිරවුල් කිරීමට බැඳීමක් ඇතිකර ගන්නා වූ ගණුදෙනුවේ. ~~ස්කන්ධ සාධන පත්‍ර (කොටස් හෝ කොටස් විකල්ප ඇතුළුව) සඳහා ප්‍රතිශ්‍යාව වශයෙන් අස්තිත්වයට භාණ්ඩ හෝ සේවාවන් ලබාදීමේ ගණුදෙනුවක් හෝ අස්තිත්වයේ කොටස් හෝ වෙනත් ස්කන්ධ සාධනපත්‍ර වල මිල පදනම් කරගෙන භාණ්ඩ හෝ සේවා ලබාදුන් සැපයුම්කරුවෙකුට ගෙවිය යුතු බැරකමක් ලෙස දරමින් භාණ්ඩ හෝ සේවා~~

**බදු මූලය පදනම**

වත්කමක හෝ වගකීමක බදු මූලය යනු බදු අරමුණු සඳහා එම වත්කමට හෝ වගකීමට ආරෝපිත වටිනාකමයි ~~සන්නාමීම පනවන ලද අදාල බදු නීතිය යටතේ වත්කමක හෝ වගකීමක හෝ ස්කන්ධ සාධන පත්‍රයක මැනීම.~~

**බද්දට යටත් තාවකාලික වෙනස්වීම්**

වත්කමේ හෝ වගකීමේ ධාරණ අගය අයකරගැනීම හෝ නිරවුල් කිරීම සිදුවන අනාගත කාලයන්හි බදු ලාභය හෝ (බදු අලාභය) තීරණය කිරීමේදී උද්ගත වන තාවකාලික වෙනස්කම්

**තාවකාලික වෙනස්කම්**

මූල්‍ය තත්ව ප්‍රකාශනයන්ගේ වත්කමක හෝ වගකීමක ධාරණ අගය හා එහි බදු මූල්‍ය අතර ඇති වෙනස ~~වෙනත් අයිතමයක ධාරණ අගය සහ එහි බදු පදනම අතර ඇති වෙනස්කම් වන අතර අස්තිත්වය මෙය වත්කමේ හෝ වගකීමේ ධාරණ අගය ආපසු අයකර ගැනීමේදී නිරවුල් කිරීමේදී බදු අයකළ හැකි ලාභයට බලපානු ඇතැයි අපේක්ෂා කිරීම (හෝ වත්කම් හෝ වගකීම් වලට අමතර වන අයිතම් වලට අනාගතයේ දී බදු අයකළ හැකි ලාභයට බලපෑමක් ඇතිවීම)~~

**මූල්‍ය සාධන පත්‍ර ගණුදෙනු පිරිවැය**

මූල්‍ය සාධන පත්‍රයන් අත්පත් කර ගැනීම, නිකුත්කිරීම හෝ ඉවත්කිරීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ~~සෘජුවම ආරෝපනය කළ හැකි~~ වර්ධක පිරිවැය. වර්ධක පිරිවැයක් යනු අස්තිත්වය විසින් මූල්‍ය සාධන පත්‍රයන් අත්පත් කර ගැනීම නිකුත්කිරීම හෝ ඉවත්කිරීමක් නොකරන ලද්දේ නම් නොදරා තිබිය හැකි පිරිවැයයි.

| | |
|---|---|
| **පවරා ගැනීමේ කොන්දේසි** | කොටස් පදනම් ගෙවීමේ වැඩ පිළිවෙලක් යටතේ ප්‍රතිපාර්ශවයට අස්තිත්වයේ මුදල් අනෙකුත් වත්කම් හෝ ස්කන්ධ සාධනයන් ලැබීමේ හිමිකම් ලැබිය යුතුදැයි තීරණය කෙරෙන කොන්දේසින් වේ. පවරා ගැනීමේ කොන්දේසින් එක්කෝ සේවා කොන්දේසින් හෝ කාර්යඵල කොන්දේසින් වේ. ප්‍රතිපාර්ශවය විසින් නිශ්චිත කාලයකට සේවාවන් කිරිම සේවා කොන්දේසියකින් අවශ්‍ය වේ. කාර්යඵල කොන්දේසින්ගෙන් ප්‍රතිපාර්ශවය විසින් නිශ්චිත කාලයක් සේවාවන් සම්පූර්ණ කිරිම සහ නිශ්චිත කාර්යඵල ඉලක්කයන් සම්පූර්ණ කිරිම (නිශ්චිත කාලයක් තුල අස්තිත්වයේ ලාභය වර්ධනය වීම වැනි) අවශ්‍ය වේ. කාර්යඵල කොන්දේසියකට වෙළඳපොළ පැවරුම් කොන්දේසියක් ඇතුලත් විය හැකිය. |
| **පැවරුම් කාලය** | කොටස් පදනම් ගෙවීම් වැඩ පිළිවෙලක සියළුම නිශ්චිත පැවරුම් කොන්දේසින් සපුරාලිය යුතු කාලය. |